274 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 274 - இல. 11
Volume 274 - No. 11

2019 නොවැම්බර් 07වන බ්‍රහස්පතින්දා
2019 நவெம்பர் 07, வியாழக்கிழமை
Thursday, 07th November, 2019

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන

කථානායකතුමාගේ සහතිකය

ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව: අතිරේක සාමාජිකයන්

2020 වර්ෂය සඳහා ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික කාර්ය වැඩසටහන් කෙටුම්පත

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව**

**සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව**

**විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව**

**ඌව පළාත් සංචාරක සංවර්ධන කාර්යාංශය ප්‍රඥප්ති කෙටුම්පත**

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව**

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදී.

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**

දුම්කොළ බදු (සංශෝධන) [ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]- පළමුවන වර කියවන ලදී.

පළාත් සභා මැතිවරණ (සංශෝධන) [ ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා] - පළමුවන වර කියවන ලදී.

**ක්‍රීඩා පනත:**

නියෝග

**ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:**

සලකා බලා තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී.

**ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත :**

දෙවන වර කියවා ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කරන ලදී.

**කල් තැබීමේ යෝජනාව:**

ජාතීන් සහ ආගම් අතර සමගිය සඳහා නීති සම්පාදනය

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**

சபாநாயகரது சான்றுரை

சட்டவாக்க நிலையியற் குழு: மேலதிக உறுப்பினர்கள்

2020ஆம் ஆண்டுக்கான தேசிய கணக்காய்வு அலுவலகத்தின் வரைவு வருடாந்த வேலை நிகழ்ச்சித்திட்டம்

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**நிதி ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை**

**எல்லை நிர்ணய ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை**

**கணக்காய்வுச் சேவை ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை**

**அரசாங்க சேவை ஆணைக்குழுவின் முன்னேற்ற அறிக்கை**

**ஊவா மாகாண சபையின் சுற்றுலா அபிவிருத்திப் பணியகத்தின் வரைவு நியதிச் சட்டம்**

**அரசாங்கப் பொறுப்பு முயற்சிகள் பற்றிய குழுவின் அறிக்கை**

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**அற்றோணித் தத்துவம் (திருத்தம்) சட்டமூலம்:**

முதன்முறை மதிப்பிடப்பட்டது

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**

புகையிலை வரி (திருத்தம்) - [மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ] - முதன் முறை மதிப்பிடப்பட்டது

மாகாணசபை தேர்தல்கள் (திருத்தம்)- [மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்] - முதன் முறை மதிப்பிடப்பட்டது

**விளையாட்டுக்கள் சட்டம்:**

ஒழுங்குவிதிகள்

**இலங்கை நிர்மாணக் கைத்தொழில் சம்மேளனம் (கூட்டிணைத்தல்) சட்டமூலம்:**

பரிசீலிக்கப்பட்டுத் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

**இலங்கை ஐக்கிய கிறிஸ்தவ நட்புரிமை (கூட்டிணைத்தல்) சட்டமூலம்:**

இரண்டாம் முறை மதிப்பிடப்பட்டு சட்டவாக்க நிலைக்குழுவுக்குச் சாட்டப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**

சமூகம் மற்றும் மதங்களுக்கிடையில் ஒற்றுமைக்கான சட்டவாக்கம்

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Speaker's Certificate

Legislative Standing Committee: Additional Member

Draft Annual Work Programme of the National Audit Office for the Year 2020

AUDITOR-GENERAL'S REPORT

PERFORMANCE REPORT OF THE FINANCE COMMISSION

PERFORMANCE REPORT OF THE DELIMITATION COMMISSION

PERFORMANCE REPORT OF THE AUDIT SERVICE COMMISSION

PROGRESS REPORT OF THE PUBLIC SERVICE COMMISSION

DRAFT STATUTE OF TOURISM DEVELOPMENT BUREAU OF UVA PROVINCIAL COUNCIL

REPORT OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES

SECTORAL OVERSIGHTCOMMITTEE REPORTS

POWERS OF ATTORNEY (AMENDMENT) BILL:
Read the First time

PRIVATE MEMBERS' BILLS:

Tobacco Tax (Amendment) –
[The Hon. (Dr.) WijeyadasaRajapakshe] – Read the First time

Provincial Councils Elections (Amendment) - [The Hon.M.A. Sumanthiran] - Read the First time

SPORTS LAW:
Regulations

CHAMBER OF CONSTRUCTION INDUSTRY OF SRI LANKA (INCORPORATION) BILL:
Considered, read the Third time, and passed as amended

UNITED CHRISTIAN FELLOWSHIP OF SRI LANKA (INCORPORATION) BILL:
Read a Second time, and allocated to Legislative Standing Committee

ADJOURNMENT MOTION:
Legislation for Communal and Religious Harmony

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2019 නොවැම්බර් 07වන බ්‍රහස්පතින්දා***

*2019 நவெம்பர் 07, வியாழக்கிழமை*

*Thursday, 07th November, 2019*

---

**පූ. භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப.10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2019 ඔක්තෝබර් 31 දින මවිසින් පහත සඳහන් පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

සුරාබදු (සංශෝධන)

එකතු කළ අගය මත බදු (සංශෝධන)

ජාතිය ගොඩනැඟීමේ බදු (සංශෝධන)

මුදල්

## II

### ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව: අතිරේක සාමාජිකයන්
### சட்டவாக்க நிலையியற் குழு: மேலதிக உறுப்பினர்கள்
### LEGISLATIVE STANDING COMMITTEE: ADDITIONAL MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

"ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113(2) ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට මතු පළ වන මන්ත්‍රීවරුන් අතිරේක සාමාජිකයන් වශයෙන් මවිසින් නම් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

ගරු ටී.බී. ඒකනායක මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු තිලංග සුමතිපාල මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු හේෂා විතානගේ මහතා

## III

### 2020 වර්ෂය සඳහා ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික කාර්ය වැඩසටහන් කෙටුම්පත
### 2020 ஆம் ஆண்டுக்கான தேசிய கணக்காய்வு அலுவலகத்தின் வரைவு வருடாந்த வேலை நிகழ்ச்சித்திட்டம்
### DRAFT ANNUAL WORK PROGRAMME OF THE NATIONAL AUDIT OFFICE FOR THE YEAR 2020

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 35(1) වගන්තිය ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින් මා වෙත ඉදිරිපත් කරන ලද 2020 වර්ෂය සඳහා ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික කාර්ය වැඩසටහන් කෙටුම්පත එකී පනතේ 35(2) වගන්තිය ප්‍රකාරව, සමාලෝචනයට ලක් කිරීම සඳහා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරනු ලබන බව දැනුම් දීමට කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2018 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development and Leader of the House)

ගරු කථානායකතුමනි, "එම වාර්තාව මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

**II**

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ හයවැනි කාණ්ඩයේ XXIII කොටස;
- 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XXVIII කොටස, සිව්වැනි කාණ්ඩයේ VII හා VIII කොටස් සහ හයවැනි කාණ්ඩයේ XIII, XIV, XV, XVI, XVII, XVIII හා XIX කොටස්;
- 2018 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ II, III, IV, V, VI, VII හා VIII කොටස්, දෙවැනි කාණ්ඩයේ III හා IV කොටස්, පස්වැනි කාණ්ඩයේ II කොටස, හයවැනි කාණ්ඩයේ I කොටස සහ අටවැනි කාණ්ඩයේ III කොටස; සහ
- 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ I කොටස සහ දසවැනි කාණ්ඩයේ XII කොටස

මම ඉදිරිපත් කරමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "එම වාර්තාව මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
## நிதி ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT OF THE FINANCE COMMISSION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2019 වර්ෂයේ දෙවැනි කාර්තුව (2019.04.01 - 2019.06.30) සඳහා මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

## සීමානිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
## எல்லை நிர்ணய ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT OF THE DELIMITATION COMMISSION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2019 වර්ෂයේ දෙවැනි කාර්තුව (2019.04.01 - 2019.06.30) සඳහා සීමානිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

## විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
## கணக்காய்வுச் சேவை ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT OF THE AUDIT SERVICE COMMISSION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) සහ 153ඌ ව්‍යවස්ථා ප්‍රකාරව 2019 වර්ෂයේ දෙවැනි කාර්තුව සඳහා (2019.04.01 - 2019.06.30) විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව
## அரசாங்க சேவை ஆணைக்குழுவின் முன்னேற்ற அறிக்கை
PROGRESS REPORT OF THE PUBLIC SERVICE COMMISSION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) සහ 55(5) ව්‍යවස්ථා ප්‍රකාරව 2019 වර්ෂයේ දෙවැනි කාර්තුව සඳහා (2019.04.01 - 2019.06.30) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව මම ඉදිරිපත් කරමි.

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156ඇ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් සකස් කරන ලදුව, 2019 ඔක්තෝබර් 12 දිනැති අංක 2144/68 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2019 ඉදිරිපත් කරමි.

එම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, පහත සඳහන් වාර්තා මම ඉදිරිපත් කරමි.

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව;

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ විගණන සේවා කොමිෂන් සභාවේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(iii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලයේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව.

එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, 2017 වර්ෂය සඳහා උද්භිද උද්‍යාන භාර අරමුදලේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය සහ පරිසරය සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සහ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් පහත සඳහන් නියම, නියෝග සහ යෝජනා මම ඉදිරිපත් කරමි.

(i) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජුලි 10 දිනැති අංක 2131/29 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 09 දිනැති අංක 2135/55 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 10 දිනැති අංක 2135/68 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 01 දිනැති අංක 2134/44 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 08 දිනැති අංක 2135/54 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

·(vi) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 10 දිනැති අංක 2135/67 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 සැප්තැම්බර් 07 දිනැති අංක 2139/74 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(viii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 සැප්තැම්බර් 10 දිනැති අංක 2140/20 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ix) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 සැප්තැම්බර් 30 දිනැති අංක 2143/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(x) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 02 දිනැති අංක 2143/21 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(xi) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමග කියවිය යුතු 29 වගන්තිය යටතේ බලයලත් වෙළඳුන් විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 17 දිනැති අංක 2145/49 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(xii) (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ යෝජනාව

(2019 සැප්තැම්බර් 10 දිනැති අංක 2140/19 දරන අති විශේෂ ගැසට් පත්‍රය); සහ

(xiii) (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ යෝජනාව

(2019 සැප්තැම්බර් 27 දිනැති අංක 2142/87 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

එම නියම, නියෝග සහ යෝජනා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2018.02.23 සිට 2018.10.12 දක්වා කාලයට අදාළව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.04.04 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ දෙවැනි වාර්තාවේ මුදල් අමාත්‍යාංශය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සහ නියම ඉදිරිපත් කරමි.

(i) 2018 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව;

(ii) 2018 වර්ෂය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ යාපනය විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙනුවට 2019.05.07 දින සිට බලපැවැත්වෙන පරිදි නිසි බලධරයා ලෙස සම්මානනීය මහාචාර්ය කන්දසාමි කදිරගාමනාදන් මහතා පත් කිරීම සම්බන්ධයෙන් නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මැයි 07 දිනැති අංක 2122/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙනුවට 2019.05.01 දින සිට බලපැවැත්වෙන පරිදි නිසි බලධරයා ලෙස මේජර් ජනරාල් (විශ්‍රාමික) හේරත් මුදියන්සේලාගේ උදය බණ්ඩාර හේරත් මහතා පත් කිරීම සම්බන්ධයෙන් නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන

ලදුව, 2019 මැයි 08 දිනැති අංක 2122/26 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(v) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ වෙනුවට 2019.05.15 දින සිට බලපැවැත්වෙන පරිදි නිසි බලධරයා ලෙස මේජර් ජනරාල් (විශ්‍රාමික) ශාන්ත කුමාර් තිරුනාවුකරසු මහතා පත් කිරීම සම්බන්ධයෙන් නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මැයි 14 දිනැති අංක 2123/33 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

එම වාර්තා සහ නියම අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන්, 2015 සහ 2016 වර්ෂ සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තා සහ ගිණුම් මම ඉදිරිපත් කරමි.

එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ, කොළඹ, රත්නපුර, පුත්තලම, නුවරඑළිය, කුරුණෑගල, මඩකලපුව, බදුල්ල, මාතර, මොනරාගල, කළුතර, මුලතිව්, කිලිනොච්චි, වවුනියා, යාපනය, ගාල්ල, මහනුවර, මාතලේ, අනුරාධපුර, පොළොන්නරුව සහ මන්නාරම යන දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා මම ඉදිරිපත් කරමි.

එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන්, 2017.07.01 සිට 2017.09.30 දක්වා කාලයට අදාළව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් 2019.01.24 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ පළමුවැනි වාර්තාවේ ශ්‍රී ලංකා ඖෂධ නීතිගත සංස්ථාව සහ ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදන සංස්ථාව සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂය සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2018 වර්ෂය සඳහා පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ සහ වාණිජ දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා ඉදිරිපත් කරමි.

එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන්, 2017 වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන්, පහත සඳහන් වාර්තා මම ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2017 වර්ෂය සඳහා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අර්ජුන රණතුංග මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Arjuna Ranatunga - Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 66 සහ 69 වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 117 වගන්තිය යටතේ සේවක පිරිස් සහ පුහුණු කිරීමේ ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූලි 03 දිනැති අංක 2078/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

එම නියෝග ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු හරින් ප්‍රනාන්දු මහතා (විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஹரின் பர்னாந்து - தொலைத்தொடர்புகள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Harin Fernando - Minister of Telecommunication, Foreign Employment and Sports)

ගරු කථානායකතුමනි, 2017.07.01 සිට 2017.09.30 දක්වා කාලයට අදාළව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් 2019.01.24 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ පළමුවැනි වාර්තාවේ ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙනුවෙන් 2017 වර්ෂය සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව සෞඛ්‍ය සහ මානව සුබසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා වෙනුවෙන්, 1985 අංක 48 දරන හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 22 දිනැති අංක 2146/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මුද්‍රණ දෝෂ සංශෝධනය කරන ලද 2019 ඔක්තෝබර් 03 දිනැති අංක 2143/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

එම නියෝග ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අජිත් පී. පෙරේරා මහතා (ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ කැබිනට් නොවන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் தகவல் தொழில்நுட்ப அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Non-Cabinet Minister of Digital Infrastructure and Information Technology)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් නියෝග ඉදිරිපත් කරමි.

(i) 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 8(2) වගන්තිය සමග කියවිය යුතු 24 වගන්තිය යටතේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත ඉ-ජනගහන රෙජිස්ටර සම්බන්ධයෙන් විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 මැයි 29 දිනැති අංක 1864/44 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ii) 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 8(2) වගන්තිය සමඟ කියවිය යුතු 24 වගන්තිය යටතේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත ඉ-ජනගහන රෙජිස්ටර සම්බන්ධයෙන් ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 14 දිනැති අංක 2114/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(iii) 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 8 (2) වගන්තිය සමග කියවිය යුතු 24 වගන්තිය යටතේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත ඉ-පුද්ගලයන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 21 දිනැති අංක 2115/42 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.

එම නියෝග ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ජනමාධ්‍ය කැබිනට් නොවන අමාත්‍ය සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2018 වර්ෂය සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පිළිගන්වන ලද වාර්තා
# நிலைக்கட்டளை இல. 52(6)இன் படி சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
# REPORTS PRESENTED UNDER STANDING ORDER NO. 52(6)

## සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත
## கம்பெனிகள் (திருத்தம்) சட்டமூலம்
## COMPANIES (AMENDMENT) BILL

"සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ වාර්තාව" - [කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

***පනත් කෙටුම්පත 2019 දෙසැම්බර් 03වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි නියෝග කරන ලදී.***
*சட்டமூலம் 2019 டிசம்பர் 03, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Bill ordered to be read a Second time upon Tuesday, 03rd December, 2019.*

## II

### මරණ දණ්ඩනය අහෝසි කිරීමේ පනත් කෙටුම්පත
### மரண தண்டனையை இல்லாதொழித்தல் சட்டமூலம்
### ABOLITION OF DEATH PENALTY BILL

"මරණ දණ්ඩනය අහෝසි කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳ වාර්තාව" - [අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

*පනත් කෙටුම්පත 2019 දෙසැම්බර් 03වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි නියෝග කරන ලදී.*

*சட்டமூலம் 2019 டிசம்பர் 03, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்படக் கட்டளையிடப்பட்டது.*

*Bill ordered to be read a Second time upon Tuesday, 03rd December, 2019.*

## පිළිගන්වන ලද වාර්තා
## சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
## REPORTS PRESENTED

### ඌව පළාත් සංචාරක සංවර්ධන කාර්යාංශය ප්‍රඥප්ති කෙටුම්පත
### ஊவா மாகாண சபையின் சுற்றுலா அபிவிருத்திப் பணியகத்தின் வரைவு நியதிச் சட்டம்
### DRAFT STATUTE OF TOURISM DEVELOPMENT BUREAU OF UVA PROVINCIAL COUNCIL

**ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. J.M. Ananda Kumarasiri - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 51. (3) (ආ) යටතේ, "ඌව පළාත් සංචාරක සංවර්ධන කාර්යාංශය" නමැති ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳව ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව සහ එහි කාර්ය සටහන් මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එම වාර්තාව ඌව පළාත් සභාවට ඉදිරිපත් කරන ලෙස පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට නියෝග කරමි.

## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்கப் பொறுப்பு முயற்சிகள் பற்றிய குழுவின் அறிக்கை
## REPORT OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සිව්වැනි වාර්තාව වශයෙන් 2017.03.17 සිට 2018.04.04 දක්වා එම කාරක සභාවේ විමර්ශනයට ලක් වූ මෙරට රාජ්‍ය විශ්වවිද්‍යාල හා එයට සමගාමීව ක්‍රියාත්මක වන උසස් අධ්‍යාපන ආයතන සම්බන්ධයෙන් වූ වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, එම වාර්තාවේ විශේෂත්වයක් ගැන මම අදහසක් පළ කරන්න ඕනෑ. මීට කලින් අපි වෙන වෙනම විශ්වවිද්‍යාල කැඳවලා විමර්ශන කරලා තමයි වාර්තා ඉදිරිපත් කළේ. ඒ සියලු විශ්වවිද්‍යාලවල වාර්තා එකක් හැටියට පොදු වාර්තාවක් තමයි අද දිනයේ විගණකාධිපතිතුමාගේ වාර්තා සහිතව ඉදිරිපත් කරන්නේ.

මෙහිදී මතු වෙන පොදු කාරණා ගණනාවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ප්‍රධාන කාරණය තමයි, විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව දිගින් දිගටම පහළ වැටී තිබීම. උදාහරණයක් කියනවා නම්, 2013, 2014දී ඉල්ලුම් කරපු ශිෂ්‍යයන්ගෙන් සියයට 45ක් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරගෙන තිබෙනවා. 2017, 2018දී ඉල්ලුම් කරපු ශිෂ්‍යයන්ගෙන් ඇතුළත් කරගෙන තිබෙන්නේ සියයට 38.7යි. ඊළඟට, විශ්වවිද්‍යාලවල තිබෙන අරමුදල් විශාල ප්‍රමාණයක් නිෂ්ප්‍රයෝජන ලෙස ජංගම ගිණුම්වල තිබෙනවා. ගරු කථානායකතුමනි, උදාහරණයක් ලෙස කිව්වොත් සමස්ත විශ්වවිද්‍යාල පද්ධතියේ විශ්වවිද්‍යාල 15ක අරමුදල් 794ක රුපියල් මිලියන 5,666ක් තිබෙනවා. ඒ වාගේම, ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරලා තිබෙනවා, රුපියල් මිලියන 14,000ක්. පොලිය ගන්න, රුපියල් කෝටි 1,400ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරලා තිබෙනවා. ඒක විශ්වවිද්‍යාලවල අරමුණත් එක්ක සම්පූර්ණ පටහැනියි. එම අරමුදල් තිබෙන්නේ ශිෂ්‍යයන්ගේ සහ ආචාර්යවරුන්ගේ ප්‍රයෝජනයට. ඒ අරමුදල්වල මුදල් නිස්කාරණ ලෙස ජංගම ගිණුම්වල තිබෙනවා.

කෝටි ගණනක මුදල්, විශ්වවිද්‍යාල පද්ධතියට යොදා ගන්නේ නැතිව තිබියදී තමයි ළමයින් ඇතුළත් කර ගැනීමත් අඩු කරලා තිබෙන්නේ කියන කාරණය මම ගරු කථානායකතුමාගේත්, ගරු පාර්ලිමේන්තුවේත් අවධානයට යොමු කරනවා. රාජ්‍ය විශ්වවිද්‍යාලවලට යන්න ළමයින් තුළ ලොකු ඉල්ලුමක් තිබෙනවා. නමුත් ළමයින් ඇතුළත් කර ගැනීමේ ක්‍රියාවලිය දුර්වලයි. මේ මුදල් නිෂ්ප්‍රයෝජන විධියට භාවිත වෙනවා. ගරු පාර්ලිමේන්තුවේ විවාදයක් කරලා මේ ගැන අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිමින් මෙම වාර්තාව මම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා වැදගත් කරුණක් ඉදිරිපත් කළා. විශේෂයෙන් මේ කාරණයට අපි මුදල් ඇමතිතුමාගේ හා මුදල් අමාත්‍යාංශයේ අවධානයට යොමු කරනවා.

ඒ වාගේම, පසුගිය කාලයේ සමහර විශ්වවිද්‍යාලවල ගිණුම් වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අවුරුද්දක් දෙකක් පරක්කු වූ අවස්ථා තිබුණු බවත් ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. මා හිතන හැටියට ඒ කාරණයට අවධානය යොමු කළා. මේ අවුරුද්ද අවසාන වනකොට සියලු රාජ්‍ය ආයතනවල පසුගිය අවුරුද්දේ ගිණුම් වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න වග බලා ගැනීම ඉතාම වැදගත් කියලා මම මේ අවස්ථාවේදී කියනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "එම වාර්තාව මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු සන්දිත් සමරසිංහ මහතා**
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

ගරු කථානායකතුමනි, තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමිය වෙනුවෙන් මම තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "(469 අධිකාරය) වනසත්ව හා වෘක්ෂලතා ආඥාපනත යටතේ නියමයන්" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa)

ගරු කථානායකතුමනි, තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන්, තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනත් කෙටුම්පත" සහ "1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ නියෝග" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. Sujith Sanjaya Perera)

ගරු කථානායකතුමනි, නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2016 හා 2017 වර්ෂ සඳහා ජාතික ශිල්ප සභාවේ වාර්ෂික වාර්තා;

(ii) 2014 සහ 2015 වර්ෂ සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තා හා ගිණුම් ප්‍රකාශන;

(iii) 2014/2015 වර්ෂය සඳහා කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව;

(iv) 2017 වර්ෂය සඳහා පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(v) 2013 වර්ෂය සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(vi) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයේ වාර්ෂික වාර්තාව;

(vii) 2013 වර්ෂය සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂිකව වාර්තාව; සහ

(viii) 2014, 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්හි වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කිරීමට නියමිත වාර්තාව සම්බන්ධයෙන් කිව යුතු කරුණක් තිබෙනවා. අද දින ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලන ලද "ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කිරීමට නොහැකි බව දන්වා තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, එම කමිටු රැස්වීමට මාත් සහභාගි වුණා. ජනාධිපති ලේකම් කාර්යාලයේ ලේකම්තුමා තමයි මෙම පනත් කෙටුම්පත සකස් කර තිබෙන්නේ. මෙම පනත ජාතික වශයෙන් ඉතා වැදගත් පනතක්. නවෝත්පාදන සම්බන්ධයෙන් පනතක් ගෙන ඒම ගැන අපේ කිසි විරුද්ධතාවක් නැහැ. අපි ඒකට ඉඩ දෙන්න ඕනෑ. ඒ පනත් කෙටුම්පතට අපි සංශෝධන කිහිපයක් ඉදිරිපත් කළා. පළමුව, ඒ පාලක සභාවට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ නියෝජිතයකු ඇතුළත් වෙලා තිබුණේ නැහැ. ඒ Committee එකේ අය පිළිගත්තා, එසේ ඇතුළත් විය යුතුයි කියලා. දෙවනුව, සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය පාලක සභාවට ඇතුළත් විය යුතුයි කියලා එහි දක්වා තිබෙනවා. නමුත් එයට අවශ්‍ය වෙන්නේ වාණිජ දෙපාර්තමේන්තුව.නමුත් අවාසනාවකට වාණිජ දෙපාර්තමේන්තුව ගැසට් කර තිබෙන්නේ රිසාඩ් බදියුදීන් මැතිතුමාගේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ. එතකොට, සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය කියලා සඳහන් කළොත් පනතට අවශ්‍ය කරන වාණිජ දෙපාර්තමේන්තුව ඇතුළත් වන්නේ නැහැ. වාණිජ දෙපාර්තමේන්තුව කියලා සඳහන් කළොත් සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය ඇතුළත් වන්නේ නැහැ. මේ වාගේ ගැටලු රාශියක් තිබෙන නිසා මම හිතනවා, ජාතික වශයෙන් වැදගත්කමක් තිබෙන මෙම පනත් කෙටුම්පත වෙනත් දිනයක සාකච්ඡාවට ගන්න එක තමයි ප්‍රායෝගික වශයෙන් වැදගත් වෙන්නේ කියලා. ඒ නිලධාරින් එම සංශෝධනවලට එකඟයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මට point of Order එකක් මතු කරන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ කරුණු ටික සාකච්ඡා කරලා, අපි එය පසුව ගනිමුද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා මතු කළ කාරණා පිළිබඳව අද උදේ පැවති ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අපි සාකච්ඡා කළා. අද එම පනත් කෙටුම්පත විවාදයට ගන්නවාද කියන එක තීරණය කර ගන්න වෙන්නේ අප ඉදිරිපත් කළ කරුණු ගරු අමාත්‍යතුමා පිළිගන්නා ආකාරය මතයි. මොකද, විශේෂයෙන්ම මේ පනත ක්‍රියාත්මක කරන්න ගියාම විශාල ගැටලුවක් මතුවෙනවා. ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ ප්‍රධානියා හැටියට පත් කරන පුද්ගලයා නවෝත්පාදනයට අදාළ පශ්චාත් උපාධියක් හිමි තැනැත්තකු වෙන්න ඕනෑ. රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නවෝත්පාදනයට සම්බන්ධ පශ්චාත් උපාධියක් තිබෙන්න ඕනෑය කියලා කියනවා. නමුත් ලංකාවේ නවෝත්පාදන පශ්චාත් උපාධි දෙන්නේ නැහැ. එහෙම නැති කෙනකු පත් වුණොත් මොකක්ද කරන්නේ කියන ප්‍රශ්නය මතු කළාම, ඒ අය ඒ සංශෝධනය පිළිගත්තා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, දැන් ඒ වාර්තාව ලැබුණා. අවශ්‍ය නම් මේ කටයුතු අවසානයේදී අපට මේ වාර්තාව ගැන කථා කරන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ වාර්තාව ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් තවම අනුමත කරලා නැහැ. අද උදේ 9.30ට ඒ කාරක සභාව රැස් වුණාම කිව්වාලු, සංශෝධන වගයක් තිබෙනවා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාත් ඒ ගැන කිව්වා නේ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඔව්, සංශෝධන තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවශ්‍ය නම් දැන් මේ ගැන කථා කරන්න පුළුවන්. එහෙම නැත්නම් වෙනත් දවසක සාකච්ඡා කරන්න පුළුවන්. ඒ ගැන ගරු සභානායකතුමාගේ අදහස දැන ගන්න මා කැමැතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි අද මේ ගැන විවාද කරලා, සම්මත කිරීම ඉදිරි දිනයකට නියම කරමු.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, සංශෝධන නැතිව විවාද කරන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමනි, කාරක සභාවේ වාර්තාව ලැබී තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමායි, අපියි ඉදිරිපත් කරපු සාධනීය සංශෝධන තිබෙනවා. ඒ සංශෝධනවලට රාජ්‍ය නිලධාරින් එකඟයි; නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් එකඟයි. නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් එකඟ වන ආකාරයට පනත් කෙටුම්පත සකස් කරලා එන්න ඕනෑ නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Then, we will put it off.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඒ නිසා අපි ඒ ගැන සාකච්ඡා කිරීම වෙනත් දවසකට නියම කරමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු කථානායකතුමනි, අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2014 හා 2015 වර්ෂ සඳහා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා;

(ii) 2016 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(iii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iv) 2016 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(v) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(vi) 2016 වර්ෂය සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(vii) 2017 වර්ෂය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(viii) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(ix) 2017 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(x) 2017 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xi) 2017 වර්ෂය සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xii) 2017 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xiii) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xiv) 2017 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xv) 2017 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම්;

(xvi) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xvii) 2017 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xviii) 2017 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xix) 2017 වර්ෂය සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xx) 2017 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxi) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xxii) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xxiii) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xxiv) 2017 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxv) 2017 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxvi) 2017 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xxvii) 2017 වර්ෂය සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xxviii) 2017 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xxix) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්; සහ

(xxx) 2017 වර්ෂය සඳහා නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මහාචාර්යතුමනි, මේ වෙනකොටත් 2016 සහ 2017 වර්ෂවල ගිණුම් තමයි වැඩියෙන් එන්නේ. අඩු ගණනේ 2018 වර්ෂයට අදාළ ගිණුම් මේ අවුරුද්ද අවසන් වෙන්න කලින් ඉදිරිපත් කරන්න ක්‍රියා කරන්න ඕනෑ.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු කථානායකතුමනි, මේ වන විට 2017 වර්ෂයට අදාළ ගිණුම් ගෙන්වාගන්න ලැබීම ඇත්තටම අපි ලැබූ ජයග්‍රහණයක්. මීට කලින් අවුරුදු 5ක් පැරණි ගිණුම් පවා ආවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්, ඒක අපි දන්නවා.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

2017 වර්ෂයට අදාළ ගිණුම් අපි ගෙනාවා. තව මාස තුන හතරක් ඇතුළත 2018 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කරන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ ගැන අවධානය යොමු කරලා, 2018 වර්ෂයට අදාළ ගිණුම් 2019 වර්ෂය අවසන් වෙන්න කලින් ඉදිරිපත් කරන්න.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

හොඳයි.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

ගරු කථානායකතුමනි, නාත්තණ්ඩිය, මාරවිල පාර, නවෝදය මාවත, අංක 182 දරන ස්ථානයේ පදිංචි ඒ.එම්.ඩී.එස්.සී. අලහකෝන් මහතා ඇතුළු එකළොස් දෙනෙකුගෙන් ලැබුණු පෙත්සමක් මම ඉදිරිපත් කරමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுவைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petition ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
2019 ඔක්තෝබර් 30වැනි දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ රැස්වීමේදී තීරණය කළ පරිදි අද දිනට නියමිත වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න වෙනත් දිනයකට යොමු කරනු ලැබේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම රීති ප්‍රශ්නයක් මතු කරනවා. ඔබතුමාත් දන්නවා, ස්වාධීන කොමිෂන් සභා පිළිබඳව මේ පාර්ලිමේන්තුවට වග කීමක් තිබෙන බව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නියෝජිතයන් 07දෙනෙක් පත් වෙනවා. ඒ කොමිෂන් සභාවට පත් කරන පුද්ගලයන් තමන්ගේ ස්වාධීනත්වය සහ චර්යාව හරියාකාරව පවත්වාගෙන යෑම අත්‍යවශ්‍ය වෙනවා. මොකද, මෙම ස්වාධීන කොමිෂන් සභාවල අඩු පාඩුකම් සියල්ලම පිළිබඳව තනි තනි පුද්ගලයන් විසින් ඉදිරිපත් කරන කරුණු අවශ්‍ය නැහැයි කියලා හිතන ඉතාම සුළු දුර්දාන්ත කණ්ඩායමක් ඉන්නවා. අන්න ඒ පදනමින්ම තමයි මම මේ ප්‍රශ්නය මතු කරන්නේ.

ගරු කථානායකතුමනි, 2018 අංක 34 දරන Office for Reparations Act එකේ 23වැනි වගන්තියේ මෙහෙම තිබෙනවා.

" (1) The members of the Office for Reparations (for the limited purpose of their functions under this Act) and the officers and servants shall be deemed to be public servants for the purposes of the Penal Code (Chapter 19 ) , the Bribery Act (Chapter 26) and the Evidence Ordinance (Chapter 14 ) ."

(2) The Office for Reparations shall be deemed to be a scheduled institution within the meaning of the Bribery Act (Chapter 26), and the provisions of that Act shall be construed accordingly."

ගරු කථානායකතුමනි, මේ පනතට අනුව ඉතා පැහැදිලියි මේ කොමිසමට පත් වන නිලධාරින්, කොමසාරිස්වරු රජයේ සේවකයන් ලෙස සැලකෙන බව. ගරු කථානායකතුමනි, දැන් සමාජ මාධ්‍යවල හුවමාරු වන ප්‍රවෘත්තියක් මා සතුව තිබෙනවා. ව්‍යවස්ථාදායක සභාවෙන් අනුමත කරලා Office for Reparations කියන ආයතනයට පත් කරපු කර්නල් රත්නප්‍රිය බන්දු කියන මහත්මයා, ගෝඨාභය රාජපක්ෂ මහතාට සහයෝගය දෙනවා කියලා ප්‍රවෘත්තියක් පළ වෙනවා. ගරු කථානායකතුමනි, එතුමාගේ නම යෝජනා වූ අවස්ථාවේදීත් එතුමා යම්කිසි දේශපාලන කරුණකට සම්බන්ධව සිටි නිසා ඒ පිළිබඳව මම ව්‍යවස්ථාදායක සභාවේ දී ප්‍රශ්න කළ බව ඔබතුමා දන්නවා. එතුමා ගැන ඊට කලින් යම් පිළිගත් අදහසක් තිබුණා. නමුත්, එතුමා මේ කොමිසමට පත්වීමට නාම යෝජනා එවා තිබෙන අතරේ යම්කිසි දේශපාලන කටයුතුවලට සම්බන්ධ වෙලා සිටියා. මා ඒ බව වාර්තා කළාට පස්සේ එතුමා කැඳවා විමසීමේ දී එතුමා යම් සහතිකයක් දුන්නා, දේශපාලන කටයුතුවලට සම්බන්ධ වෙන්නේ නැහැ කියලා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ පිළිබඳව වහාම පරීක්ෂණයක් කරන්න කියලා. එම ප්‍රවෘත්තිය වාර්තා කරන විධියට පෙනෙනවා, එතුමා නීති රීති සියල්ල උල්ලංඝනය කර තිබෙන බව. ඒ නිසා නීති මඟින් කටයුතු කරන්න. එතකොට කියයිද දන්නේ නැහැ, රණ විරුවෙකුට මොකක් හෝ කරනවා කියලා. නමුත්, මෙතැන තිබෙන්නේ එහෙම දෙයක් නොවෙයි.

ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තු සභා ගර්භයේ දී මිරිස් කුඩු ගහපු අයටත් කිසිම දඬුවමක් ලැබුණේ නැහැ. Mikes කඩපු අය එක රුපියලක්වත් ගෙවලා නැහැ, ගරු කථානායකතුමනි. අද පාසල් දරුවෝ "ස්වර්ණවාහිනියේ" විකාශනය වන "නාඩිය" කියන වැඩසටහනට ඇවිල්ලා ඒ ගැන අහනවා, "මොනවාද කරන්නේ?" කියලා.

ගරු කථානායකතුමනි, ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් විධියට අපට හැල්ලු වෙන්නත් බැහැ. ඒ නිසා මම ඒ ගැන ප්‍රශ්න කළා. ඔබතුමා එතුමා කැඳවලා අවවාද කළා. හැබැයි, එම අවවාද පිළිනොගෙන එතුමා වැඩ කරනවා. ගරු කථානායකතුමනි, එතුමා සහයෝගය දෙන අපේක්ෂකයා පිළිබඳව නොවෙයි මේ ප්‍රශ්නය. මේ කරන වැඩෙන් වෙන්නේ ස්වාධීන කොමිෂන් 'ඩෝසර්' කිරීම සඳහා අවශ්‍ය කරන තර්කය ශක්තිමත් කිරීම. ඒ නිසා ඔබතුමාගෙන් මේ සම්බන්ධව මා ඉතාම ඉක්මන් පියවරක් බලාපොරොත්තු වනවා. එතුමා දේශපාලන අපේක්ෂකයෙකුට සහයෝගය ලබා දෙනවා කියන ඒ ප්‍රවෘත්ති වාර්තාව අවශ්‍ය නම් මම ලේකම් කාර්යාලයට ලබා දෙන්නම්. මම හිතනවා, ඔබතුමාටත් එය සොයා ගන්න පුළුවන් කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

ඔබතුමා සඳහන් කළ කාරණය ගැන අද උදේ කීප දෙනෙක් අප දැනුවත් කළා. මටත් මේ අවස්ථාවේ දී ඒ කරුණ මතක් වෙනවා. එම ප්‍රශ්නය මතු කරපු වෙලාවේ අපි එතුමාට ඒ ගැන විශේෂයෙන් සඳහන් කළා. මම මේ ගැන ව්‍යවස්ථා සභාවේ අවධානය යොමු කරලා අවශ්‍ය පියවර ගන්නම්.

ගරු මන්ත්‍රීතුමනි, මිරිස් කුඩු ගැසීම සම්බන්ධයෙන් ඔබතුමා සඳහන් කළා. ඒ පිළිබඳ කරුණු පොලිසිය විසින් නීතිපති වෙත යවා තිබෙනවා. එතැනින් තමයි තීරණය ගන්නේ. මට ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න බැහැ. නීතිපති ඒ ගැන ක්‍රියාදාමයක් ගන්නවා කියලා අපට දන්වා තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, නීතිපතිතුමාට අදාළ වැඩ කරන එක වෙනම එකක්. නමුත් මේ පාර්ලිමේන්තුවේ ගරු නියෝජ්‍ය කථානායකතුමා නිර්දේශ කරපු වැරදිකරුවන් 54 දෙනෙක් ඉන්නවා. ඒකට අදාළව පාර්ලිමේන්තුවට ගත හැකි තීන්දු තිබෙනවා. පාර්ලිමේන්තුවේ මේ වෙනුවෙන් ගත හැකි නීති කොටසක් තිබෙනවා. ඒවා ක්‍රියාත්මක වෙලාත් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරලා-[බාධා කිරීමක්] ඒ සම්බන්ධයෙන් එතුමා පැහැදිලි කරයි. හොඳයි, මට ඔබතුමා කියන එක තේරෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මාත් එයට එකඟ වෙනවා. පාර්ලිමේන්තුව තුළ යම් සිද්ධියක් ඇති වුණා, ඒක අපි ඔක්කොම දැක්කා. ඒ පුද්ගලයන් 54 දෙනා සම්බන්ධයෙන් යම් කිසි පියවරක් ඉක්මනටම ගන්න ඕනෑ. එහෙම කළේ නැත්නම් ජනතා විශ්වාසය නැති වෙනවා. මේ පාර්ලිමේන්තුව ඇතුළේම යම් සිද්ධියක් ඇති වුණා. ඒක සියලුදෙනාම දැක්කා. දණ්ඩ නීති සංග්‍රහයේ නීති උල්ලංඝනය වුණා. ඇත්ත වශයෙන්ම ඒ සම්බන්ධයෙන් පියවරක් ගන්නේ නැති එක, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මම නැවතත් ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවේ අවධානය මේ පිළිබඳව යොමු කරන්නම්. දැන් කීප විටක්ම මම මේ ගැන කියලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීම ගැන බොහොම ස්තුතියි. ඒ වාගේම, පොලීසිය වෙනත් කරුණු පිළිබඳව කටයුතු කරයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, [බාධා කිරීමක්]

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් තමයි දිල්රුක්ෂි ඩයස් Commission to Investigate Allegations of Bribery or Corruptionහි Director General හැටියට පත් කළේ. එතුමියගේ ප්‍රකාශයක් සමාජ මාධ්‍ය ජාලවල යනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ ගැනත් අපි හොයලා බලනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මට කාරණා දෙකක් මතු කරන්න තියෙනවා. දැන් මේ කාරණාවට අදාළව ගත්තොත්,- [බාධා කිරීමක්] දැන් එතුමිය අස් වෙලා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

හිටපු Director General පත් කළේ තමුන්නාන්සේලා. එතුමිය රාජකාරි කළ කාලය තුළ - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නැහැ, ඒ සභාවෙන් නොවෙයි එතුමිය පත් කළේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් නොවෙයි එතුමිය පත් කළේ. ඒ පත් කිරීම කළේ ජනාධිපතිතුමා. ඒ නිසා ඒක මගේ ඇඟට දමන්න එපා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා කථා කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේදී මිරිස්කුඩු ගහපු ප්‍රශ්නය නීතිපතිතුමාට යොමු කළා කියලා ඔබතුමා කිව්වා. විජිත හේරත් මන්ත්‍රීතුමාට පහර දීපු එකටත් නීතිපතිතුමාගෙන් උපදේශයක් එන්න ඕනෑද ගරු කථානායකතුමනි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පොලීසියයි ඒ විස්තර යවා තිබෙන්නේ. එය පොලීසියේ ක්‍රියාදාමයක්. මම නොවෙයි ඒ කරුණු යැව්වේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මම මතු කරන කාරණය - [බාධා කිරීමක්]

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු කථානායකතුමනි, දැන් සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාත්, බිමල් රත්නායක මන්ත්‍රීතුමාත් මතු කරපු කාරණයම තමයි මාත් කියන්නේ. ඒ සිද්ධිය අපි අත්දැකලා අවුරුද්දක් වෙනවා. මේ රටේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කරලා, විනාශ කරලා, මේ රටේ ජනතාවගේ සම්පූර්ණ අප්‍රසාදයට පත් වූ, ලංකාවේ කළු පැල්ලමක් ඇති වූ සිද්ධිය තමයි පාර්ලිමේන්තුවේ ඒ ඇති වූ සිද්ධිය. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ සිටින සියලුදෙනාම එයට එකඟ විය යුතුයි. මින් ඉදිරියට මෙවැනි දේවල් මේ පාර්ලිමේන්තුවේ සිදු නොවිය යුතු නම්, වැරදි කරපු ඒ සියලුදෙනාටම අනිවාර්යයෙන් දඬුවම් ලබා දිය යුතු බවට අපි මේ අවස්ථාවේ දී පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කර ගන්න ඕනෑ. නීතිපතිතුමාගේ වාර්තාව වෙනම එකක්. පාර්ලිමේන්තුවේ ගරු නියෝජ්‍ය කථානායකතුමාගේ මූලිකත්වයෙන් යුතුව පැවැති කමිටුවේ වාර්තාවේ තිබෙන නිර්දේශ ක්‍රියාත්මක කරන්නේ නැත්තේ ඇයි ගරු කථානායකතුමනි? මේක විශාල ප්‍රශ්නයක්. ඒ නිසා ඔබතුමා ඒ ගැන තීරණයක් අපට ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එම කමිටුවේ සභාපතිතුමා හැටියට ගරු නියෝජ්‍ය කථානායකතුමා කටයුතු කළා. එතුමා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරලා පියවර ගනීවි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, ඒ දින 52ක කාලය තුළ අවස්ථා කිහිපයක දීම මේ පාර්ලිමේන්තුව ඇතුළේ වූ සිදුවීම්වල අපරාධ වග කීමක්, සාපරාධී වග කීමක්, criminal liability එකක් තිබෙනවා. අනෙක් පැත්තෙන් වරප්‍රසාද කඩවීම් තිබෙනවා. ඒ එකම සිදුවීම් මාලාව තුළ තිබෙන අපරාධ වග කීම ගැන තමයි පොලීසිය පරීක්ෂණ කරලා නීතිපතිට කරුණු යොමු කර තිබෙන්නේ. අනෙක් අතට කල්පනා කළාම, මේ තරම් ජාතික වැදගත්කමක් සහිත කාරණයක් පිළිබඳව තීරණ ගැනීමට ඉක්මන් නොවීම ගැන නීතිපති දෙපාර්තමේන්තුව පැත්තේත් ප්‍රමාදයක් තිබෙනවා. මෙය ඒ අය ප්‍රමුඛතාවක් දිය යුතු කාරණයක්.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

අනෙක් අතට, පාර්ලිමේන්තුව වශයෙන් ගත්තාම, ඒ අවස්ථාවේ ඔබතුමා ඉතාම වීරෝදාර විධියට සහ වග කීමකින් යුතුව ක්‍රියා කළා. ඒ අවස්ථාවේ ඔබතුමා රට ගලවා ගත්තා. ගරු කථානායකතුමනි, ඒ දින 52ට අදාළ ඒ සිද්ධියට සම්බන්ධ වූ කිසිම මන්ත්‍රීවරයෙකු පිළිබඳව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නැහැ. ඔබතුමාගේ අසුනේ වාඩි වෙලා, mikes කඩා දමලා, පහර දීලා, ඔබතුමාට පහර දීලා, පුටුවලින් ගහලා, පොලිස් නිලධාරීන්ගේ කණට ගහලා ඒ සියල්ල කරපු කිසි කෙනෙකුට නිශ්චිතව දණ්ඩනයක් නැහැ. මාත් ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙක්. ඒ කාරණයට අදාළ පියවර ගන්න ඕනෑය කියලා අපි අවස්ථා කිහිපයක දී සාකච්ඡා කළා. නමුත්, ඒ කාරණය සම්බන්ධයෙන් ප්‍රමුඛතාවක් නැහැ කියලා මට පෙනෙනවා. මේක ඉතාම නරක තත්ත්වයක්, ගරු කථානායකතුමනි.

"ස්වර්ණවාහිනියේ" වැඩසටහනක් තිබෙනවා, "නාඩිය" කියලා. එම වැඩසටහනේ දී ළමයි ප්‍රශ්න අහනවා. ඒ ළමයි බොහොම අවංකව පක්ෂ, පාට නැතිව ප්‍රශ්න අහනවා. "මෙච්චර වරදක් වෙලා, මේ වැරදි කළ අය TV එකෙන් දැකලා තිබියදීත්, මේ තරම් සාක්ෂි තිබියදීත් උසාවියෙන් මේ අයට දඬුවම් දීලා නැත්තේ ඇයි? පාර්ලිමේන්තුවෙන් දඬුවම් දීලා නැත්තේ ඇයි?" කියලා ඒ ළමයි අහනවා. අපට මේවාට උත්තර දෙන්න බැහැ, ගරු කථානායකතුමනි. මේ ළමයි අහන්නේ ඇත්ත ප්‍රශ්න; සත්‍ය ප්‍රශ්න. මේ ප්‍රශ්නවලට අපි උත්තර දුන්නේ නැත්නම්, මේ පාර්ලිමේන්තුවේ තිබෙන වලංගුභාවය, ගෞරවය තවත් පහළට යනවා. ඒ නිසා මම කියන්නේ, මේ කාරණය පිළිබඳ ප්‍රමුඛතාවක් දීලා කටයුතු කරන්න ඕනෑ කියලායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, මේ ගැන කථා කිරීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මේ සම්බන්ධයෙන් එම කමිටුවේ සභාපතිතුමාට කථා කරලා අවශ්‍ය පියවර ගන්නම්. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, අවස්ථාව දෙන්නම්.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්න පිළිබඳව ලබන 16 වැනි දා රටේ මහජනයා තීන්දුවක් දෙයි. [බාධා කිරීම්] හරිද? ඒ තීන්දුව සියලුදෙනාටම පිළිගන්න වෙයි. තමුන්නාන්සේ රාජකාරි කළ ආකාරය හරිද, පාර්ලිමේන්තුව කටයුතු කළ ආකාරය හරිද, පාර්ලිමේන්තුව කල් දමපු එක හරිද කියන කාරණා සම්බන්ධයෙන් ලබන 16 වැනි දා මහජනයා තීන්දුවක් දෙයි. ඒ තීන්දුවෙන් බලා ගන්න පුළුවන් කවුද හරි කියලා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මීට කලින්, පාර්ලිමේන්තුව රැස් වූ අවස්ථාවකදී ගරු අර්ජුන රණතුංග ඇමතිතුමාත් මේ කාරණය මතු කළා. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පිළිබඳව ගරු විගණකාධිපතිතුමා විශේෂ වෝහාරික විගණන වාර්තාවක් ඉදිරිපත් කළා. එම වාර්තාව එදා 10.15ට පමණ තමයි පාර්ලිමේන්තුවට එවා තිබුණේ. ගරු කථානායකතුමනි, අද පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා, COPE එකේ අපේ ලේකම් කාර්යාලය මඟින් එම වාර්තාව ඔබතුමාගේ කාර්යාලයට යොමු කර තිබුණා. ඒ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත වුණාද කියලා මම දැනගන්න කැමැතියි. ඒ වාර්තාව ඉදිරිපත් වුණේ නැහැ ගරු කථානායකතුමනි. ඒක විශේෂ විගණන වාර්තාවක්. එම වාර්තාව අද දිනය තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා මම ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරවනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එම වාර්තාව තවම පාර්ලිමේන්තුවට ලැබිලා නැහැ.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, පසුගිය කාලයේ පාර්ලිමේන්තුවේ ඇති වූ සිද්ධි පිළිබඳව ඔබතුමා සාධාරණ පරීක්ෂණයක් කරයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා. මහජන මුදල් නාස්ති කරලා පාර්ලිමේන්තුව රැස්වෙලා, ඇමතිවරයකුගෙන් ප්‍රශ්නයක් ඇහුවාම අදාළ ඇමතිතුමා උත්තර දෙන්නේ නැහැ. අද වුණත් එහෙමයි. ඒ නිසා මහජන නියෝජිතයන්ට මේ පාර්ලිමේන්තුව පිළිබඳව විශ්වාසයක් නැහැ; මහ ජනතාවටත් නැහැ. ඒ දින 52 ආණ්ඩුව පැවති කාලයේ පාර්ලිමේන්තුවට අපි ආයුධ ගෙනාවේ නැහැ. ගරු කථානායකතුමනි, ඒ දේවල් කියන පාර්ශ්වය තමයි ආයුධ ගෙනැල්ලා - පිහියක් ගෙනැල්ලා - ඔබතුමාගේ පුටුව ළඟ තියා ගෙන මෙතැන ඒ විධියේ බරපතළ සිද්ධි ඇති කළේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ කමිටුවේ වාර්තාව අනුව කටයුතු කරමු, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුවේ ඉන්න ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීවරයෙක්. එතුමා කියන්නේ, දින 52 ආණ්ඩුව පැවති කාලයේ පාර්ලිමේන්තුවේ ඇති වූ සිදුවීම් මාලාව 16වන දා ජනාධිපතිවරණයේදී විනිශ්චයට ලක්වෙන බවයි. මිරිස් කුඩු ගහපු එක හරිද, පුටු පොළොවේ ගහපු එක හරිද, බයිබලයෙන් ගහපු එක හරිද, ඔබතුමාගේ පුටුවේ වාඩි වෙලා ඒ පුටුව කඩා දමපු එක හරිද, mikes කඩා දමපු එක හරිද කියලා නේ ප්‍රශ්නය අහන්නේ? එහෙම නම්, දෙන්න තිබෙන තීරණය මොකක්ද කියලා ඉතාම පැහැදිලියි. මොකද, මේ රටේ කිසිම කෙනෙක් ඒ ක්‍රියාව 16වන දාට අනුමත කරන්නේ නැහැ. මේ රටේ කිසිම කෙනෙක් මේ පාර්ලිමේන්තුවේ එදා ඒ අය හැසිරුණු ආකාරය අනුමත කරන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කණ්ඩායමේ මන්ත්‍රීතුමන්ලා හැසිරුණු විධිය තමයි මේ රටේ ජනතාව අනුමත කරන්න ඕනෑ කියලා ඔබතුමා හිතනවා නම්, මම මේ රටේ ජනතාවටත්, ගරු කථානායකතුමනි ඔබතුමාටත් කියන්නේ, මේ වෙලාවේ ඒ තෝරා ගැනීම කරන්න ඉතා පහසුයි කියලායි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කණ්ඩායම නියෝජනය කරන්නේ මිරිස් කුඩු ගහන, පුටු පොළොවේ ගහන, බයිබලයෙන් පහර දෙන කණ්ඩායම.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, අපට මේ ගැන විවාදයක් අවශ්‍ය නැහැ.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගාමිණී ලොකුගේ මැතිතුමනි, ඒ කාරණය අපි මෙතැනින් අවසන් කරමු. ඔබතුමාගේ අදහස ඉදිරිපත් කළා නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළ ඒ වාර්තාව අද දින ඉදිරිපත් කර තිබෙනවා. 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ I කොටස සහ දසවැනි කාණ්ඩයේ XII කොටස ලෙස ඇතුළත් වී තිබෙන්නේ එය තමයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මට කාරණයක් කියන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, කියන්න ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි. පසුගිය පාර්ලිමේන්තු රැස්වීම් සතියේදීත් මේ කාරණය මම ඔබතුමාට කිව්වා. මිරිස් කුඩු ප්‍රහාරය සහ මන්ත්‍රීවරුන්ට පහර දීම සම්බන්ධ කටයුත්තට චෝදනා ලබපු මන්ත්‍රීවරුන්ගෙන් සමහර අය සභාපති නාම ලේඛනයේ ඉන්නවා කියලා මම කිව්වා. ඔබතුමා කිව්වා, එයට සම්බන්ධ එක පුද්ගලයෙක් ඔබතුමා ඉවත් කළා කියලා. ඒ ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මා ඔබතුමාගේ ලේකම්තුමාට ලබා දුන්නා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක හම්බ වුණා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එහෙම නම්, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගරු කථානායකතුමනි, වැරැද්දට නිසි දඬුවම නොලැබුණාම ඒක බෝ වෙනවා; ඒක ක්‍රමය වෙනවා. ඊට පස්සේ වැරැද්දට විරුද්ධව කථා කරන එක්කෙනා මෝඩයා වෙනවා. එම නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න කියලා. අපට ලජ්ජයි, එවැනි පුද්ගලයන් සමඟ මූලාසනයේ ඉන්න. මම දැක්කා, ගිය සතියේ විකාශනය වූ "නාඩිය" කියන වැඩසටහනේදී හිටපු නියෝජ්‍ය කථානායකවරයකු වන චන්දිම වීරක්කොඩි මැතිතුමාගෙන් කුඩා දියණියක් ප්‍රශ්න අහපු ආකාරය. ඒ දියණිය ඇහුවා, "ඔබතුමා හිටපු නියෝජ්‍ය කථානායකතුමෙක්, ඔබතුමන්ලාට නීති නැද්ද, සම්ප්‍රදායයන් නැද්ද, ඉතාම නරක විධියට හැසිරුණු අයට විරුද්ධව කටයුතු කරන්න?" කියලා. මේ කාරණය සරල නැහැ, ගරු කථානායකතුමනි. අවුරුදු 18, 19, 20 කියන වයස් මට්ටම්වල දරුවන්ගේ අධ්‍යාත්මයට මේ දේවල් ගිහිල්ලා තිබෙන්නේ. කරුණාකර අපටවත් නිවැරදි වෙන්න ඔබතුමා මේ නියෝග අරගෙන, දඬුවම් ක්‍රියාත්මක කරන්න.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත
### அற்றோணித் தத்துவம் (திருத்தம்) சட்டமூலம்
### POWERS OF ATTORNEY (AMENDMENT) BILL

"(122 වන අධිකාරය වූ) ඇටෝර්නි බලපත්‍ර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***පිළිගන්වන ලද්දේ අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.***

***2019 දෙසැම්බර් 03 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரின் சார்பாக மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2019 டிசம்பர் 03, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government; to be read a Second time upon Tuesday, 03rd December, 2019 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order 8 of the Parliament, the hours of Sittings of Parliament on this day shall be 10.30 a.m. to 12.30 p.m. and 1.30 p.m. to 6.30 p.m. At 1.30 p.m., Standing Order 8(5) of the Parliament shall operate. At 6.30 p.m., Mr. Speaker shall adjourn the Parliament without question put."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That this Parliament at its rising this day do adjourn until 1.00 p.m. on Tuesday, 03rd December, 2019."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත
### புகையிலை வரி (திருத்தம்) சட்டமூலம்
### TOBACCO TAX (AMENDMENT) BILL

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1999 අංක 08 දරන දුම්කොළ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 52 (6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Health, Nutrition and Indigenous Medicine for report.*

### පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත
### மாகாணசபை தேர்தல்கள் (திருத்தம்) சட்டமூலம்
### PROVINCIAL COUNCILS ELECTIONS (AMENDMENT) BILL

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, I move,

"That leave be granted to introduce a Bill to amend the Provincial Councils Elections Act, No. 2 of 1988."

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 52 (6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப் படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6) இன்படி உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாணசபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government for report.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 4 දක්වා. 1වන යෝජනාව අද දින සාකච්ඡාවට ගන්නේ නැහැ. Items 3 and 4, the Sectoral Oversight Committee has not approved yet. සභාවේ අවසරය ඇතිව අපට ඕනෑ නම් අද ඒවා විවාද කරන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Yes, we can, Sir.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ආංශික අධීක්ෂණ කාරක සභාවල වාර්තා ලැබිලා නැහැ කියලා ඔබතුමා කියනවා. මේ පාර්ලිමේන්තුවේ දැන් ඔබතුමන්ලා කථා කරන්නේ නිරෝගී

ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන ක්‍රමවේදය ගැන නේ. ඉතින් ක්‍රමවේදයට අනුව කටයුතු කරනවා නම්, අද එම යෝජනාව කල් දමලා අනික් දවසේ විවාදයට ගන්න පුළුවන්. මොකක්ද හදිසිය?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේක බරපතළ ප්‍රශ්නයක්. අද ඉදිරිපත් කරන්නේ ක්‍රීඩා පනත යටතේ වූ නියෝග කීපයක්. අපි ක්‍රීඩාවට සම්බන්ධ පනත් කෙටුම්පතකුත් ඉදිරිපත් කළා. ඒ, ක්‍රීඩාවෙන් දූෂණය අයින් කරන්නයි. ගරු කථානායකතුමනි, මම මේ කියන කාරණා සම්බන්ධයෙන් පොඩ්ඩක් අවධානය යොමු කරන්න. මේ පාර්ලිමේන්තුව ඇතුළේ, සූදුකාරයන්ට සහයෝගය දෙන "ගේමක්" තිබෙනවා. ඒ පනත් කෙටුම්පත ක්‍රීඩාවෙන් සූදුව අයින් කරන්න අපි කළ වැඩක්. ගරු කථානායකතුමනි, Sectoral Oversight Committee එකේදී ඒ පනත් කෙටුම්පත පාස් වුණා. හැබැයි, අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ නියෝග ටිකක්. එදා ඒ කමිටුවේ Quorum එක තිබුණේ නැහැ. ඒක හරි. අපි පනත් කෙටුම්පතක් සකස් කරලා, දඬුවම් කරන්න පුළුවන් වැරදි ටික එයට ඇතුළත් කරලා, නීතිපති දෙපාර්තමේන්තුවෙන් මාස ගණනාවක් මහන්සි වෙලා හදපු පනත් කෙටුම්පතක් ඒක; මෙතෙක් පාර්ලිමේන්තුවේ කවුරුත් කරපු නැති එකක්. ඒ පනත් කෙටුම්පතින් කරන්නේ දූෂිතයන්ට දඬුවම් කිරීම. ක්‍රීඩාවෙන් වංචාව, දූෂණය අයින් කරන්න පනතක් ගේනකොට ඒකට විරුද්ධව පාර්ලිමේන්තුව ඇතුළෙත් "ගේමක්" තියෙනවාය කියන එක පැහැදිලිව මම කියන්න ඕනෑ. Quorum එක තිබුණේ නැති Sectoral Oversight Committee එකට ඉදිරිපත් කළ නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, Quorum එක තිබුණු Sectoral Oversight Committee එකට ඉදිරිපත් කළ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙලා නැහැ. මොකක්ද මේ කරන්න හදන්නේ? මේ කරන්නේ ප්‍රමාද කිරීම; කල් ඇදීම; කල් මැරීම; 16වන දාට පස්සේ මේවා ඉදිරිපත් කරන්න කටයුතු කිරීම. මේ තුළින් පෙනෙන්නේ කවුරු හෝ හොරෙක් ආරක්ෂා කරන්න කාට හෝ වුවමනාවක් තිබෙන බවයි. මෙතැන වෙන කිසි දෙයක් නැහැ. ගරු කථානායකතුමනි, COPE එක පැහැදිලිව මේ කරුණු කියනවා; ICC එකෙන් එවූ ලියුමක් තිබෙනවා. අර්ජුන රණතුංග ඇමතිතුමා ඒ ලියුම table කරාවි. මේ පාර්ලිමේන්තුවේම ඉන්න කෙනෙක් ක්‍රීඩාවෙන් කොච්චර හොරකම් කරලා තිබෙනවාද කියලා දැන් පෙනෙනවා. මේ දේවල් ලංකාවේ ක්‍රීඩාවෙන් අයින් කරන්න පාර්ලිමේන්තුව ඇතුළේත් ඉඩක් දෙන්නේ නැත්නම් ලංකාව ගැන තව මොන කථාවක්ද කියන්න තිබෙන්නේ?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ඒ කමිටුවෙන් අනුමැතිය දෙන්න ඕනෑ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

කමිටුවෙන් අනුමැතිය දුන්නා. ඒක වරද්දා ගෙන. මේ නියෝගයක් අනුමත කරන වෙලාවේ ඒ කාරක සභාවේ Quorum එක තිබිලා නැහැ. හැබැයි, ඒ නියෝගය මෙතැනට ඉදිරිපත් කරලා තිබෙනවා. මොකක්ද මේ කරලා තිබෙන්නේ?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, ක්‍රීඩාවෙන් දූෂණය තුරන් කිරීම සම්බන්ධ යෝජිත පනත් කෙටුම්පත ඉතාම වැදගත් එකක්. ඒක ක්‍රිකට් ක්‍රීඩාවට වාගේම අනෙක් ක්‍රීඩාවලටත් වැදගත්. ඒ වාගේම, අපේ රටේ තත්ත්වය ඉහළට ගෙන යන, අපේ රටේ ක්‍රීඩාව පිරිසිදු කරන පනත් කෙටුම්පතක්. ඒ වාගේම, ක්‍රීඩා කරන හෝ නොකරන මේ රටේ හැම පුරවැසියකුටම තමන්ගේ රටේ අභිමානය පිළිබඳ වැදගත් පනත් කෙටුම්පතක්. ඒ පනත් කෙටුම්පත සම්බන්ධ කාර්ය පටිපාටිය සම්පූර්ණ වෙලා අද න්‍යාය පත්‍රයට එන්නයි තිබුණේ. එහෙම එන්න තිබියදී, ඒක න්‍යාය පත්‍රයට ආවේ නැහැ. නමුත් කාරක සභාවෙන් අනුමත නොකරපු ගැසට් නිවේදනයක් න්‍යාය පත්‍රයට ආවා. එතකොට මොකක්ද මේ වුණේ? ප්‍රමාද දෝෂයක් ද? හිතා මතා කළ දෙයක් ද? එහෙම නැත්නම් මේ ප්‍රශ්නය හා සම්බන්ධ බලගතු පුද්ගලයකුගේ බලපෑමට යටත්ව සිදු වූ දෙයක්ද? ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය ගැන ඔබතුමා වහාම හොයා බලා වාර්තා කරන්න ඕනෑ. සමහරු හිතාගෙන ඉන්නවා, "16වැනිදායින් පස්සේ මේවා වෙනස් වෙනවා. අපි එතකොට බලා ගනිමු" කියලා. ගරු කථානායකතුමනි, නොවැම්බර් 16වැනිදායින් පස්සේ මොකුත් වෙනස් වෙන්නේ නැහැ. මේ රටේ මිනිස්සු මේවා දැන ගන්න කොට, මේ වාගේ වැඩ පිළිවෙළවල් ගැන දැන ගන්න කොට දූෂිතයන්ට ආපසු රට යන එක වළක්වනවා. ඒක පැහැදිලියි. එහෙම නම් 16වැනිදායින් පසුවත් අපට මේ පනත් ගෙනෙන්න පුළුවන්. හැබැයි, අද මේ පනත් කෙටුම්පත සම්මත කළා නම් රටට හොඳයි.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ගරු කථානායකතුමනි, 2001දී මම මේ පාර්ලිමේන්තුවට ආපු දවසේ ඉඳලාම මේ ගැන කියනවා. නමුත්, කොන්දක් තිබෙන ක්‍රීඩා ඇමතිවරයකු හැටියට හරින් ප්‍රනාන්දු මැතිතුමා පමණයි හොරු අයින් කරන්න මේ පනත් කෙටුම්පත ගෙනාවේ. අඩු ගණනේ දැන් ඒ පනත් කෙටුම්පත සකස් කරලා තිබෙන අවස්ථාවේ විපක්ෂයේ ඔබතුමන්ලාත් ඒකට උදව් කරන්න. මම මේ ක්‍රීඩකයකු හැටියටයි කථා කරන්නේ. [බාධා කිරීමක්] පොඩ්ඩක් අහගෙන ඉන්න. ක්‍රීඩාව විනාශ කරලායි තිබෙන්නේ. ඒකයි ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමා මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා හිටපු වැදගත් ඇමතිවරු. හොරු ආරක්ෂා කරන්න හදන්න එපා. ඔබතුමන්ලාගේ විපක්ෂ නායකතුමා ඒ අදාළ පුද්ගලයා COPE එකට පත් කරනවා. මොකක්ද මේ තත්ත්වය? ඔබතුමන්ලා කථා කරනවා, රට හදන්න. මොන හැදිල්ලක්ද? ඒ නිසා ඔබතුමන්ලා මීට වඩා කල්පනා කරන්න. මේ කටයුත්ත අවුරුදු ගණනක් තිස්සේම නොවුණු දෙයක්. එන හැම ක්‍රීඩා ඇමතිවරයාටම, ඒ අදාළ තනතුරුවල ඉන්න අයට සල්ලි දීලා, පගාව දීලා මේ කාරණය නවත්වනවා. නමුත්, මෙතුමාට -ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමාට- කොන්දක් තිබුණා මේ පනත් කෙටුම්පත ගෙනෙන්න. එහෙම නොවුණා නම් අන්තිමට ක්‍රීඩකයන් තමයි දුක් විඳින්නේ. පරිපාලනය කරන මිනිස්සු හොරකම් කරලා, සූදු කෙළලා තරග පාවා දුන්නාම අන්තිමට ඒක කවුරු හෝ ක්‍රීඩකයකු පිටින් තමයි යන්නේ. අද සනත් ජයසූරියට ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. අවිෂ්ක ගුණවර්ධනට ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. ඒ අය මාත් එක්ක ක්‍රීඩා කරපු ක්‍රීඩකයෝ. ඒ ක්‍රීඩකයෝ වැරදි නැහැ. පරිපාලනය කරන මිනිසුන්ගේයි වරද තිබෙන්නේ. ඒ නිසා අද මේ කරන්න යන දේ නවත්වන්න දෙන්න එපා. මම මේ රටට කියනවා, මේ ආයතනවලට දූෂිතයන්ට එන්න දෙන්නත් එපා කියලා. ඇත්තටම මේ වාගේ දේවල් කරන්න දෙන්න එපා, බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමනි. තමුන්නාන්සේ මම ගරු කරන හිටපු ඇමතිවරයෙක්. [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මම එසේ කිව්වේ දූෂිතයන්ට දඬුවම් දීම හෝ පනත් කෙටුම්පත් සම්මත කිරීමට විරුද්ධව නොවෙයි. පාර්ලිමේන්තුවේ ක්‍රමවේදය අනුව ආංශික අධීක්ෂණ කාරක සභාවල අනුමැතිය නැත්නම්, එසේ නොකර සම්මත කර ගන්න අවශ්‍යයි කියලා කියනවා නම්, ඕනෑම දූෂිතයෙකුට දඬුවම් දීම සඳහා අවශ්‍ය දෙයක් සම්මත කර ගැනීම සඳහා අප එක හිතින් අවශ්‍ය පූර්ණ සහයෝගය ලබා දෙනවා. ගරු කථානායකතුමනි, මම මේ කමිටුවේ සාමාජිකයෙක් නොවෙයි. මේවා සම්මත වෙන්නේ පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාවල තිබෙන ක්‍රමවේදය අනුව නම්, එසේ නොවී සම්මත වීමෙන් පාර්ලිමේන්තුව තුළ අලුත් සම්ප්‍රදායක් ඇති වෙන එක ගැනයි මම කථා කළේ. ඒ නිසා සම්ප්‍රදායය විරෝධී ලෙස හදිසියේ සම්මත කරන්න අවශ්‍ය නම්, එසේ සම්මත කර ගත්තාට මගේ කිසිම විරුද්ධත්වයක් නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

පාර්ලිමේන්තුවේ කැමැත්ත අනුව අපට ඒක කරන්න පුළුවන්. - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද පුළුවන්ද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

පුළුවන්. - [බාධා කිරීමක්]

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ගරු මන්ත්‍රීතුමනි, ICC එකෙන් හදලා තිබෙනවා, criminal charges කියලා - [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

හරි, හරි. [බාධා කිරීමක්] ඒක ගැන නොවෙයි, මේ ප්‍රශ්නය තිබෙන්නේ. ක්‍රමවේදය ගැනයි මේ ප්‍රශ්නය තිනේනේ. [බාධා කිරීමක්]

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

පොඩ්ඩක් ඉවසන්න. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුව එකඟ නම්, අපට ඒ විධියට කරන්න පුළුවන්. - [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

පාර්ලිමේන්තුව එකඟයි. [බාධා කිරීම්]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්] නැහැ, නැහැ. ඇහුම් කන් දෙන්න කෝ. ගරු කථානායකතුමනි, ගරු ක්‍රීඩා ඇමතිතුමා ක්‍රීඩාවෙන් සූදුව අයින් කිරීම අරමුණු කරගෙන සහ අපි කවුරුත් දන්නා ප්‍රශ්නයක් මත පදනම් වෙලා දැන් මේ ඉදිරිපත් කරන නියෝග, ඒ කමිටුවේ Quorum එක පවත්වා ගන්න බැරිවීම නිසා හෝ අනුමත කරන්න බැරි වුණා නම්, මේ නිශ්චිත කාර්යයට පමණක් සීමා වන පරිදි ක්‍රීඩාවේ යහපත සඳහා සම්මත කරගන්න අපේ එකඟතාව ලබා දෙන්න අපි ලෑස්තියි. නමුත් මෙය පූර්වාදර්ශයක් නොවිය යුතුයි. මොකද, මෙසේ හදිසි කරගෙන, ඩෝසර් කරගෙන යන ක්‍රමය හරි නැහැ.

ගරු කථානායකතුමනි, දෙවැනි කාරණය මෙයයි. අපි -මාත්, හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාත්- ඔබතුමාගෙන් ඉල්ලා සිටියා, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ දූෂණ පිළිබඳව පරීක්ෂණ කෙරෙන නිසා තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා COPE එකට පත් කිරීම නතර කරන්න කියලා. ගරු කථානායකතුමනි, ප්‍රසිද්ධ චෝදනා ලබපු පුද්ගලයන් මෙම කාරක සභාවට පත් නොකර ඉන්න පොහොට්ටු පක්ෂයට -සන්ධාන පක්ෂයට- එහි මහලේකම්ට, විපක්ෂ නායකට වගකීමක් තිබෙනවා. ඒක අවම සදාචාරය. ඒ අවම සදාචාරයත් නැහැ. හොඳටම තේරෙනවා නේ. Sri Lanka Cricket එකෙන් අයින් කළාට පසුවයි, COPE එකට එන්නේ. ඒ කියන්නේ, දූෂිතයා, චූදිතයා නඩුකාරයා වෙනවා. මේවා අන්තිම වැරදි දේවල්. ඒ නිසා මම ගරු සභානායකතුමාට කියන්න කැමැතියි, අන්න ඒ අවධාරණය සහිතව මේ නිශ්චිත කාරණයට පමණක්, ක්‍රීඩා ඇමතිතුමාගේ මෙම නියෝග සම්මත කිරීමට පමණක් අපි සහයෝගය ලබා දෙන බව.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු කථානායකතුමනි, -

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I will give you a chance in a minute; පොඩ්ඩක් ඉන්න. ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු කථානායකතුමනි, ඇත්තටම ක්‍රීඩා ඇමතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. මොකද, ක්‍රීඩා ඇමතිතුමා කොන්දක් ඇතිව හැම තිස්සේම උත්සාහ කළා, සාකච්ඡා කළා, මේ නියෝග ඉදිරිපත් කළ යුතුයි කියලා. අර්ජුන රණතුංග ඇමතිතුමා තමයි ලංකාවට ක්‍රිකට් ලෝක කුසලානය ලබා දුන් ක්‍රිකට් නායකයා. එතුමා දන්නවා, සූදුව හරහා ක්‍රීඩාව විනාශ වුණේ කොහොමද කියලා. ඒ විතරක් නොව අපේ පාර්ලිමේන්තුව දන්නවා, මේ සූදු කප්පිත්තන් නියෝජ්‍ය කථානායක ධුරය පවා ඉතාම වැරදි විධියට පාවිච්චි කරපු හැටි. අපි අතීතයේදී එය දැක්කා. ඒ විතරක් නොවෙයි, කාරක සභාවලට අනිසි බලපෑම් කළා. ඒක අපි අත් දැකීමෙන් දන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපට මේ විවාදයට පැය දෙකක් තිබෙනවා. ඒ නිසා විවාදයේදී ඒ ටික කථා කරමු.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු කථානායකතුමනි, මේ නියෝග අද විවාදයට ගන්න කියලා මා පැහැදිලිව කියනවා. පාර්ලිමේන්තුවට මේ කැත ආදර්ශය දෙන්න හදන්න එපා. විශේෂයෙන් දූෂිතයන් ආරක්ෂා කරන්න මේ පැත්තේ කාටවත් අත උස්සන්න දෙන්න බැහැ. [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මෙහි ඇති වැදගත්කම සලකා, පූර්වාදර්ශයක් නොවෙන්නට මේ අවස්ථාවට පමණක් අපි මේ නියෝග අනුමත කරන්න එකඟ වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සඳහා සභාව එකඟ ද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම්, ඒ අනුව පූර්වාදර්ශයක් නොවන විධියට මේ නියෝග විවාදයට ගන්නවා.

ක්‍රීඩා අමාත්‍යතුමා, න්‍යාය පත්‍රයේ යෝජනා අංක 2, 3, 4 ඉදිරිපත් කරන්න.

## ක්‍රීඩා පනත: නියෝග
## விளையாட்டுக்கள் சட்டம்: ஒழுங்குவிதிகள்
## SPORTS LAW: REGULATIONS

[11.39 a.m.]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා (විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஹரின் பர்னாந்து - தொலைத்தொடர்புகள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Harin Fernando - Minister of Telecommunication, Foreign Employment and Sports)
Hon. Speaker, I move,

"That the Regulations made by the Minister of Telecommunication, Foreign Employment and Sports under Section 41 read with Section 31 of the Sports Law, No. 25 of 1973 regarding National Associations of Sports and published in Gazette Extraordinary No. 2128/8 of 18th June 2019, which were presented on 08.10.2019, be approved.

(Cabinet approval signified.)"

ගරු කථානායකතුමනි, මම මුලින්ම පාර්ලිමේන්තුවට විශාල ස්තුතියක් පිරිනමනවා. මොකද, මේ රටේ ඇති වැදගත් කාරණයක් ගැන තේරුම් අරගෙන, මේ නියෝග පාර්ලිමේන්තුව තුළ සාකච්ඡාවට ගැනීමට සහ ඒවාට අනුමැතිය ලබාදීමට ඉදිරිපත් වීම ගැන. ගරු කථානායකතුමනි මේක දරුණු ප්‍රශ්නයක්. රටේ තියෙන මේ ක්‍රමවේදය bypass කරන ක්‍රමය අපි කවදාද නවත්වන්නේ? "රට හදන තැන" කියලා තමයි අපි පාර්ලිමේන්තුව ගැන දන්නේ. ගරු කථානායකතුමනි, පැහැදිලි ප්‍රශ්නයක් හැටියට මට තියෙන්නේ මෙයයි. Quorum එක තිබුණු ඒ කාරක සභාවේ සාකච්ඡා කළ කෙටුම්පතේ තිබුණේ මොකක්ද? ඒ කාරක සභාවේ Quorum තිබුණා. ඇයි, ඒක අද Order of Business එකේ නැත්තේ? මම මෙතැනට ඇවිල්ලා ඒ ගැන අහනතුරු ඒක Order of Business එකේ නැහැ කියලා දන්නේ නැහැ. හැබැයි, Quorum නැතිව පැවැති කාරක සභාවේදී සාකච්ඡා වූ නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණා. අපි සතුටු වෙනවා, අඩුම ගණනේ ඒ නියෝගවල මොනවාද තියෙන්නේ කියලා දැන ගන්න ලැබීම ගැන. මෙ◌ැතන නියෝග තුනක් තියෙනවා. එකක්, ක්‍රීඩාවේ accounting purposes සම්බන්ධයෙන් Auditor-Generalගේ විස්තරයක්. දෙවෙනි නියෝගයෙන් විශේෂයෙන්ම සූදු සම්බන්ධයෙන් සිටින කණ්ඩායම්, ජාතික ක්‍රීඩා සංගම් සම්බන්ධයෙන් මෙහෙම කියනවා.

"ඔට්ටු ඇල්ලීමේ, සූදු ක්‍රීඩාවේ, පරදු තැබීමේ ව්‍යාපාරයක හෝ කිසියම් තරගයකට සම්බන්ධතාවක් ඇති ඔට්ටු ඇල්ලීමේ හෝ සූදු ක්‍රීඩාවේ හෝ පරදු තැබීමේ ව්‍යාපාරයක හෝ එවැනි තරග සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනයක හෝ ආයතනයන්හි එදිනෙදා කටයුතුවල නියැලී සිටින තැනැත්තෙක් හෝ ඔහුගේ පවුලේ ඕනෑම පූර්වාසන්න සාමාජිකයෙකු (කලත්‍රයා, මව, පියා, සහෝදරයෙක්, සහෝදරියක්, පුතා, දුව, බෑනා, ලේලිය) වන්නේ නම්" මේවාට සම්බන්ධ වෙන්න බැහැ කියලා.

වැදගත් කාරණාවක් විධියට අද සම්මත වන්නේ ඒක විතරයි. හැබැයි, ඊට වඩා වැදගත් නියෝගයක් අපි පනතට ඉදිරිපත් කරලා තිබුණා. එහි තිබුණේ මොනවාද? ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලනවා. මේක එසේ මෙසේ දෙයක් නොවෙයි. මේක, පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය කථානායකවරයකු ආරක්ෂා කරන්න පාර්ලිමේන්තු කණ්ඩායමෙන් කරපු දෙයක්ද කියලා මට සැකයක් තිබෙනවා. ඒක මම කියන්න ඕනෑ. ගරු කථානායකතුමනි, එම නිසා අපි මේ කාරණය හොඳට මතක තබාගන්න ඕනෑ. ඒ නියෝගයෙන් අපි ඉල්ලා තිබෙන්නේ මොකක්ද? අපි ගෙනාවේ ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ නියෝගයක්. ඒක තමයි අපි ඉදිරිපත් කරන්න ගියේ. ක්‍රීඩා තරග පාවාදීම, ක්‍රීඩාවලට සම්බන්ධ දූෂිත ක්‍රියාවල යෙදීම, නීතිවිරෝධී මෙහෙයවීම, නීතිවිරෝධී ඔට්ටු ඇල්ලීම කියන ක්‍රීඩා සම්බන්ධයෙන් කරනු ලබන ඉහත වැරදි වැළැක්වීමේ නියෝගයක් වශයෙන් මෙය සඳහන් කළ හැකියි. ඉහත සඳහන් වැරදිවලට මහාධිකරණ විභාගයකින් පසු යම් තැනැත්තෙක් වරදකරුවෙකු වනු ලැබුවහොත්, මිලියන 100ක් දක්වා දඩයක් සහ අවුරුදු 10ක සිර දඬුවමක් දෙන්න තමයි යෝජනා කර තිබෙන්නේ. එතකොට මේක වළක්වන්නේ කවුද? මේක සම්බන්ධයෙන් හොයා බලන්නම ඕනෑ, ගරු කථානායකතුමනි.

දෙවැනි කරුණ මොකක්ද? වෙනත් ක්‍රීඩා සම්බන්ධයෙන් වන වැරදිවලට මහෙස්ත්‍රාත් අධිකරණයට යෑම. මේ යෝජනා අපි හදපුවා නොවෙයි, ගරු කථානායකතුමනි. සොලිසිටර් ජෙනරාල්වරු ඇතුළු නීතිපති දෙපාර්තමේන්තුව මේවා හැදුවේ අවුරුදු ගණනාවක් මහන්සි වෙලායි. ඒවා මෙතැනට ඉදිරිපත් කළාම ඉස්පිල්ලක් නැහැයි කියනවා, පාපිල්ලක් නැහැයි කියනවා, full stop එකක් නැහැයි කියනවා. ඒ විධියට දහසය වතාවක් මේ

[ගරු හරින් ප්‍රනාන්ද මහතා]

කරුණ එහෙට මෙහෙට ගියා. එහෙම වෙලාත් ඉදිරිපත් කළාට පස්සේ අන්තිමට මොකද වුණේ? අජිත් පී. පෙරේරා ඇමතිතුමා කිව්වා වාගේ, මාත් ගරු කරන හිටපු ක්‍රීඩා අමාත්‍යවරයකු වන අපේ ගාමිණී ලොකුගේ මැතිතුමාත් කිව්වා මිරිස් ගැහුවාද, පුටු කැඩුවාද කියන එක 16වෙනිදාට පසු මිනිස්සු තීරණය කරයි කියලා. එම නිසා මේ 16වෙනි දා වන තෙක්ද මේ කටයුතු නවත්වන්නේ? මේක මහා බේදවාචකයක්!

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

මේ නියෝගවල සඳහන් දඬුවම් ක්‍රියාත්මක කරන්නේ අද ඉඳලා වෙන වැරදිවලටද, නැත්නම් අතීතයේ වූ වැරදිවලටත් දඬුවම් කරනවාද?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

ගරු කථානායකතුමනි, අතීතයේ කරන ලද දේවල් සම්බන්ධයෙන් කවුරු හෝ උසාවියට ගිහිල්ලා තීරණයක් ගනියි. මම උසාවියේ Judge නොවෙයි. ඒ කාලයේ වාගේ අපි අරලියගහ මන්දිරයෙන් තීන්දු දෙන්නේ නැහැ නේ? කවුරු හෝ උසාවියට ගිහිල්ලා අහවලා වරදකරුවෙක් කියලා නඩුවක් දැම්මොත් ඒකට අදාළව උසාවියෙන් තීන්දුවක් ලබාදෙයි. මම දන්නේ නැහැ, නඩුවේ තීන්දුව මොකක් වෙයිද කියලා. හැබැයි, වංචාවක් කළොත්, දූෂණයක් කළොත් ඒවාට මේ රටේ නීතියක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම තවත් කරුණක් කියන්න කැමැතියි. මේ අනුව, වෙනත් ක්‍රීඩා සම්බන්ධයෙන් සිදුකරන වැරදිවලට මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු විභාගයකින් පසුව දඬුවම් දෙන්න පුළුවන්. ඉහත වැරදිවලට අදාළ තොරතුරු හෙළිදරව් කිරීම පැහැර හැරීමත්, කවුරු හෝ ඒකට සහයෝගය දීමත් මේ නීතිය අනුව වරදක්. ඒ වාගේම ඒ කරුණු නොකියා ඉඳීමත් වරදක්. ඉහත වැරදි සම්බන්ධ විමර්ශනවලට සහාය දැක්වීම සහ පැහැර හැරීමට දඬුවම ලෙස රුපියල් ලක්ෂදෙකක දඩයකට යටත්ව අවුරුදු තුනකට බන්ධනාගාරගත කරන්නට පුළුවන්.

ඒ වාගේම, මෙම පනත් කෙටුම්පත යටතේ ත්‍යාග අරමුදලක් පිහිටුවනවා, තොරතුරු සපයන තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීමේ අරමුණින්. ගරු කථානායකතුමනි, මේවා මේ රටට ඉතා අවශ්‍ය දේවල්. ක්‍රීඩාව ශුද්ධ කරන්න ඕනෑ කියලා අපි කියනවා. එහෙම නම් මෙතැනින් පටන් ගන්නට ඕනෑ; නීතියක් තිබෙන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, පසුගිය දවසක පාකිස්තානු ජාතික ඔට්ටු අල්ලන පුද්ගලයකු මීගමුව උසාවියට ඉදිරිපත් කළා. නමුත් ඔහුට විරුද්ධව කටයුතු කරන්නට රටේ නීතියක් නැහැ. ක්‍රීඩා තරග සම්බන්ධ බුකිකරුවෙකුව අහුවුණත් ඔහු යවන්න සිද්ධ වුණා, පාස්පෝට් එක දීලා. මොකද, රටේ නීතියක් නැති නිසා. එවැනි තත්ත්වයක් යටතේ ඕනෑම කෙනෙකුට මේ රටට ඇවිල්ලා ක්‍රීඩාවට සම්බන්ධ betting කරන්න පුළුවන්. මොකද, මහ මොළකරුත් ඉන්නේ මේක ඇතුළේම නේ.

ගරු කථානායකතුමනි, මේ නියෝගවලින් එක හොඳක් වෙනවා; අපට පළමුවෙනි ආරම්භය ලැබෙනවා. ඒක තමයි සූදු ව්‍යාපාරයට සම්බන්ධ කිසිම කෙනෙකුට අදින් පසුව ක්‍රීඩාවට ඇතුළුවීමේ අවසරය අහිමි වීම. ඒක හොඳයි. හැබැයි, මේ නීතිය ඇයි හැංගුවේ? කවුරු හෝ කෙනෙකු වරදක් කරලා තිබෙනවා නම්, ඒකට දඬුවමක් දෙන්න පුළුවන් නම්, ඇයි අද පාර්ලිමේන්තුවට ආවේ නැත්තේ? ඒක මහා භයානක ප්‍රශ්නයක්. ගරු කථානායකතුමනි, එම නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ලංකාවේ බොහෝ ක්‍රීඩා තරග තුළ බොහෝ අසාධාරණ සහ අයුක්තිසහගත දේවල් සිදුවෙනවා. එහිදී ක්‍රීඩකයන් විඳින දුක් අප්‍රමාණයි. සමහර වෙලාවට ක්‍රීඩකයාට ක්‍රීඩා සංගම්වලින් මුදලක් ලබා දෙන්නේත් නැහැ. ක්‍රීඩා සංගම් ටික තමන්ට ඕනෑ ඕනෑ විධියට වැඩ කරනවා. කිසිම නීතියක් නැහැ, ක්‍රීඩා සංගම් ඇතුළේ. එම නිසා ඒවා මේ නීති පදනම ඇතුළට ආ යුතුමයි.

අපි අද නියෝග තුනක් ඉදිරිපත් කරලා තිබෙනවා. තව තිබෙන්නේ accounting purpose එක පමණයි. අපි දන්නවා, National Audit Office එකට වැඩ වැඩියි. ඒ ක්‍රීඩා සංගම්වලට නියමිත කාලය ඇතුළත ඒ වාර්තා ලබා දුන්නේ නැත්නම් ඡන්ද තියන්නට බැහැ. එම නිසා අපි National Audit Office එකෙන් දාපු යෝජනාවත් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක තමයි ඒ නියෝග වෙනස්වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, නමුත් අත්‍යවශ්‍යම දෙය වෙලා තිබුණේ මේ පනත් කෙටුම්පත ගෙන ඒමයි. ගරු කථානායකතුමනි, වරදක් කළොත් ඕනෑම කෙනෙකුට, -අපට වුණත් - නීතිය පොදුයි. මේ පනත් කෙටුම්පත ගෙන ආවාම ඒක ලංකාවේ නීතියක් බවට පත් වෙනවා.

ගරු කථානායකතුමනි, එම නිසා මම ඉල්ලීමක් කරනවා, මෙය අත්‍යවශ්‍ය කාරණයක් ලෙස සලකලා පක්ෂ නායකයන් - Party Leadersලා - කැඳවලා හෙට දිනයේ හෝ මේ පනත් කෙටුම්පත සාකච්ඡාවට ගන්න කියලා. ඔබතුමා අවශ්‍ය නම් දැන් සොයලා බලන්න, මේක Sectoral Oversight Committee එකේදී පාස් වූ, approve වූ කෙටුම්පතක්. ඒක Quorum එකක් තිබුණු Sectoral Oversight Committee එකක්. එම නිසා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, පුළුවන් නම් හෙට දිනයේ මේ කෙටුම්පත විවාදයට ගන්න කියලා. මොකද, මේ මාසයේ 16වෙනි දාට කලින් මට බලන්න ඕනෑ, ලංකාවේ මේ වාගේ දේවල්වලට විරුද්ධවෙන කණ්ඩායම කවුද කියලා. මෙවැනි නීතියක් ගෙනැල්ලා මේ රටේ ක්‍රීඩාව පිරිසිදු කරනවාට විරුද්ධ කවුද කියලා ලංකාවේ මිනිස්සු දැනගන්න ඕනෑ. එතකොටයි සාධාරණත්වය තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම කවුරු හෝ කල් යවන්න හදන්නේ 16වැනි දායින් පසුව මොකක් හෝ වාසියක් ගන්න නම්,-

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

Sir, I rise to a point of Order.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

මොකක්ද ඒ point of Order එක? මෙගා පොලිස් එකක් ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

What is your point of Order, Hon. Member?

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු කථානායකතුමනි, එතුමා හොඳ යෝජනාවක් ගෙනාවේ. හැබැයි, එතුමා දැන් කථා කරන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වාගේයි. දැන් තිබෙන්නේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඇතුළේ ක්‍රීඩාවට හානි වුණා විතරක් නොවෙයි, බැඳුම්කර ගනුදෙනුවත් සිද්ධ වෙලා තිබෙනවා. ඒ සියලු දේ සම්බන්ධයෙන් කටයුතු කරන්න ආණ්ඩුවක් හිටියාට, විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් -[බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා කථා කරන්න.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
"දුකයි, දුකයි. එන්න, එන්න, ඇවිත් යන්න." එහෙම කියන්නද?

ගරු කථානායකතුමනි, මම පැහැදිලිව කිව්වේ, අපේ ආණ්ඩුව කරන්න ඕනෑ කටයුත්ත කරලා තිබෙන බවයි. ආණ්ඩුව අනුව ඉදිරිපත් කරන්න ඕනෑ දේ ඉදිරිපත් කර තිබෙනවා. හැබැයි, Quorum තිබුණු Sectoral Oversight Committee එකේ පාස් වෙච්ච පනත් කෙටුම්පත ඇයි පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණේ නැත්තේ? මම හිතනවා, අපේ ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාට මේක තේරුණේ නැතිව ඇති කියලා. මම කිව්වේ ඇයි මේ කෙටුම්පත පාර්ලිමේන්තුවේ අපේ වැඩ පිළිවෙළට ආවේ නැත්තේ කියන එකයි. ඒ නිසා අතිවිශේෂ කාරණයක් හැටියට හෝ සලකා මේ කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියන ඉල්ලීම තමයි මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ. Party Leaders' Meeting එකක් කැඳවලා හෝ ඒ දේ කරන්න. මෙතැනදී පාර්ලිමේන්තුවෙන් දරුණු වරදක් වෙලා තිබෙනවා. මේක එසේ මෙසේ වරදක් නොවෙයි. මේ කටයුතු මෙතැනින් නවත්වන්නත් බැහැ. ඒ නිසා එවැනි දෙයක් වෙලා තිබෙනවා නම්, අපට මේ කරුණ ඉදිරියේදී රටටත් කියන්න වෙනවා. අපි විශ්වාස කරනවා, පාර්ලිමේන්තුවත් බොරුවක් කරනවා කියලා. එතැනින් එහාට මට කියන්න දෙයක් නැහැ, ගරු කථානායකතුමනි.

මම සියලුදෙනාටම ස්තුතිවන්ත වෙනවා, මේ නියෝගවලට එකඟවීම ගැන. මම හිතනවා, රටේ ක්‍රීඩාව කොතැනින්ද කෙළෙසිලා තිබෙන්නේ කියලා මගෙන් පස්සේ කථා කරන මන්ත්‍රීවරුත් කරුණු කාරණා පෙන්වයි කියලා. කෙළෙසිලා තිබෙන තැන් ගැන දැන ගන්න කාට හෝ විවාදයක් කර ගන්න ඕනෑ නම්, අකුරෙන් අකුර, වචනයෙන් වචනය මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න පුළුවන්. අදින් පස්සේ මේ නියෝග නීතියක් බවට සම්මත වුණාම, ඒ වැරදි කරලා තිබෙන හොරුන්ට හිරේ යන්නත් වෙනවා කියන එකත් මතක් කරමින්, මට මේ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ගරු කථානායකතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමාගෙන් කාරුණිකව ආයාචනා කර ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් දැඩි තීරණයක් ගන්න කියලා. ඒ වාගේම, මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අදහස මොකක්ද කියලා පාර්ලිමේන්තුව දැනුවත් කරන්න කියන ඉල්ලීමත් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ පිළිබඳව අපි සොයා බැලුවා. හැබැයි, මේකේ අපි එදා Party Leaders' Meeting එකේදී මේක අරගෙන නැහැ. Party Leadersලා ඉඳ ගත්තාම මේ subject එක අරගෙන නැහැ. ඒකයි අද ඉදිරිපත් කර නැත්තේ. ඒක ගැන මම හොයලා බලන්නම්. ඒක නිසා මේක පාර්ලිමේන්තුව ඕනෑකමින් කළා කියන එක මම පිළිගන්නේ නැහැ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යාංශයේ ඉන්න රජයේ නිලධාරින්ට මේ සම්බන්ධව බොරුවක් කීමට අවශ්‍ය නැහැ. ඒ නිලධාරින් පාර්ලිමේන්තුවේ රාජ්‍ය නිලධාරින්ට අයත් කුටියේ ඉන්නවා. ඒ නිලධාරින් එක්ක සහභාගි වෙච්ච නිලධාරින් ඉන්නවා. පාර්ලිමේන්තුවේ Sectoral Oversight Committee එකේ වැඩ කරන කණ්ඩායමට කථා කරලා අපි ඇහුවා. එවැනි දෙයක් වෙලා තිබෙනවා. වරදක් වෙලා තිබෙනවා කියලා පිළිගත්තා. මම දන්නේ නැහැ, පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා ඒක පිළිගන්නේ නැද්ද කියලා. හැබැයි, මෙතැන වරදක් වෙලා තිබෙනවා කියලා පිළිගන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආණ්ඩුවේ වැඩ කටයුතු පෙළගැස්වීම ආණ්ඩුවේ වගකීමක් කියලා තමයි පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා කියන්නේ. ඒ නිසා අපි එක එක්කෙනාට බෝලේ පාස් කරන්නේ නැතිව සොයා බලන්න වෙයි.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, Sectoral Oversight Committee එකෙන් pass වුණාට පස්සේ කොහෙන් ඒක මේ විධියට වුණාද කියන එක ගැන ගැටලුවක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ ගැන හොයා බලමු.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මේ කාරණය රටට වැදගත් ප්‍රශ්නයක් හැටියට සලකා, පුළුවන්කමක් තිබෙනවා නම් කරුණාකරලා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න.

ගරු කථානායකතුමනි, පසුගිය කාලය පුරාම යමක් කරන කොට ඒවා කරන්න දෙන්නේ නැති ප්‍රශ්නයක් තිබුණා. අස්සෙන් ගහන, හංගන, වරද්දන, ඉස්පිලි පාපිලි වරද්දන, mix කරන ක්‍රමයක් තිබුණා. මේ කාරණය අද රටටම පැහැදිලියි. ඒ නිසා මේ ප්‍රශ්නය අපෙන් ඇති වුණාද, එහෙන් ඇති වුණාද, කොහෙන් කළාද කියලා අපි හොයන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ ගැන හොයමු.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, ඒ ඉල්ලීම කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்துவிடப்பட்டது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, හෙට රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා. දැනට එකඟ වෙලා තිබෙන්නේ අද රැස්වීම් පැවැත්වීමට පමණයි. එහෙම යෝජනාවක්

[ගරු ගරු කථානායකතුමා ]

තිබෙන නිසා අපි Party Leaders' Meeting එකක් පවත්වලා මොකක් හෝ තීරණයක් ගන්න වනවා, ගරු සභානායකතුමනි. මම ඒ ගැන අහලා බලන්නම්.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු සිවශක්ති ආනන්දන් මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා වෙනුවට මම කථා කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා, ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[පූ.භා.11.50]

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු කථානායකතුමනි, මේ වැදගත් කටයුත්තට අපි තමුන්නාන්සේට සහයෝගය ලබා දෙනවා. මොකද, ක්‍රීඩාවේ හොරු ඉන්නවා නම් ඔවුන් ඉවත් කරන්න අපි සම්පූර්ණ සහයෝගය දෙනවා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

නමුත් මෙහි ඉතිහාසය බලන්න ඕනෑ. ICC එකට මීට අවුරුදු 10කට, 15කට ඉස්සෙල්ලා මේ නීති තිබුණේ නැහැ. නමුත් මේ කටයුත්ත සිද්ධ වුණේ යම් යම් ආයතන match-fixing කරන්න පටන් ගත්තාමයි. ක්‍රීඩකයන් match-fixing කරන්න පටන් ගත්තා. ලංකාවෙන් පිටට ගිහිල්ලා ලෝකයේ ක්‍රීඩා තරගවලදී match-fixing කරන්න පටන් ගත්තා. ඒ කාලයේ match-fixing කරන කොට ICC එකේ නීතියක් තිබුණේ නැහැ. ඒක නවත්වන්න බැරි තැන ICC එක මේ දේ කළා. ඉන්දියාවේ මධ්‍යම පරීක්ෂණ කණ්ඩායම - CBI එක - ඒ කාලයේ ලෝකයේ ක්‍රීඩකයන් ගණනාවක්ම match-fixing කරනවා කියලා අල්ලා ගත්තා මට මතකයි. ලංකාවේ ක්‍රීඩකයන් දෙදෙනකුත් අල්ලා ගත්තා. අනික් රටවල නීතියක් නොතිබුණත් ඒ ක්‍රීඩකයන්ට දඬුවම් කරනවා. ඔවුන්ට ජීවිතාන්තය දක්වා දඬුවම් කළා. ලංකාවේ ක්‍රීඩකයන් දෙදෙනා සම්බන්ධයෙනුත් ඒ කාලයේ විභාගයක් පැවැත්වුවා. ඒ කාලයේ මම හිතන්නේ තිලංග සුමතිපාල මහත්මයා තමයි එහි සභාපතිතුමා හැටියට හිටියේ. මම මේ ගරු සභාවේ ඒ නම් කියන්න යන්නේ නැහැ. ඒ කාලයේ ඒ පිළිබඳව විභාග කරන්න අපේ නීතිඥවරයකු පත් කළා.

ඒ නීතිඥ මහත්මයා එම වාර්තාවෙන් මොකක්ද කිව්වේ? මෙය ICC එකේ සඳහන් වරදක් නොවන හින්දා දඬුවම් කරන්න බැහැ කිව්වා. ඊට පස්සේ, සිංගප්පූරුවේ ලෝක ක්‍රිකට් තරගයක් තිබුණා. ඒ තරගය තියනකොට අපි ලෝක කුසලානය දිනලායි තිබුණේ. සමහර ක්‍රීඩකයෝ ඒ ක්‍රිකට් තරගයට ගියේ නැහැ. ඒ පිළිබඳව අලාභ නඩුවක් පවරා තිබුණා. ඒ නඩුව ගැන මම කතා කරන්න යන්නේ නැහැ. මොකද, ඒ නඩුව සමථයක් වෙලා නැහැ, තවම උසාවියේ තිබෙන නිසා. මේ වාගේ ඉතාම නරක ඉතිහාසයක් Match-fixing පිළිබඳව තිබෙනවා. Match-fixing ගැන එක් එක් අවස්ථාවලදී ICC එක නීති රීති පැනෙව්වා. නීති රීති පැනෙවුවා පමණක් නොවෙයි, ලෝකයේ දක්ෂ ක්‍රීඩකයන්ට ඒ නීති රීති අනුව දඬුවම් කළා. එහි කිසි වැරැද්දක් නැහැ. අපේ රටේත් ඒ පිළිබඳ නීති රීති ගෙනෙනවා නම් අපට ප්‍රශ්නයක් නැහැ. අපි ඒකට සම්පූර්ණ සහයෝගය දෙනවා. නමුත්, ඒ සිද්ධිවලට අහු වෙච්ච අයම තමයි නීති ගැන දැන් වැඩියෙන් කතා කරන්නේ. ඒ කාරණා, ජාත්‍යන්තරයේ ලේඛනගත වූ ඒවා. ජාත්‍යන්තරයේ සටහන් වෙලා තිබෙන ඒවා, ඉතිහාසයටත් එකතු වී තිබෙන ඒවා. අද මෙච්චර දුර ඇවිල්ලා හෝ මේ වාගේ නීති රීති සම්මත කරනවා නම් අපි ඒවාට සම්පූර්ණයෙන් සහයෝගය දෙනවා. අද නීතියක් බවට පත් වෙලා තිබෙනවා, සූදු ක්‍රීඩාවේ සිටින අයට, එවැනි විවිධ කටයුතුවල යෙදෙන අයට ජාතික ක්‍රීඩා සංගම්වල තනතුරු දැරීම තහනම් කරනවා කියලා. අද තමුන්නාන්සේලා ඒක කරන එක ගැන අපි සතුටු වෙනවා. එහි කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත්, ඒවාට සම්බන්ධ වෙච්ච උදවිය ඒවා ගැන කතා කරන එකයි අපට ලජ්ජා. ඒවාට සම්බන්ධ වූ උදවිය ඒ ගැන කතා කරනවා.

ගරු කථානායකතුමනි, ක්‍රීඩා ඇමතිවරයකු හැටියට කටයුතු කරපු මමත් ඉතිහාසයේ ඔය ක්ෂේත්‍රයේ හුඟක් දේවල් දැක්කා. අපි හුඟක් දේවල් වෙනස් කරන්න උත්සාහ කළා. මේ නීති රීති හැදීම දැන් මේ රටේත් සිද්ධ වෙනවා, ICC එකත් ඒවා ගැන සොයා බලා කටයුතු කරගෙන යන මොහොතක. ඒ පිළිබඳ වාර්තා මා ළඟ තිබෙනවා. ඕනෑ නම් මම ඒවා තමුන්නාන්සේලාට දෙන්නම්. ජාත්‍යන්තරයේ ඒ වාර්තා තිබෙනවා. ජාත්‍යන්තරයේ මේ කාරණා සම්බන්ධයෙන් කරපු පරීක්ෂණවල වාර්තා තිබෙනවා. මා ඒවා පාර්ලිමේන්තුවට සමහර අවස්ථාවල ඉදිරිපත් කරලා තිබෙනවා. ඒවා මා හදපු ඒවා නොවෙයි, ජාත්‍යන්තරය හදපු වාර්තා. ඒ කරුණු, ජාත්‍යන්තරය සොයා ගත්ත කරුණු. ඒ වාර්තා අනුව, ලෝකයේ දක්ෂම ක්‍රීඩකයන්ට ක්‍රීඩා කිරීමේ අවස්ථාව ජීවිතාන්තය දක්වා තහනම් කරලා තිබෙනවා. අපේ රටේත් ක්‍රීඩකයෝ දෙදෙනෙක් ඒ අතර සිටියා. නමුත්, අපේ රටේ ක්‍රීඩකයන් දෙදෙනාට දඬුවම් කළේ නැහැ. දඬුවම් කළේ නැත්තේ ඇයි? මෙහේ නීතිඥ මහත්තුරු වාර්තාවක් සකස් කළා, එය ඒ වෙලාවේ නීතියෙන් දඬුවම් කළ යුතු වරදක් නොවෙයි කියලා. නමුත් වරද, වරදමයි. එදා කළත්, අද කළත්, අනාගතයේ කළත් වරද, වරදමයි. ඒ වරද පිරිසිදු කරන්න පුළුවන්කමක් නැහැ. මේවා ගැන ඉතිහාසයේ මේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ සිටි ජ්‍යෙෂ්ඨ උදවිය සියලුදෙනා දන්නවා; පැරණි ක්‍රීඩකයෝ දන්නවා; ක්‍රීඩා විශාරදයෝ දන්නවා. ඒ නිසා මේවා වහන්න පුළුවන්කමක් නැහැ. නමුත් අද හෝ අපි ඔක්කොම එකතු වෙලා ඒවා පිරිසිදු කරනවා නම්, ඒවා නිවැරදි කරනවා නම් අපි ඒක අගය කරනවා.

ගරු කථානායකතුමාට මම ගෞරව කරනවා. මොකද, ගරු කථානායකතුමා ඇත්ත තත්ත්වය මේ සභාවේ පැහැදිලි කළ නිසා. පාර්ලිමේන්තුවට පනතක් ගෙනෙනවා නම් ඒක පක්ෂ නායක රැස්වීමට ඉදිරිපත් කිරීම, සභානායකතුමාගේ යුතුකමක්. සභානායකතුමා දැන ගන්න ඕනෑ, එම පනත අද මෙම සභාවට ගෙනෙන්නේ නැත්තේ මොකද කියලා. එහෙම නැතුව අපි මෙතැන ඉන්න නිලධාරින්ට චෝදනා කරලා වැඩක් වෙන්නේ නැහැ. ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් වාර්තාවක් ඇවිල්ලා ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා නම්, ඒ ගැන විවාද කරනවා නම්, පාර්ලිමේන්තුවේ සම්ප්‍රදාය අනුව එය පක්ෂනායක රැස්වීමට දමලා, Order of Business එකට දමන්න ඕනෑ. ලේකම්තුමා කියන විධියට එම පනත් කෙටුම්පත Order of Business එකට දමලා නැහැ. එහෙමනම් සභානායකතුමා ඒකට වග කියන්න ඕනෑ. එහෙම නැතුව වක්‍රව කාටවත් චෝදනා කිරීමෙන් කිසිම වැඩක් වෙන්නේ නැහැ. තමුන්නාන්සේලාට ඒක හදිසියේ කරන්න ඕනෑ නම් ප්‍රශ්නයක් නැහැ, අපි උදව් කරන්නම්. නමුත් මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායට අනුව එන්න. කාටවත්

චෝදනා කරන්න එපා. තමුන්නාන්සේලා සභානායකතුමාගෙන් අහන්න, "ඒක මේ Order of Business එකට ඇතුළත් කළාද, නැද්ද, ඇතුළත් නොකළේ ඇයි" කියලා. පාර්ලිමේන්තුවේ Order of Business එක හදන එක ගැන නිලධාරි මහත්වරුන්ට තීරණය කරන්න බැහැ. පාර්ලිමේන්තුවේ Order of Business එක හදන යම්කිසි ක්‍රමයක් තිබෙනවා. ඒක ආණ්ඩුවේ Business එකක්. සභානායකතුමා දැන් මෙම සභාවට එනවා. සභානායකතුමාගෙන් අහන්න, මෙම පාර්ලිමේන්තු වාරයට ඉදිරිපත් කරන්න මෙම පනත ගෙනාවාද කියලා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම පැහැදිලි කිරීමක් කරන්නම්.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ඔව්. පැහැදිලි කිරීමක් කරන්න. මොකද, අපි දැන ගත්ත විධියට ලේකම්තුමා ගරු කථානායකතුමාට කියලා තිබෙනවා, පක්ෂනායක රැස්වීමට මේ යෝජනාව ගෙනාවේ නැහැ කියලා

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අගමැතිතුමා කිව්වා, ඔබතුමාගේ කැමැත්ත අනුව හෙට පාර්ලිමේන්තුව රැස් කරලා මෙම පනත ගෙනෙන්න කියලා.

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
අපි කැමැතියි.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
එහෙම නම් පක්ෂ නායක රැස්වීමක් කැඳවන්න. තමුන්නාන්සේලාට තනියම මේක කරන්න බැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නමුත් දෙසැම්බර් 3වැනි දාට පාර්ලිමේන්තුව රැස්වන විධියට Motion එකක් පාස් කරලා තිබෙනවා. නීත්‍යනුකූලව කොහොමද කරන්නේ?

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
හෙට පස්වරු 12.30ට පක්ෂනායක රැස්වීමක් තියෙනවා. ඒකට ඉදිරිපත් කරලා සාකච්ඡා කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද after lunch, අපි පක්ෂනායක රැස්වීමක් තියමු.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, හැකි ඉක්මනින් පක්ෂනායක රැස්වීමක් තියලා අපි හෙට මෙම පනත් කෙටුම්පත ගෙනෙමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් පක්ෂනායක රැස්වීමක් තියලා අපි ඒ තීරණය ගනිමු. නීති ප්‍රශ්නයක් තියෙනවා. මම ඒ ගැන හොයලා බලන්නම්.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
පක්ෂනායක රැස්වීමට ඉදිරිපත් කරලා තීන්දුවක් ගන්න. අපි ඒකට විරුද්ධ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
තමුන්නාන්සේලා විරුද්ධ නැත්නම් ප්‍රශ්නයක් නැහැ නේ.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
මම පක්ෂනායකයෙක් නොවෙයි නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි පස්වරු 12.30ට රැස් වෙමු.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
මෙතැන පක්ෂ නායකයන් ඉන්නවා. පාර්ලිමේන්තු සම්ප්‍රදායක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Then, we will discuss.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පස්වරු 12.30ට රැස් වෙලා අපි තීරණයක් ගනිමු.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
පස්වරු 12.30 ට රැස් වෙලා තීන්දුවක් ගන්න. සම්ප්‍රදායට අනුව යන්න. ඒක තමුන්නාන්සේලා තීන්දු කරන්න. මේක ආණ්ඩු පක්ෂයේ Business එකක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නමුත්, මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා, Motion එකක් පාස් කරලා තිබෙන නිසා. අපි කථා කරලා කරමු. නැවත පාර්ලිමේන්තුව රැස්වෙන්නේ දෙසැම්බර් 03වැනි දාට කියලා තමයි තිබෙන්නේ. අපි ඒ ගැන කථා කරමු.

හොඳයි, ගරු ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමනි, අපි ඒ ගැන කථා කරන්නම්.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

ගරු කථානායකතුමනි, මේ නීති ගෙනෙන එක වෙන්න ඕනෑ වැඩ. ඒක අපි පිළිගන්නවා. ක්‍රීඩාව දියුණු කරන්න ඕනෑ නම්, ක්‍රීඩාවේදී වංචා කරන අය, match-fixing කරන අය, ඒවාට සල්ලි ගන්න අය, බ්‍රෝකර් වැඩ කරන අය ගැන හෙළිවෙන්න ඕනෑ; ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න ඕනෑ. ඒ නිසා මේ නීති ගෙනෙනවාට අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. මේවා මීට කලින් වෙන්න තිබුණු වැඩ, මීට කලින් කරන්න තිබුණු වැඩ. ඒ වාර්තා සියල්ලම අවශ්‍ය නම් කමිටුවක් පත්කරන්න, අපි ඒ වාර්තා ඉදිරිපත් කරන්නම්. කවුද වැරැදි කළේ, කාටද දඬුවම් කළේ කියන සියල්ලම ජාත්‍යන්තර මණ්ඩලවල බොහොම පැහැදිලිව තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කිසි ප්‍රශ්නයක් නැහැ. අපි බොහොම සතුටු වෙනවා, මෙම නියෝග ඉදිරිපත් කිරීම ගැන. පුළුවන් නම් මේවා backdate කරන්න කියලා මා කියනවා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. එහෙම නම් අපි ප.ව. 12.30ට පක්ෂනායක රැස්වීමක් තියමු.

ඊළඟට ගරු අර්ජුන රණතුංග ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[පූ.භා.11.59]

**ගරු අර්ජුන රණතුංග මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Arjuna Ranatunga - Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා, විශේෂයෙන්ම ක්‍රීඩාවලට සම්බන්ධ වැරැදි වැළැක්වීම සඳහා නියෝග කිහිපයක් මෙම සභාවට ඉදිරිපත් කරන්න ගත්ත තීරණය ගැන. විශේෂයෙන්ම ක්‍රීඩාවේ යහපත වෙනුවෙන් සාධනීය නියෝග කිහිපයක් ගෙන ඒම සම්බන්ධයෙන් ක්‍රීඩා අමාත්‍යතුමාට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, ක්‍රීඩාවේ යෙදීමේදී තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිත කිරීමට එරෙහිව පනතක් ගෙනැවිත් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ වාගේම බුකිකරුවන් ක්‍රීඩාවෙන් ඉවත් කිරීමට නීති සම්පාදනය කිරීම සම්බන්ධව ඔබතුමාගෙන ඇති පියවර මා ඉතා අගය කරනවා.

ගරු කථානායකතුමනි, මෙම නියෝග තුළින් ක්‍රීඩා තරග පාවාදීම්, දූෂණ විරෝධී මෙහෙයවීම් සහ නීති විරෝධී ඔට්ටු ඇල්ලීම් වැළැක්වීම සඳහාද, ඒ වැරදි විමර්ශනය කිරීම සඳහාද විශේෂ විමර්ශන ඒකකයක් පත් කිරීම සහ ඒ සඳහා විධිවිධාන සැලැස්වීම සිදු කරනවා. මා පසුගිය කාලයේ මේ රටේ සියලු රාජ්‍ය නායකයන්ට මෙන්ම ක්‍රීඩා ඇමතිවරුන්ටත් ක්‍රීඩා විෂය ක්ෂේත්‍රයේ දූෂණය, නාස්තිය, නීති විරෝධී ක්‍රීඩා සම්බන්ධයෙන් කරුණු සහිතව පෙන්වා දුන්නා. නමුත් දූෂණය සහ අකර්මණ්‍ය තත්ත්වය වළක්වනවා වෙනුවට ඒ ගොල්ලෝ කළේ දූෂිතයන් ආරක්ෂා කිරීමයි.

විශේෂයෙන්ම ක්‍රිකට් ක්‍රීඩාවේ තරග පාවාදීම් සම්බන්ධ කථා වසර ගණනාවක සිට අපට අසන්නට ලැබෙනවා. මේවා සිදු වන්නේ ඒ සංගම් පාලනය කිරීමට පත් කරනු ලබන බුකිකරුවන්ගේ සහ මුදලාලිලාගේ මැදිහත් වීමෙන් බව කියන්න අවශ්‍යයි. අවසානයේ ඒ සඳහා ගොදුරු වෙන්නේ මේ රටේ ඉන්න ක්‍රීඩකයන්. 2015 වර්ෂයට පෙර මේ රටේ තිබුණේ අවාසනාවන්ත යුගයක්. නමුත් 2015දී අපි බලාපොරොත්තු වුණා, අපේ ආණ්ඩුවක් යටතේ ක්‍රීඩාව දියුණු වෙයි කියලා. නමුත් අවාසනාවකට වාගේ ඒ තත්ත්වයට යන්න අපට අවස්ථාවක් ලැබුණේ නැහැ. මා හිතන හැටියට විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා ජාතික ආණ්ඩුවක් හැදීම තුළින්, මැතිවරණයෙන් පැරදුණත් නැවතත් පාර්ලිමේන්තුවට පැමිණි පුද්ගලයන්ගේ බලතල මත මේ ක්‍රිකට් ක්‍රීඩාව විනාශ වෙන්න පටන් ගත්තා.

ගරු කථානායකතුමනි, ක්‍රිකට් ක්‍රීඩාවේ වර්තමානයේ සැබෑවටම සිදු වන්නේ, නුසුදුසු පුද්ගලයන් මෙන්ම බුකි ඔට්ටුකරුවන් අතට ක්‍රිකට් පරිපාලනය පත්වීමයි. ඔවුන්ට ක්‍රිකට් පරිපාලනයට පිවිසීම සඳහා අවස්ථාව ලබා දුන්නේ, මේ ආණ්ඩුවේ හිටපු ක්‍රීඩා ඇමතිවරු. බුකි සහ ඔට්ටුකරුවන් ක්‍රීඩා පරිපාලනයට පැමිණි අවස්ථා අවහිර කිරීමට ඕනෑ තරම් ප්‍රතිපාදන ක්‍රීඩා නීතියේ තිබෙනවා. නමුත් හිටපු ක්‍රීඩා ඇමතිවරු එම නීතිය ක්‍රියාත්මක නොකර නිහඬ ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබෙන්නේ, ඒ අයට ලැබුණු වාසිදායක තත්ත්වය නිසායි. මට මතකයි, හිටපු ක්‍රීඩා අමාත්‍ය දයාසිරි ජයසේකර මහතාගේ ප්‍රදේශයේ, හෙට්ටිපොළ ආසනයේ ක්‍රීඩාංගණයක් හදන්න 2017 වර්ෂයේ රුපියල් මිලියන 55ක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ඊට පසුව රුපියල් මිලියන 65ක් ලබා දීලා තිබෙනවා. ඒ අනුව රුපියල් මිලියන 120ක් ලබා දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, හෙට්ටිපොළ ක්‍රීඩා සමාජය කියන්නේ, ක්‍රිකට් ආයතනයේ සාමාජිකත්වයක්වත් නැති ක්‍රීඩා සමාජයක්. ඒකට සල්ලි දෙනවා කියන්නේ නිකම් අල්ලසක් දෙනවා වාගෙයි. ඒකෙන් පසුව මේ පුද්ගලයන්ට ක්‍රිකට් පරිපාලනයේ ඉන්න ඕනෑ තරම් අවසර දෙනවා. ක්‍රිකට් පරිපාලනය දූෂණ කරා ගමන් කරන්නේ, විශේෂයෙන්ම සූදුකාරයන් මේ ක්‍රිකට් ක්‍රීඩාවට සම්බන්ධ වීමත් සමඟයි. මෙන්න මේක වැදගත් දෙයක්. ක්‍රීඩා ඇමතිතුමනි, මම මේ කියන කාරණය ගැන ඔබතුමා පොඩ්ඩක් අවධානය යොමු කරන්න. 2015 වසරට පෙර ක්‍රීඩා නීතිය අනුව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ භාණ්ඩාගාරික තනතුරට පත් විය හැකිව තිබුණේ, වරලත් ගණකාධිකාරිවරයෙකුට පමණයි. නමුත් 2015 වසරින් පසුව ගිණුම් ලිපිකරුවෙකුට - accounts clerk කෙනෙකුට - වුවද එම තනතුර දැරිය හැකි වන ලෙස ක්‍රීඩා නීතිය වෙනස් කළා. ඒ අනුව "ශම්මි සිල්වා" කියලා කිසිම සුදුසුකමක් නැති භාණ්ඩාගාරික කෙනෙක් පත් කළා. ඒ හරහා තමයි අද ඉන්න සභාපතිවරයා මේ හොරකම් වැඩි ප්‍රමාණයක් සිදුකර තිබෙන්නේ. ගිණුම්කරණය පිළිබඳ වෘත්තීය සුදුසුකම් සහ වසර ගණනාවක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සේවය කරලා දීර්ඝ කාලීන පළපුරුද්දක් ඇති ප්‍රධාන මූල්‍ය කළමනාකාරිනිය සහ කළමනාකරුවන් දෙදෙනා ඉවත් කරලා, හිටපු සභාපතිතුමාගේ පුවත්පතේ හිටපු කෙනෙකුට මූල්‍ය කටයුතු භාර දුන්නා. ඒ හරහා තමයි වැඩි වශයෙන්ම මේ රටේ ක්‍රිකට් දූෂණ සිදු වුණේ.

වත්මන් ක්‍රීඩා ඇමතිතුමා අමාත්‍ය ධුරය භාර ගත් වෙලාවේ අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සලයේ නිලධාරින් හමු වුණා. ඒ අවස්ථාවේ අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සලයේ නිලධාරින් අපේ රටේ තරග පාවාදීම් ඇතුළත් වීඩියෝවක් එතුමාට පෙන්වපු බවත් ක්‍රීඩා ඇමතිතුමා කිව්වා. ක්‍රීඩා ඇමතිතුමනි, ඒ වීඩියෝව දැකලා ඔබතුමා හරියට කලකිරුණා විතරක් නොවෙයි, බය වුණා කියලාත් කිව්වා.

2016-2017 වර්ෂයේ අපි දැක්කා, සිම්බාබ්වේ ක්‍රිකට් තරගාවලිය. ශ්‍රී ලංකා පිළට ඒ තරගාවලිය ජයග්‍රහණය කරන්න සියයට 70ක විතර හැකියාවක් තිබුණා. සිම්බාබ්වේ කණ්ඩායමට

ජයග්‍රහණය කරන්න තිබුණේ, සියයට 30ක හැකියාවක් විතරයි. නමුත් මේ තිබෙන තත්ත්වයත් එක්ක සිම්බාබ්වේ කණ්ඩායම විශාල ජයග්‍රහණ ලබාගෙන තිබෙනවා. මේවායින් මුදල් උපයා තිබෙන්නේ සූදුකාරයෝ. Bettingවල දමලා තිබෙන විධියට මේ රටේ ඉන්න මිනිස්සු ගිහින් bet කරන්නේ ලංකාව දිනනවා කියලායි. මොකද, ලංකාවට දිනන්න තිබෙන හැකියාව සියයට 70ක් නිසා. මෙන්න මේවා තමයි අපි සොයාගෙන යන්න ඕනෑ. ඒ වාගේම මේ තරගාවලියේ දී අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සලයේ නිලධාරින් හම්බන්තොට සූරියවැව ක්‍රීඩාංගණයේ විවේකාගාරය පරීක්ෂා කළා. ඒ සම්බන්ධයෙන් අසංක ගුරුසිංහ විසින් ලබා දෙන ලද වාර්තාව ක්‍රිකට් ආයතනයෙන් ගෙනැල්ලා මේ සභාවේ සභාගත කරන්න කියලා ක්‍රීඩා ඇමතිතුමාට මා කියනවා.

ඒ වාගේම, 2018 ජනවාරි මාසයේ ශ්‍රී ලංකාව සහ සිම්බාබ්වේ අතර පැවැති තුන්කොන් ක්‍රිකට් තරගාවලියේ දී මෙවැනි තරග පාවාදීම් සහ සම්බන්ධවීම, ලැබුණු ආරාධනා සහ යෝජනා නිසි පරිදි බලධාරින්ට දන්වා නොසිටීම ප්‍රධාන කොටගෙන -ඒ තොරතුරු දුන්නේ නැහැ කියලා- ලොව අංක එකේ තුන් ඉරියව් ක්‍රිකට් ක්‍රීඩකයෙකු වන බංග්ලාදේශ ක්‍රිකට් කණ්ඩායමේ නායකයාට අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සලය විසින් වසර දෙකක තරග තහනමක් පනවා තිබෙනවා. ගරු කථානායකතුමනි, අද තරග පාවාදීම්, තරග දූෂණය, වංචාව, ක්‍රීඩා සමාජ දක්වා ඇවිල්ලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ලංකාවේ පළමුවන වතාවට ක්‍රීඩා සමාජ දෙකක් අතර තරග පාවාදීම සම්බන්ධයෙන් වන මේ වාර්තාව හැන්සාඩ්ගත කරන ලෙස මා ඉල්ලනවා. මේ අවාසනාවන්ත තත්ත්වය ඇති වුණේ, පානදුර සහ කළුතර ක්‍රීඩා සමාජ අතර පැවැති තරගයේ දී. එහිදී ඒ හිටපු උප ලේකම් -මම හිතන විධියට අද උප සභාපති- කෙනෙකුගේ මැදිහත් වීමෙන් තමයි ඒ තරග පාවාදීම් සිදු වෙලා තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් වන, පාලිත කුමාරසිංහ මහත්මයාගේ වාර්තාව මා **සභාගත*** කරනවා.

එම වාර්තාවේ තිබෙනවා, මේ පුද්ගලයා ඒකට සෘජුවම සම්බන්ධයි කියලා. ඒ වාගේම මම ඉස්සෙල්ලාත් කිව්වා, සනත් ජයසූරිය මහත්මයා මේ රටට විශාල කීර්තියක් ගෙනාපු ක්‍රීඩකයකු බව. අද වන විට ඔහුට අවුරුදු දෙකක ක්‍රීඩා තහනමක් පනවා තිබෙනවා. මේවා පිළිබඳව සොයන්න ඕනෑ. ඒ සඳහා තමයි ක්‍රීඩා ඇමතිතුමා විසින් මේ ක්‍රීඩා පනත යටතේ නියෝග ගෙනැල්ලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, නිවැරදි ලෙස කරුණු ලබා දුන්නේ නැහැයි කියලා තමයි සනත් ජයසූරිය මහත්මයාටත් ක්‍රීඩා තහනමක් පනවා තිබෙන්නේ. මේ වගේ දේවල් තමයි සිද්ධ වෙන්නේ. ඒ වාගේම නුවන් සොයිසාට, අවිෂ්ක ගුණවර්ධනට අද වන විට තරග පාවා දුන්නාය කියලා චෝදනා එල්ලා වෙලා තිබෙනවා. එම ක්‍රීඩකයන් දෙදෙනා පුහුණුකරුවන්. දැනට ක්‍රිකට් පරිපාලනයේ සිටින පුද්ගලයන් හරහා දැනට ඔවුන්ගේ පුහුණු කටයුතු නවත්වලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ වාගේම ඉතාම වැදගත් ලිපියක් වන අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලයෙන් ගරු ක්‍රීඩා ඇමතිතුමාට එවූ ලිපිය මම **සභාගත*** කරනවා.

ඒ සම්බන්ධයෙන් ඔබතුමා ක්‍රිකට් ආයතනයට යැවූ ලිපියක් තිබෙනවා. ඒ ලිපිය මටත් ලැබුණා. මේක ක්‍රීඩා ඇමතිතුමාට එවලා තිබෙන්නේ 2019 ඔක්තෝබර් 3වැනි දායි. ක්‍රීඩා ඇමතිතුමා එය 2019.09.09 වැනි දින ක්‍රිකට් පරිපාලනයට යොමු කරලා තිබෙනවා. හැමදෙනාම මේ වාර්තාව කියවන්න. තිලංග සුමතිපාල මහත්මයාත් මෙතැන ඉන්න එක හොඳයි. 1990 ගණන්වල ඉඳලා

---

***පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කොයි විධියටද ක්‍රීඩාවේ සූදුවලට සම්බන්ධවෙලා තිබෙන්නේ කියලා මෙම වාර්තාවේ තිබෙනවා. විශේෂයෙන්ම ඒ පුද්ගලයාගේ නමත් තිබෙනවා. ග්ලීන් පාමර් කියන පුද්ගලයාගේ නම තමයි මේ වාර්තාවේ තිබෙන්නේ. එම වාර්තාවල තිබෙනවා, මේ කරපු ක්‍රියාදාමයේ criminal charges ගැන. විශේෂයෙන්ම තරග පාවාදීම් ගැන.

ඒ වාගේම WorldTel ගනු දෙනුවක් ගැන කියනවා. ගරු කථානායකතුමනි, මේ පුද්ගලයා ඇමෙරිකානු ඩොලර් ලක්ෂයක මුදලක් අරගෙන තිබෙනවා කියලා සෘජුවම කියනවා.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, what is your point of Order?

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ගරු කථානායකතුමනි, මෙතුමා යම් වාර්තාවක් ප්‍රකාශයට පත් කරනවා. පළමුවැනි කාරණය තමයි, එවැනි වාර්තාවක් පිළිබඳව මම දැනුවත් නැහැ. දෙවැනි එක තමයි, එවැනි වාර්තාවක තිබුණා කියලා මගේ නම සඳහන් කරනවා. ඒ වාගේම එම වාර්තාව පිළිබඳව දැනුවත්කමක් නැතුව එහි තිබෙන කරුණු පිළිබඳව උත්තරයක් දෙන්න මට පුළුවන්කමක් නැහැ. ඒ වාගේම එතුමා මගේ නම සඳහන් කරනවා. මේ පිළිබඳව යම් කිසි පරීක්ෂණයක් කරනවා නම් ඒ පරීක්ෂණය කරන කෙනාට, එහෙම නැත්නම් ඒ අදාළ ආයතනයට මේ එකින් එකට උත්තර දෙන්න මට හැකියාවක් තිබෙනවා. නමුත්, දූෂණවලට සම්බන්ධ වෙලා දිගටම කටයුතු කරපු කෙනෙක් තමන්ගේ දූෂණ කටයුතු වසාගන්න පාර්ලිමේන්තුව පාවිච්චි කරනවා නම්, ඊට අවසර දෙන්න ඔබතුමාට පුළුවන් කියලා මම හිතන්නේ නැහැ. එම වාර්තාව නෛතික භාවයක් නැති වාර්තාවක්, එහෙම නැත්නම් බොරු වාර්තාවක් කියලා කවුරු හරි කියනවා නම්, ඒ ගැනත් කරුණු ඉදිරිපත් කරන්න ඕනෑ, නෛතික භාවයක් ඇතිවයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ගරු ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමාගේ ඉතිරි විනාඩි 5ක කාලය ඔබතුමාට දෙන්න කිව්වා. ඔබතුමාට ඒ අවස්ථාවේ දී පිළිතුරු දෙන්න පුළුවන් නේද?

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ගරු කථානායකතුමනි, මම මගේ කථාව කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඇමතිතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
නමුත්, මම මේ කථා කරන්නේ මන්ත්‍රීවරයකු විධියට මගේ වරප්‍රසාද පිළිබඳවයි. මගේ නම සඳහන් කරලා බොරු වාර්තාවක්

[ගරු තිලංග සුමතිපාල මහතා]

ඉදිරිපත් කරනවා නම්, එම වාර්තාවට නෛතික භාවයක් දෙන්න. කවුද ඒ වාර්තාව දුන්නේ, වාර්තාව කාගෙන්ද,-

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ගරු කථානායකතුමනි, මම වගකීමකින් කියන්නේ. මේක ලෝක ක්‍රිකට් කවුන්සිලයෙන් ගරු ක්‍රීඩා ඇමතිතුමාට ආපු ලියුම. ග්ලින් පාමර් කියන පුද්ගලයා එක්ක business කරලා තිබෙනවාද කියලායි මම එතුමාගෙන් අහන්නේ. එහෙම නැහැයි කියලා කියන්න එතුමාට පුළුවන්ද කියලායි මම අහන්නේ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

ඇත්ත වශයෙන්ම මට එවැනි ලිපියක් ආවා. පෞද්ගලිකව කාටවත් මඩ ගහන්න නොවෙයි මම මේක කළේ. ගරු කථානායකතුමනි, හැබැයි මගේ වපසරිය යටතේ මම ක්‍රිකට් ආයතනයේ දැන් සිටින සභාපතිවරයාගෙන් ඒ සම්බන්ධයෙන් කරුණු විමසුවා. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න කියලා කිව්වා. මේ ලියුම එළියට ගියේ කොහොමද කියලා ක්‍රිකට් ආයතනයෙන් තමයි හොයලා බලන්න ඕනෑ. මම කාටවත් මේ ලිපිය දුන්නේ නැහැ. මම ඒක යැව්වේ, ක්‍රිකට් ආයතනයට. ක්‍රිකට් ආයතනයෙන් සමහර මාධ්‍ය ආයතනවලටයි, රටේ ප්‍රශ්න ගැන කථා කරන මිනිසුන්ටයි මේ ලිපිය යවලා තිබෙනවා. අර්ජුන රණතුංග ඇමතිතුමාටත් එය යවලා තිබෙනවා. මා පෞද්ගලිකව වග කීමෙන් කියනවා, මම මේ ලිපිය යැව්වේ මට උත්තරයක් එවන්න කියලා ක්‍රිකට් ආයතනයට පමණක් බව. හැබැයි, මේ ලිපිය සත්‍යයක්. එවැනි ලිපියක් ආවා. ඒක මට මේ වෙලාවේ පිළිගන්න වෙනවා. එවැනි ලිපියක් ආවේ නැහැයි කිව්වොත් මම බොරුකාරයෙක් වෙනවා. මොකද, ඒක අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලයෙන් ආපු ලියුමක්. අනෙක් කාරණය මේකයි. "නීතිය සම්බන්ධයෙන් කටයුතු කරන අවස්ථාවල දී මෙම ලිපිය පාවිච්චි කරන්න" කියලා ඒකේ කියලා තිබෙනවා. ඒ නිසා තමයි මම ඒක සමාජයට මුදා හැරියේ නැත්තේ. යම් කිසි නීතිමය තත්ත්වයක් පැන නැඟුණොත් ඒක ඉදිරිපත් කරන්න කියලා තමයි එහෙන් දන්වා එවලා තිබුණේ. ඒක තමයි සත්‍යය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අර්ජුන රණතුංග ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න. ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාවේදී පිළිතුරු දෙන්න.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ගරු කථානායකතුමනි, මේවාට සාක්ෂි නැත්නම් ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයෙන් ක්‍රීඩා ඇමතිවරයකුට නිකම් ලියුම් එවන්නේ නැහැ. ග්ලින් පාමර් කියන පුද්ගලයාත් එක්ක තිබුණු සම්බන්ධකම මේ ලිපියේ තිබෙනවා. ඒ වාගේම, ඒ යවපු cheques සම්බන්ධ සියලු වාර්තා අද ක්‍රීඩා ඇමතිවරයාට එවා තිබෙනවා. මට මේ ලිපිය එවූ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ඒ මහත්මයාට මම ස්තුතිවන්ත වනවා. එහි සභාපතිතුමාටත් මම විශේෂයෙන් ස්තුතිවන්ත වනවා, මේ කාරණය එළියට දමපු එක ගැන. මේකේ criminal charges කියලා තිබෙනවා. ක්‍රීඩා ඇමතිතුමනි, මේ චෝදනාව සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන්න. ඒ සම්බන්ධයෙන් ඔබතුමාට විශාල වගකීමක් තිබෙනවා. අවුරුදු ගණනාවක් මම මේ ගැන කිව්වා. එතකොට මට හිනා වුණා. නමුත්, අද වනකොට එය ඔප්පු වෙලා තිබෙනවා. ඒ ලිපිය මම හැන්සාඩ්ගත කළා. මාධ්‍යයටත් මම එය ලබා දෙනවා. ඕනෑ කෙනෙකුට ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයෙන් අහන්න පුළුවන්, ඒ ලිපිය ඒ ගොල්ලෝ එවපු එකක්ද, නැද්ද කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු කථානායකතුමනි. අවශ්‍ය වුණොත් වෙලාව ලබා ගන්නම්.

ගරු ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමා කිව්වා, මට පසුගිය කාලයේ ක්‍රිකට් සම්බන්ධව චෝදනා තිබුණා කියලා. ගරු කථානායකතුමනි, මටයි, අරවින්ද ද සිල්වාටයි චෝදනාවක් ආවා. ඒ චෝදනාව සම්බන්ධයෙන් පරීක්ෂණයක් කළා. පරීක්ෂණයක් කරලා, අප නිදොස්කොට නිදහස් කළා. ඒක හැම දාම මේ පාර්ලිමේන්තුවේදී කරන මඩ ගැහිල්ලක්. මම තව දෙයක් මම කියන්නම්. 2008දී ක්‍රිකට් පරිපාලනයෙන් මා අයින් කරලා, WorldTel TV deal එකක් ගියා. ඒක කරනකොට ක්‍රිකට් පරිපාලනයේ හිටියේ ගාමිණී ලොකුගේ මැතිතුමාගේ ලේකම්තුමායි. අපට එම ඉන්දියානු සංචාරයෙන් හම්බ වුණේ ඩොලර් මිලියන 3ක් හෝ 4ක් පමණයි. නමුත්, ඊට ඉස්සෙල්ලා ඉන්දියානු සංචාරයෙන් ඩොලර් මිලියන 15ක් විතර අපට හම්බ වුණා. මම ඒ වාර්තා ටික සභාගත කරලා තිබෙනවා.

ගරු ක්‍රීඩා ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලනවා මේ ලිපිය නීතිය ඉදිරියට ගෙන යන්න කියලා. මොකද, මේක නිකම් ලිපියක් නොවන නිසා. මේ රටේ මහ ජනතාව අද තීරණය කරයි, ක්‍රිකට් ක්‍රීඩාව බේරන්න මම මෙච්චර කල් මොනවාද කළේ කියලා.

අද ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා, COPE වාර්තාව. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා, මේ විශේෂ විගණන වාර්තාව, COPE වාර්තාව අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ගැන.

ගරු කථානායකතුමනි, මම තවත් දෙයක් කිව යුතුයි. මේ ගැන අපේ ගරු මන්ත්‍රීවරු කීප දෙනෙකුම කථා කළා. මෙය මඩ ගැහීමක් නොවෙයි. ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයෙන් දූෂණ, වංචාවලට සෘජුවම සම්බන්ධ යැයි කියන පුද්ගලයා දැන් COPE කමිටුවට දමලා තිබෙනවා. මහින්ද රාජපක්ෂ මහත්මයා තමයි විපක්ෂයේ නායකතුමා. එතුමා තමයි ඒ නම යෝජනා කරලා තිබෙන්නේ. නැවත වරක් අපට අහන්න තිබෙන්නේ, දැන් හොරු අල්ලන්න හොරුන් දමන්න හදනවාද කියලායි. හොරු COPE එකට යන්නේ වෙන දෙයක් කරන්න නොවෙයි, වංචා, දූෂණ යට ගහන්නයි. සල්ලි යොදලා අවුරුදු ගණනක් මේවා යට ගහගෙන හිටියා. අපි සල්ලි තිබෙන අය නොවෙයි. අපට ඉන්නේ මිනිස්සු. ගරු කථානායකතුමනි, ඒක මට ඕනෑ තැනක ගිහින් කියන්න පුළුවන්. ඕනෑ තැනකින් ඡන්දය ඉල්ලුවාම මට දිනන්න පුළුවන්. මම ඒක පෙන්වලා තිබෙනවා. හැබැයි ඡන්ද බලයක් නැති අය තියාගෙන, ක්‍රිකට් ආයතනවලට සල්ලි ගෙව-ගෙවා, ඒ මිනිසුන් රට යව-යවා මොනවාද මේ කරන්නේ?

ගරු ක්‍රීඩා ඇමතිතුමනි, එංගලන්ත හා ඕස්ට්‍රේලියා සංචාරවලට කීදෙනෙක් ගියාද කියලා සොයා බලන්න. ඔබතුමාගේ අනුමැතිය නැතිවයි ඒ අය ගිහින් තිබෙන්නේ. ඒ, මේ රටේ මුදල්; මේ රටේ ක්‍රීඩාව හදන්න තිබුණු මුදල්. මේ රටේ හිටපු ක්‍රීඩා ඇමතිවරු සියලුදෙනාම ඒවාට වග කියන්න ඕනෑ. මේ රටේ මහ ජනතාවගෙන් මම ඉල්ලා සිටිනවා, ඊළඟ පාර්ලිමේන්තුවට නියෝජිතයන් එවනකොට හිටපු ක්‍රීඩා ඇමතිවරුන්ටත් දඬුවමක් දෙන විධියට කටයුතු කරන්න කියලා. දෙන්න පුළුවන් දඬුවම තමයි, ඒ අය එළියේ තියන එක. ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමනි, මේ පනත ගෙනෙන්න තමුන්නාන්සේට විතරයි කොන්දක් තිබුණේ. තමුන්නාන්සේට විතරයි මෙවැනි ලියුමක් එළියට ගන්න පුළුවන් වුණේ. මෙවැනි ලියුම් ක්‍රිකට් ආයතනයට ඇවිත් තිබෙනවා. හැබැයි ගරු කථානායකතුමනි, කවදාවත් මේවා එළියට ආවේ නැහැ. අඩු ගණනේ අවුරුදු හතරහමාරකට පස්සේවත් අපේ ආණ්ඩුව යටතේ මේවා එළියට ආපු එක ගැන මම අද සන්තෝෂ වනවා. මම 2001දී මේ පාර්ලිමේන්තුවට ආපු දවසේ ඉඳලා කියපු දේවල් ඇත්ත කියන එක මට මේ රටට ඔප්පු කරන්න පුළුවන් වුණා. එදා ඇති වෙන්න මට මඩ ගැහුවා. අපේ ආණ්ඩුවේ හැම දෙනාටම මඩ ගැහුවා. හැබැයි, අද වනකොට ඒ හැම දෙයක්ම ඔප්පු වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, හිටපු ක්‍රීඩා ඇමතිවරයෙක් අදත් කිව්වා, "ක්‍රීඩකයෝ දෙදෙනෙකුට චෝදනා තිබුණා" කියලා. මටයි, අරවින්ද ද සිල්වාටයි ඉන්දියාවේ ලක්නව් නගරයේ පැවැති තරගයක් සම්බන්ධව චෝදනාවක් තිබුණා. ඒක තමයි, "Arjuna and Aravinda agreed to underperform and De Silva was paid US Dollars 15,000" කියන චෝදනාව. ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා අපි දෙදෙනා නිදහස් කළා. ග්ලින් පාමර් කියන පුද්ගලයා අපි දන්නේ නැහැ. ඒ පුද්ගලයා කියා තිබෙනවා, මෙතුමාත් එක්ක business කළා කියලා. ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමනි, මම මේ කාරණය වග කීමෙන් යුතුව අහනවා. ග්ලින් පාමර් කියන පුද්ගලයා ඔබතුමා දන්නවාද, නැද්ද කියලා ඔබතුමාගේ කථාවේදී කියන්න; අවුරුදු ගණනක් තිස්සේ ඔහුට මුදල් ගෙව්වාද, නැද්ද කියලා කියන්න. ඔබතුමාත් දන්නවා ඇති නේ. හැබැයි, "මම හඳුනන්නේ නැහැ" කියයි. ඒක තමයි ලේසිම දේ.

ගරු කථානායකතුමනි, සල්ලි මාරු වුණු ඒවා ගැන විස්තර මෙම වාර්තාවේ තිබෙනවා. මම ඔබතුමාටත් මේ වාර්තාව ලබා දෙන්නම්. මේ මුදල් පරිහරණයේදී ක්‍රිකට් ආයතනය වෙන වෙනම accounts හදලා තිබෙනවා. පසුගිය කාලයේ මේ මුදල් පිටරටට ගියා; මේ හොරකම් සියල්ලම වුණා. මම ගරු ක්‍රීඩා ඇමතිතුමාට කියනවා, මේ ගැන අවධානය යොමු කරන්න කියලා. ඔබතුමා තහනම් කළාට පසුවත් මෙතුමා ක්‍රිකට් ආයතනයට ගිහිල්ලා ඉඳගන්නේ කොහොමද? අද ක්‍රිකට් ආයතනය ඔබතුමාගේ නියෝග අහන්නේ නැහැ. මම අදත් බය නැතිව කියනවා, ක්‍රිකට් ක්‍රීඩාව ආරක්ෂා කරන්න ඕනෑ නම්, වෙනම අතුරු පාලක කමිටුවක් පත් කරන්න කියලා. ඒකට අප පත් කරන්න එපා. අප පැත්තක තබන්න. අපි පැත්තකට වෙලා ඉන්නම්. අතුරු පාලක මණ්ඩලයක් පත් කරලා මේ ක්‍රිකට් ක්‍රීඩාව හදන්න. පසුගිය කාලයේ සිදුවුණු හොරකම් ටික එළි කරන්නම ඕනෑ. ඇත්තටම මම ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට සහ "කෝප්" එකට ස්තුතිවන්ත වෙනවා, අද මේ වාර්තාව ලබා දීම ගැන. මේකේ තිබෙනවා, අනෙක් දේවල්. මෙම වාර්තා මා ළඟත් තිබෙනවා, ගරු කථානායකතුමනි. මේ රටේ ක්‍රීඩාව තුළ සිදුවන හොරකම නවත්වන්න පුළුවන් ක්‍රමවේදයක් මේවා තුළින් දැන්වත් හදන්න. ක්‍රිකට් ක්‍රීඩකයෝ තමයි මේ වැරදිවලට විශාල වශයෙන් පැටලෙන්නේ.

ගරු කථානායකතුමනි, මම ඒ සඳහා උදාහරණයක් කියන්නම්. මම වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා හැටියට කටයුතු කළා නේ. ඒ ආයතනයේ ක්‍රිකට් කණ්ඩායමක් තිබෙනවා. මේ ක්‍රිකට් කණ්ඩායමේ හිටපු ක්‍රීඩකයෙක් -නායකයෙක්- වෙන ක්‍රීඩා සමාජයකට ගියා. ඔහු ඇවිල්ලා මට කිව්වා, "අනේ සර්, මම මේකට ගියොත්, මට ලංකාව වෙනුවෙන් ක්‍රීඩා කරන්න පුළුවන්" කියලා. ගරු කථානායකතුමනි, මාස තුනක් යන්න කලින් එම ක්‍රීඩකයා සංචාරයකට ගියා. ඔහු ගියේ CCC එකට. ඒක මෙතුමන්ලාගේ ක්‍රීඩා සමාජය. අද ක්‍රිකට් ගහන්නේ මේ විධියටයි. මෙන්න මේවා නවත්වන්නයි ඕනෑ. මේ නිසා ගමේ සිටින දරුවෙකුට අවස්ථාවක් නැහැ. අද විශාල වශයෙන් කට්ටිය පිටරට යනවා; පවුල් පිටින් යන්නේ. නමුත් ක්‍රීඩකයකුට කෑම එකක් දෙන්න බැහැ. ගමේ සිටින ක්‍රීඩකයන්ට, පාසල් ක්‍රිකට් පද්ධතියට සල්ලි දෙන එක නවත්වා තිබෙනවා. මේ විනාශය තමයි වෙලා තිබෙන්නේ.

ගරු ක්‍රීඩා ඇමතිතුමනි, මේ ගැන ඉදිරි කටයුතු ටික කරගෙන යන්න. ඔබතුමාට ඒ සම්බන්ධයෙන් විශාල වගකීමක් තිබෙනවා. "Criminal charges" කියලා මේ ලිපියේ තිබෙන්නේ. එය ඉංග්‍රීසි භාෂාවෙන් තිබෙන්නේ. ඕනෑ නම් මට මේක කියවන්න පුළුවන්. මම මේ ලිපිය සභාගත කළා. මා මෙය මාධ්‍යයටත් නිකුත් කරනවා.

මේ රටේ අධිකරණය ගැන අපට ලොකු විශ්වාසයක් තිබෙන නිසා, මේ වැරදි කරපු පුද්ගලයන්ට ඉදිරියේදී දඬුවම් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ විතරක් නොවෙයි, මේ මුදල් නැවත වරක් ලබා ගන්න කියලා මම ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි. මේවා, මේ රටට එන්න තිබෙන මුදල්. ඒවා පිට ගිහිල්ලා තිබෙනවා. ඒවායෙන් තමයි පසුගිය කාලයේ ඡන්ද වැඩ කළේ. ඒවා ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවට තිබෙන සල්ලි. මේ සිදු වෙන දේවල් නවත්වන්න. අද රටේ නීතිය හොඳින් ක්‍රියාත්මක වෙනවා. මම මේ රටේ සියලුදෙනාගෙන්ම ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා මේවා ගැන හොයන්න කියලා. විපක්ෂ නායකතුමා මේ ගරු සභාවේ හිටියා නම්, මම එතුමාට මේ ගැන කියනවා. එතුමා නැති නිසා මට කියන්න බැහැ. මෙතැන, වග කිවයුතු හිටපු ඇමතිවරුන් ඉන්නවා. මේ වාගේ criminal charges තිබෙන පුද්ගලයෙක් "කෝප්" එකට දමන්න පුළුවන්ද? මොකක්ද රටේ අපේ පාර්ලිමේන්තුවේ තත්ත්වය?

ගරු කථානායකතුමනි, මම දන්නවා, යෝජනාවක් ආවාම ඔබතුමාට මොකුත් කරන්න බැහැ කියලා. නමුත් කථානායකතුමා හැටියට මීට වඩා ඔබතුමා මේ ගැන බලන්න, මේ වාගේ පුද්ගලයන් එම කමිටුවට පත් කරන්න පුළුවන්ද කියලා. මම මේ වාර්තාවත් ඔබතුමාට දෙන්නම්. මේක කියෙව්වාම දැනගන්න පුළුවන්. Criminal charges තිබෙන පුද්ගලයකුට "කෝප්" එකේ තබා, පාර්ලිමේන්තුවේවත් ඉන්න පුළුවන් ද දන්නේ නැහැ. ඒ වාගේ කෙනෙකුට පාර්ලිමේන්තුවේ ඉන්න පුළුවන්ද ඇඳුමක් ඇඳගෙන?

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, කියන්න ගරු මන්ත්‍රීතුමනි.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
There is no criminal charge against anybody here. He is talking nonsense.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ආ! ඇත්තද?

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
How can you say there are criminal charges? You cannot imply criminal charges. What do you mean? These are reports. Sir, he is trying to extract and table those and take advantage of Parliamentary Privileges. There is no charge.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා. ගරු ක්‍රීඩා ඇමතිතුමනි, මේකේ මේ පුද්ගලයාගේ හඬ පට තිබෙනවා. ඔබතුමාට මේවා ගෙන්වා ගන්න පුළුවන්. දැන් අපි මෙහෙම කථා කරන එක හොඳයි නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බොහොම හොඳයි.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මේ හඬ පට ගෙන්වා ගන්න. ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමනි, ග්ලින් පාමර් කියන මිනිහා දන්නවාද, නැද්ද කියන එකත් ඔබතුමාගේ කථාවේදී කියන්න.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
මම දන්නවා.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
එච්චරයි. එතැනින් එහාට ඒ ගැන කථා කරලා වැඩක් නැහැ. ඔබතුමා ග්ලින් පාමර් ගැන දන්නවා; ඔහු සමඟ බිස්නස් කරලා තිබෙනවා. ඒ විස්තර ඔක්කෝම මේකේ තිබෙනවා. ඔබතුමා ඉස්සර වෙලා පිළිගන්න, සහෝදරයා, තාත්තා සූදු ව්‍යාපාරයේ යෙදිලා ඉන්නවා කියලා. ඔබතුමා කිව්වා "නැහැ" කියලා. ඔබතුමා තමයි මේ ව්‍යාපාරයේ ඉඳලා තිබෙන්නේ. ඔබතුමාගේ එහේ තිබෙන ආයතනයක අධ්‍යක්ෂවරයෙක් ඉන්නවා, ග්ලින් පාමර් එක්ක. මේ ඔක්කෝම ලිඛිතව තිබෙනවා. ICC එක කියන්නේ International Criminal Court එක නොවෙයි, International Cricket Council එක. International Cricket Council එකෙන් අසත්‍ය දෙයක් දෙන්නේ නැහැ, ක්‍රීඩා ඇමතිවරයාට. හිතන්න එපා, ICC එකේ ඉන්නේ ඔබතුමන්ලා වාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කරන පුද්ගලයන් කියලා. ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයෙන් එන මේ වාර්තාවට නඩු දමන්න පුළුවන්. මම වගකීමකින් කියනවා, ඔබතුමාට පුළුවන් නම් මේ වාර්තාවට විරුද්ධව නඩු දමන්න කියලා. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමනි, ඔබතුමා පිළිතුරු,- [බාධා කිරීමක්] ඔව්, කියන්න.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
මම හොරකමකට සම්බන්ධයි කියලා ඔප්පු කරන්න එතුමාට වෙනම තැනක් තිබෙනවා. මම කිසිම තැනක ශත පහක වංචාවක් කළාය කියන්න, මම හොරකමකට සම්බන්ධ වෙලා නැහැ. Match-fixing සඳහා ඇමෙරිකානු ඩොලර් 15,000ක් ගත්තාය කියලා මගේ ඉතිහාසයේ නැහැ. මම ශත පහක වංචාවකට සම්බන්ධ නැහැ. ඒ නිසා 'හොරකම' කියන වචනෙත් එක්ක ගැවෙන්න මට කිසිම හේතුවකුත් නැහැ, මට සම්බන්ධයකුත් නැහැ. මගේ අත පිරිසිදුයි. මගේ අතින් ශත පහක හොරකමක් කරලා නැහැ. ඒ ගැන ඒ කියන අයට ප්‍රශ්න ඇති. ඒ නිසා මා හොරකමට ගාවා ගන්න එපා.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ලෝක කුසලානයට පස්සේ, WorldTel කියන ආයතනයෙන් ඒ TV rights ගන්න ඩොලර් ලක්ෂයක් ගත්තා කියලා මේ වාර්තාවේ තිබෙනවා. මම මේක ඕනෑ නම් කියවන්නම්. ඩොලර් ලක්ෂයක්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

දුන්නා කියලා මේ වාර්තාවේ තිබෙනවා. මම මේක වගකීමකින් කියන දෙයක්. මම මේ කියන්නේ අසත්‍යයක් නම්, ඔබතුමාට මේ ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයෙන් - ICC එකෙන් - ආපු වාර්තාව දෙන්නම්; මේක ICC එකෙන් ආපු එකක්. මේක නිකම් වෙන සුමතිපාලලා, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ක්‍රීඩා ඇමතිතුමා මේ ගැන පරීක්ෂණයක් පවත්වනවා කිව්වා නේ. ක්‍රීඩා ඇමතිතුමා, ඔබතුමා පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, මේ ලිපිය සමාජයට ආපු නිසායි මම පැහැදිලිව ප්‍රකාශ කළේ මෙහෙම ලිපියක් ලැබුණා කියලා. පෞද්ගලික වශයෙන් ඒ ලිපිය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට යවපු එක විතරයි මම කළේ. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මේ සම්බන්ධයෙන් පරීක්ෂණය පටන් ගන්න කරුණු එවන්න කියලා මට කිව්වා. නමුත්, ගරු කථානායකතුමනි, මේ ලිපිය කොහොම හරි සමාජයට ගිහිල්ලා තිබෙනවා. ඒ ලිපිය ගැන තමයි අර්ජුන රණතුංග ඇමතිතුමා කියන්නේ.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ගරු කථානායකතුමනි, මම මේ ලිපියේ තියෙන එකක් කියවන්නම්. දැන් එතුමා කියනවා නේ, නැහැයි කියලා. -

[*Interruption.*] "Glyn Palmer claimed that in 1997 the TV rights for Sri Lanka Cricket (SLC) were sold to Mark Mascarenas (now deceased) and his company WorldTel Inc. Glyn Palmer claimed that a 100,000 USD bribe ....” මෙකේ සඳහන් වෙන්නේ, "bribe" කියලා, not a payment. එහි තවදුරටත් “ … was paid to

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

for these rights” යනුවෙන් සඳහන් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That part will have to be expunged.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මම මේ ලිපියේ තිබෙන කොටසක් තමයි කියවන්නේ. ගරු කථානායකතුමනි, මේ ලිපිය ICC ආයතනයෙන් ආපු ලිපියක්. දැන් එතුමා කියනවා නේ, නැහැ කියලා. දැන් එතුමා ඉදිරිපත් කළ චෝදනාව නිසා මම මේ ලිපියේ තිබෙන එක කියවන්න ඕනෑ. එහි වැඩි දුරටත් මෙසේ සඳහන් වෙනවා: “Glyn Palmer supplied a copy of a cheque for 50,000 USD from WorldTel to him and paying in slip along with his bank statement and a letter confirming the credit into his personal account with the Midland Bank..... Glyn Palmer says he facilitated this for

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මේ ලිපියේ තිබෙන කොටසක් තමයි මම කියෙව්වේ. මේකේ නැති එකක් කියවන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මම පාර්ලිමේන්තුවට ඇවිල්ලා අනෙක් පුද්ගලයන් වාගේ කවදාවත් කිසිම දෙයක් ගැන චෝදනා කරන්නේ නැහැ. මම මේ ලිපිය අතට හම්බ වනතුරු තමයි හිටියේ. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපතිතුමා වෙන්න ඇති මට මේ ලිපිය එවන්න ඇත්තේ. කවුරු නමුත්, මට මේක එවලා තිබෙනවා. අඩුම ගානේ අද උදේ මෙය හම්බ වුණු එක ගැන මම සතුටු වෙනවා. ඒ නිසා මට මේ ගැන අද කථා කරන්න පුළුවන් වුණා. ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමනි, ඔබතුමාට ක්‍රීඩා ඇමතිතුමාගෙන් අහන්න පුළුවන්, ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයෙන් ආවේ මේ ලියුම ද කියලා. ඒ ලිපියේ තිබෙන කාරණා අයින් කරන්න එපා. එම නිසායි මෙය හැන්සාඩ් ගත කරන්න ඕනෑ කියන්නේ. එහෙම නැතුව වෙන හේතුවක් නිසා නොවෙයි. ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ තිබෙන ලියුමක් තමයි මම කියෙව්වේ. එහෙම නැතිව, පුද්ගලයෙක් මට එවපු ලියුමක් නොවෙයි. මේක ක්‍රීඩා ඇමතිතුමාට එවපු ලිපියක්. මම හිතනවා මේ ලිපියේ තිබෙන දේවල් අනිවාර්යයෙන්ම කියවන්න ඕනෑ කියලා. නමුත් මට වේලාව නැති නිසා මේ ලිපිය කියවන්නේ නැහැ. ඒ චෝදනාව ඔප්පු කරන්න තමයි මම මේ ලිපිය කියෙව්වේ.

එතුමා චෝදනා කරපු දෙයටත් මම උත්තර දුන්නා. ගරු කථානායකතුමනි, මම මේ කාරණය කියලා කථාව නවත්වන්නම්. අපි අවුරුදු ගණනාවක් අපේ ලේ පුච්චාගෙන මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව හැදුවා. මම නායකත්වයට එන කොට ක්‍රිකට් ක්‍රීඩාව තිබුණේ කොහොමද කියන එක මේ රටේ ජනතාව දන්නවා. හැබැයි මම, අපට දක්ෂ කණ්ඩායමක් හදා ගෙන ලෝක කුසලානයක් දිනුවා. එහෙම දිනුවාට පස්සේ තමයි මේ ක්‍රීඩාවට සල්ලි ආවේ. ඊට පස්සේ තමයි මේ අනවශ්‍ය පුද්ගලයෝ මේවාට ආවේ. ආවේ හොරු. අද අපට චෝදනා කරනවා ඇමෙරිකානු ඩොලර් 15,000ක් ගැන. මේ චෝදනා සියල්ලම ගැන පරීක්ෂණ කරලා ඉවර කළා. ඡන්ද බලය නැති, පස්සෙන් ඇවිල්ලා හොරකම් කරන පුද්ගලයන්ට මේ ගරු සභාවට ඇවිල්ලා මෙහෙම කරන්න දෙන්න එපා, ගරු කථානායකතුමනි. අපි මේවා ගැන නීත්‍යනුකූලව ඉදිරියේදී වැඩ කර ගෙන යනවා. නමුත්, මම සාක්ෂි එක්ක මේ කරුණු ඔප්පු කරලා තිබෙන්නේ වෙන දෙයක් නිසා නොවෙයි. මේ ක්‍රීඩකයන්ට තිබෙන අවස්ථාව නැති කරන්න එපා. මේ තත්ත්වය නිසා අද අපේ රටේ ක්‍රීඩකයන් ඉතාම පහළ තත්ත්වයකට වැටිලා තිබෙනවා. මේ ගොල්ලන් බලපෑම් කරනවා, කරන්න ඕනෑ දේවල් ගැන. ඒ නිසා මේ ක්‍රීඩාව බේරලා දෙන්න. මේක අපි අමාරුවෙන් හදපු ක්‍රීඩාවක්. මම කියන්න කැමතියි, මෙම වාර්තාව මීට කලිනුත් සභාගත කළ බව.

ගරු කථානායකතුමනි, ඔබතුමාට ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, මේ විවාදයේ වැඩ කටයුතු අවසන් කිරීම සඳහා දිවා ආහාරයෙන් පසු අවශ්‍ය කාලය ලබා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා. සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දිවා භෝජනය සඳහා සභාවේ කටයුතු තාවකාලිකව අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30 ට නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා ] ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***
*அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.*
*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed,* DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] *in the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා.1.30]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ක්‍රීඩා අමාත්‍යතුමා විසින් අද ඉදිරිපත් කර තිබෙන මේ නියෝග පිළිබඳව

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

අදහස් දක්වද්දී, මූලික ප්‍රශ්නය ලෙස පැන නඟින්නේ ක්‍රීඩාව දේශපාලනීකරණය වීම කියන කාරණයයි. වැඩිහිටියන්, ළමයින්, කාන්තාවන්ගේ අයිතිවාසිකම් වැනි අනෙකුත් විෂයයන් ගත්තොත්, ඒ දේවල් මෙතරම් දේශපාලනීකරණය වෙලා නැත්තේ ඇයි? වැඩිහිටි ලේකම් කාර්යාලය තිබෙනවා; ළමා හා කාන්තා කාර්යාංශය තිබෙනවා; ආබාධිතයින් සඳහා වන මහ ලේකම් කාර්යාලය තිබෙනවා. කවුරුවත් ඒවා ගැන ලොකු තරගයක් නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත් ක්‍රීඩාවට මේ තරම් ඇල්මක්, උනන්දුවක් තිබෙන්නේ ඇයි? ඒකට හේතුව තමයි, දේශපාලනයයි, ක්‍රීඩාවයි, මුදලුයි සම්බන්ධවීම. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ - COPE එකේ- අපි වෙනත් විෂයයන් ගැන කථා කරනකොට කථා කරන්නේ රුපියල් සිය ගණනින් හා ලක්ෂ ගණනින්. වැඩිහිටියන්ට රුපියල් 2,000ක් වෙන් කරපු එකෙන් රුපියල් 100ක් කපා ගත්ත එක ගැන, ඒ වේදනාව ගැන තමයි අපි කථා කරන්නේ. සමහර ආයතන තිබෙනවා, ඒවාට වෙන් කළ මුළු මුදලම රුපියල් ලක්ෂ 100යි හෝ 200යි. හැබැයි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කැඳෙව්වාම, පාපන්දු සම්මේලනය කැඳෙව්වාම, ඒ ඒ ක්‍රීඩා සමාජ සම්බන්ධ වන ආයතන කැඳෙව්වාම කථා කරන්නේ ඩොලර්වලින්, යුරෝවලින්; මිලියනවලින්. අන්න එතැනයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. ඒ නිසා පළමු ස්ථාවරය විධියට ක්‍රීඩාව දේශපාලනයෙන් අයින් වෙන්න ඕනෑ; දේශපාලනය ක්‍රීඩාවෙන් නිදහස් වෙන්න ඕනෑ. ඒ අර්ථයෙන් ගත්තාම, මේ ඉදිරිපත් කර තිබෙන සංශෝධනවලට අපි සහාය පළ කරනවා. මොකද, නිර්දේශපාලනීකරණය පැත්තෙන් හිතුවාම, මේක සාධනීය අවස්ථාවක් වන නිසා.

ක්‍රීඩා ක්ෂේත්‍රයේ ඇති වෙලා තිබෙන අර්බුදයේදී, විශේෂයෙන්ම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පිළිබඳව විගණකාධිපතිතුමා සහ විගණකාධිපතිතුමාගේ නිලධාරින් ඉතාම මහන්සියෙන් හදපු විශේෂ විගණන වාර්තාව අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මේ වාර්තාව මාධ්‍යයේ අවධානයට යොමු කළ යුතුයි කියා මා හිතනවා. එහි පිටු 643ක් සහ ඇමුණුම් වශයෙන් පිටු 1,597ක් තිබෙනවා. ඒ මුළු ගණන වශයෙන් මේ වාර්තාවේ පිටු 2,240ක් තිබෙනවා. මේ වාර්තාව හොඳින් පරිශීලනය කළොත්, ක්‍රීඩාවෙයි, දේශපාලනයෙයි තිබෙන බැඳීම මොකක්ද කියලා හොඳට තේරෙනවා. ඒකත් එක්ක තමයි මේ නීතිමය තත්ත්වය වලංගු වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක නිසා තමයි මම දිගින් දිගටම කියන්නේ, පාර්ලිමේන්තුවට තිබෙන බලතල අනුව COPE එකට නීතිපතිතුමාගේ නිලධාරින් කැඳවන්න, ශ්‍රේෂ්ඨාධිකරණ නිලධාරින් කැඳවන්න, ඔවුන් ඇසින් දුටු සාක්ෂිකරුවන් බවට පත් කරන්න කියලා. කමිටුව මාධ්‍යයට විවෘත කළා වාගේම ඔවුන් කමිටුවට කැඳවන්න කියලා ඉල්ලන්නේ. ඊට පස්සේ ඒ සාක්ෂි හොඳ නම්, චූදිතයෝ ඇත්ත නම්, චූදිතයෝ වරද පිළිගන්නවා නම් නඩු දමන්න. එහෙම නැතුව, FCID එකට යනවා ද, අල්ලස් කොමිසමට යනවා ද, අර පැමිණිලි ද, මේ පැමිණිලි ද, සාක්ෂිකාරයෝ අතුරුදහන් වෙනවා ද, ඔවුන් රට යනවා ද, ඔවුන්ගේ පාස්පෝට් අත් හිටුවනවා ද වැනි දේ කරමින් වටේ යන්න ඕනෑ නැහැ. ඒ වැරදි සඳහා මූලික පියවර පාර්ලිමේන්තුවට ගන්න පුළුවන්. විශේෂයෙන්ම පාර්ලිමේන්තුව ජනතාවට වග කියන ආයතනයක් බවට පත් වෙනවා නම්, ඒ වග කියන ආයතනයක් බවට පත් වෙන්න තිබෙන්නේ මේ Chamber එකෙන් විතරක් නොවෙයි, මේ කාරක සභාවල තිබෙන බලය ශක්තිමත් විධියට පාවිච්චි කරලායි.

මම එහෙම කියන්න හේතුවක් තිබෙනවා. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ හිටපු සභාපතිතුමා හැටියට කටයුතු කළ තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා නියෝජ්‍ය කථානායකවරයා හැටියට සිටි කාලයේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කැඳවපු වෙලාවේ පාර්ලිමේන්තුවේ COPE එකට එතුමා පැමිණියා. මම ඒ ගැන එතුමාට ගරු කරනවා. මම එදාත් එතුමාට කිව්වා, "Chamber එකේදී මම ඔබතුමාට නියෝජ්‍ය කථානායකවරයා හැටියට සලකනවා වාගේම, මේ කාරක සභාවේදී සලකන්නේ ක්‍රිකට් ආයතනයේ සභාපතිවරයා හැටියට" කියලා. එතැනදී විමර්ශනය කළ කාරණාවලදී අපි දැක්කා, "Cricket Aid" කියලා ආයතනයක් හදලා තිබුණු බව. ඒ Cricket Aid ආයතනයේ සාමාජිකයන්ගේ තනතුරුවල සුදුසුකම් ලෙස තිබුණේ, "ව්‍යාපාරික, පාර්ලිමේන්තු මන්ත්‍රී" ඒ ආදී වශයෙන්. ඔවුන්ට යාවජීව සාමාජිකත්වයක් - lifetime membership එකක් - දීලා තිබුණා. Articles හදලා තිබුණේ, සාමාජික ව්‍යවස්ථාවලිය සමාගම් රෙජිස්ට්‍රාර්ට යවා තිබුණේ "යාවජීව සාමාජික" කියලා. ඒ කියන්නේ "මැරෙනකල් සාමාජික". හැබැයි, ක්‍රිකට් ආයතනයට තිබෙන කාලය අවුරුදු හතරයි, නැත්නම් පහයි. එතකොට අපට සිද්ධ වුණා, ඒ articles වෙනස් කරන්න. ඒවා වෙනස් කරලා, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් මුදල් යොදවලා තිබෙනවා නම්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය යටතේ නම් ඒ ආයතනය හදලා තිබෙන්නේ, ඔවුන් මැරෙනකල් සාමාජිකයන් වශයෙන් තියන්න බැහැ කියලා නිර්දේශයක් නිකුත් කරන්න. ඒවා නියමානුකූලව කරන්න සිද්ධ වෙනවා. එතකොට ක්‍රිකට් ක්‍රීඩකයෝ matchesවලට ගියාට පස්සේ, වකුගඩු රෝගීන්ට ආධාර පිණිස කියලා සල්ලි එකතු කරනවා. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ හිටපු අර්ජුන රණතුංග මහත්තයා ක්‍රිකට් ගහද්දී හෝ සංගක්කාර මහත්තයා ක්‍රිකට් ගහද්දී හෝ දැන් ඉන්න වෙනත් කවුරු හෝ ක්‍රිකට් ගහද්දී ප්‍රේක්ෂකයන්ට ගිහින් කිව්වා නම් "මේ tickets විකුණන්නේ අපේ රටේ වකුගඩු රෝගීන් වෙනුවෙන්" කියලා, කවුරුත් ඒවා ගන්නවා. Lord's Cricket Ground එකේ ඉඳන් tickets විකිණුවත් tickets ගන්නවා. එකතු කරපු සල්ලිවලට මොකද කළේ, මොන වකුගඩු රෝගීන්ටද දීලා තිබෙන්නේ, මොන නිදන්ගත රෝගය සුව කරන්න ද දීලා තිබෙන්නේ කියලා හොයන්න ඕනෑ. අද සම්මත කරන මේ නියෝගවලින් විගණකාධිපතිවරයාගේ බලය ශක්තිමත් කරන්න; විගණකාධිපති වාර්තා ශක්තිමත් කරන්න. ක්‍රීඩා සංගම්වල සුදුසුකම් තිබෙන අය කොහේද ඉන්නේ, කවුද ඒ අය, මොකක්ද ඒ අය කරන්නේ කියලා හොයන්න විගණකාධිපතිට බලය තිබෙන්න ඕනෑ, පාර්ලිමේන්තුවට බලය තිබෙන්න ඕනෑ. ඒ බලය ශක්තිමත් කරන්න ඕනෑ. සමහර සංගම් තිබෙනවා, එකම කණ්ඩායමක් තමයි ඉන්නේ. එකම කණ්ඩායමක් තමයි සංගම්ල සාමාජිකයන් විධියට ඉන්නේ. නිලවරණයට එන්නේ ඒ ගොල්ලන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසන් කරන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ අවධානය මේ කෙරෙහි යොමු කරවනවා.

දැඩි දුෂ්කරතා යටතේ මෙම වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විගණකාධිපතිතුමාගේ නිලධාරින්ට ස්තුති කරන්න ඕනෑ. විගණකාධිපති කාර්යාලයේ ලොකු කාර්ය මණ්ඩලයක් නැහැ. අද ජාතික විගණන කොමිසමට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි සේවා ව්‍යවස්ථාව තවමත් සම්මත කර නොතිබීම. අද ඔවුන්ට අවශ්‍ය කරන නිලධාරින් බඳවා ගන්න

බැහැ, තාක්ෂණ නිලධාරින් බඳවා ගන්න බැහැ, මේ විෂය පථය දන්නා අය බඳවා ගන්න බැහැ. ඒ විධියේ ගැටලු තිබෙද්දීත් මේ වාගේ වාර්තාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මම ඒ අයට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම මේ ස්ථාවරය ගැන කියන්නේ ශ්‍රී ලංකාවේ ක්‍රිකට්වලින් ලැබෙන අනුග්‍රාහක මුදල්වලින්; sponsorship එකෙන්. ලංකාවේ ක්‍රිකට් විතරක් නොවෙයි අනෙක් ඔක්කෝම ක්‍රීඩා දියුණු කරන්න පුළුවන්. ලංකාවේ ක්‍රිකට් කණ්ඩායමට සෑම වතාවකදීම Cricket World Cup එක ගෙනෙන්න පුළුවන් ඒ මුදල් ක්‍රිකට්වලට පමණක් වියදම් කළොත්. හැබැයි, ක්‍රිකට්වලට එහා වෙනත් ගැහිලි ගැහුවොත් ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවත් ඉවරයි, අනෙකුත් ක්‍රීඩාත් ඉවරයි. ඒ නිසා පාර්ලිමේන්තුවට තිබෙන මේ බලය නිවැරදිව පාවිච්චි කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තිලංග සුමතිපාල මහතා ගැන මම අවසාන වශයෙන් දෙයක් කියන්න ඕනෑ. මොකද, මේ ගැන සංවාදයක් මතු වූ නිසා. එතුමා COPE කමිටුවේ සාමාජිකයකු ලෙස පත් කිරීම ගැන මට කියන්න තිබෙන්නේ, ඒක ඒ කමිටුවට එතුමා පත් කරපු නායකයන්ගේ ප්‍රශ්නයක් කියලායි. දැන් එතුමාට අයිතියක් තිබෙනවා, එතුමා ඒ කමිටුවේ කටයුතු කරන්නේ කොහොමද කියන එක තීරණය කරන්න. අර්ජුන මහේන්ද්‍රන් මහත්තයා මහ බැංකු අධිපතිවරයා ලෙස කටයුතු කරන වෙලාවේ මාධ්‍ය සාකච්ඡාවක් පවත්වලා මම මුලින්ම කියපු දේ තමයි, "අර්ජුන මහේන්ද්‍රන් අධිපති කරපු එක අගමැතිතුමාගේ කටයුත්තක් වෙන්න පුළුවන්. හැබැයි, මේ පරීක්ෂණයට සාධාරණය ඉෂ්ට කරන්න එතුමා ඉවත් වෙන එක එතුමාගේ සදාචාරයක්" කියන එක. ඒකම තමයි මම කියන්නේ, ගරු තිලංග සුමතිපාල මැතිතුමා පත් කරපු එක විපක්ෂනායකතුමාගේ සදාචාරය වෙන්න පුළුවන්. නමුත් තිලංග සුමතිපාල මහත්මයා විත්තිකාරයාගෙයි, විනිශ්චයකාරයාගෙයි කියන දෙදෙනාගේම කාර්ය භාරය කරනවාද නැද්ද කියන එක තීරණය කිරීම එතුමාගේ කාර්ය භාරයක් බව තමයි කියන්න තිබෙන්නේ. ඒ කමිටුවේ සභාපති හැටියට මට ඕනෑ කෙනෙක් එක්ක වැඩ කරන්න පුළුවන්. මම වැඩ කරන්නේ මගේ විෂය පථය අනුව මිස, එතැනදී මම ඇස්දෙක ඇරලා බලන්නේ නැහැ මොන පැත්තෙන් ආවාද, කවුරු ආවාද කියලා. මම කවුරු එක්කත් වැඩ කරන ක්‍රමයක් තිබෙනවා. මට ඒ ගැන ගැටලුවක් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Sivasakthi Ananthan. You have five minutes.

[பி.ப. 1.38]

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய இந்த விவாதத்திலே சில கருத்துக்களை முன்வைப்பதற்கு எனக்கும் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி கூறிக்கொள்வதுடன், வடக்கு மாகாணத்திலே, வன்னி தேர்தல் மாவட்டத்திலுள்ள குறைபாடுகள் மற்றும் தேவைகள் பற்றிச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். குறிப்பாக, 'கிரீடா சக்தி' வேலைத் திட்டத்தின்கீழ் வழங்கப்படும் நிதியுதவி கடந்த 4 வருடங்களாக வவுனியா மாவட்டத்திற்கு ஒதுக்கப்படவில்லை; அங்கிருக் கின்ற 200 இற்கும் மேற்பட்ட இளைஞர்களுக்கு அது வழங்கப்படவில்லையென்பதை அந்த மாவட்டத்திலுள்ள விளையாட்டு வீரர்களும் உத்தியோகத்தர்களும் தெரிவித்திருக் கிறார்கள். ஒரு விளையாட்டு வீரருக்கு மாதத்திற்கு 1,500 ரூபாய் வீதமும் ஒரு விளையாட்டுப் பயிற்றுவிப்பாளருக்கு 7,500 ரூபாய் வீதமும் வழங்கப்படும் இந்த நிதி ஏனைய அனைத்து மாவட்டங்களுக்கும் ஒதுக்கப்படுகின்றது. வவுனியா மாவட்டத்திற்கு மட்டும் கடந்த 4 வருட காலமாக இந்த நிதி ஒதுக்கப்படவில்லை. அந்த நிதியை ஒதுக்கித் தரும்படி வவுனியா மாவட்டத்தில் இருக்கக்கூடிய விளையாட்டு வீரர்கள், விளையாட்டுப் பயிற்றுவிப்பாளர்கள் மற்றும் உத்தியோகத்தர்கள் கேட்டிருக் கின்றார்கள். இந்த நிதியானது விளையாட்டு வீரர்களுக்கும் பயிற்றுவிப்பாளர்களுக்கும் போஷாக்கான உணவு வழங்கு கின்ற விடயங்களுக்காக ஒதுக்கப்படுகின்ற ஓர் அடிப்படை நிதியாகும். எனவே, ஏனைய மாவட்டங்களுக்கு வழங்கப் படுவதுபோல் வவுனியா மாவட்டத்திற்கும் இந்நிதியை வழங்கும்படி அவர்கள் கேட்டிருக்கிறார்கள்.

வவுனியா மாவட்டத்தின் ஓமந்தையிலே மாவட்ட விளையாட்டு அரங்கொன்று அமைக்கப்பட்டு வருகின்றது. ஆனால், நிதி இல்லாத காரணத்தினால் அந்தப் பணிகள் அரைகுறையான நிலையில் தற்சமயம் இடைநிறுத்தப்பட்டிருக் கின்றன. இதேமாதிரி கிளிநொச்சி, மன்னார் போன்ற மாவட்டங்களிலும் இதற்காக ஒதுக்கப்பட்ட நிதிகள் கிடைக்காமையினால், அங்கும் குறித்த பணிகள் இடைநிறுத்தப்பட்டிருக்கின்றன. இதனால், ஒப்பந்தகாரர்கள் அந்தப் பணிகளை முடித்துக்கொள்ள முடியாமல் இருக்கின் றார்கள். ஓமந்தை விளையாட்டரங்கிற்காக ஒதுக்கப்பட்ட முழுமையான நிதியை விடுவிக்கின்றபட்சத் தில்தான் அந்த வேலைகளைப் பூர்த்திசெய்ய முடியுமென்று அதற்குப் பொறுப்பானவர்கள் தெரிவிக்கின்றார்கள். அதேமாதிரி, அனைத்து மாவட்டங்களுக்கும் உள்ளக விளையாட்டரங்கு தேவையென்பதைக் குறிப்பிட விரும்புகின்றேன். வடக்கு மாகாணமாக இருக்கலாம், கிழக்கு மாகாணமாக இருக்கலாம், இந்த உள்ளக விளையாட்டரங்கின் ஊடாகப் பல்வேறுபட்ட விளையாட்டுக்களில் அங்குள்ள விளையாட்டு வீரர்களை ஊக்குவிக்க முடியும். தேசிய மட்டத்திலே அனைத்துப் போட்டிகளிலும் தமிழ் இளைஞர்கள் பங்குபற்றுவதற்கான வாய்ப்புக்கள் வழங்கப்பட வேண்டும். அதேமாதிரி, விளையாட்டுப் பயிற்றுவிப்பாளர்களைச் சர்வதேச தரத்திற்கு உயர்த்துவதற்கு அவர்களுக்கான வெளிநாட்டுப் பயிற்சிநெறி களை வழங்குவதற்குரிய நடவடிக் கைகளை எடுக்கவேண்டும்.

மேலும், சுகததாச விளையாட்டரங்குபோல் செயற்கைத் தரை ஓடுகளமுள்ள விளையாட்டரங்கொன்றை ஒவ்வொரு மாகாணத்திலும் அமைப்பது அவசிய தேவையாக இருக்கின்றது. எங்களுடைய வடக்கு, கிழக்கு மாகாணங்கள் நீண்டகாலமாகப் போரைச் சந்தித்த மாகாணங்கள் என்ற வகையிலே, அங்கேயிருக்கின்ற இளைஞர், யுவதிகளுடைய விளையாட்டை ஊக்குவிப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். அரசாங்கம் தென்பகுதியிலே இருக்கின்ற பாடசாலைகளிலும் சரி, பாடசாலைகளுக்கு வெளியேயும் சரி, பல்வேறுபட்ட விளையாட்டு வீரர்களை ஊக்குவிப்பதற்காகப் பாரியளவிலான நிதியினை ஒதுக்குகின்றது. அதேமாதிரி வடக்கிலும் கிழக்கிலுமுள்ள விளையாட்டு வீரர்களை ஊக்குவிப்பதற்கு நிதி வசதி மற்றும் வெளிநாட்டுப் பயிற்சிகள் போன்ற பல்வேறுபட்ட விடயங்களையும் மேற்கொள்வதில் அரசாங்கம் கவனமெடுத்துச் செயற்பட வேண்டுமென்று இந்த நேரத்திலே கேட்டுக் கொள்கின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු තිලංග සුමතිපාල මැතිතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා.1.43]

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම විවාදයට සම්බන්ධ වීමට අවස්ථාවක් ලැබීම ගැන ප්‍රථමයෙන්ම මා සන්තෝෂ වෙනවා. අද දිගින් දිගටම මා ඉලක්ක කරගනිමින් මගේ නම සඳහන් කළා. මේ නියෝග ගෙන ඒම පිළිබඳව මට පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. ව්‍යාපාරවලට තිබෙන මගේ සම්බන්ධතාව සහ පවුලේ අයගේ සම්බන්ධතාව ගැන මම මේ පාර්ලිමේන්තුවේ දිගටම ප්‍රකාශ කරලා තිබෙනවා. මම පෞද්ගලිකවම ඒ ගැන මගේ ස්ථාවරය දිගටම කියලා තිබෙනවා. ඒ නිසා මේ ගෙනෙන නියෝග පිළිබඳව මට ගැටලුවක් නැහැ. ඊට වඩා අද ගෙනෙන්න හිටියාය කියපු Bill එක -නීතිමය තත්ත්ව ඇති කිරීමට කටයුතු කරන්න ගෙන එනවාය කියපු පනත් කෙටුම්පත- ගෙනාවා නම් හොඳයි. ඒකටත් අපට සහයෝගය දෙන්න පුළුවන්. ක්‍රීඩාවේ උන්නතිය සඳහා නීතියක් ගෙනෙනවා නම් හොඳයි. වැරැදි කරනවා නම්, වංචා වැඩ කරනවා නම් නීතිය ක්‍රිකට්වලට පමණක් නොවෙයි සියලු ක්‍රීඩාවලට වලංගු විය යුතුයි.

අද සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා කිව්වා, එතුමා සභාපතිත්වය දරන COPE එකට ගෙන්වන ආයතන 487ක් තිබෙනවා කියලා. මා COPE කමිටුවට සාමාජිකයකු වශයෙන් පත් කිරීම පිළිබඳව එතුමා කථා කළා. මම පුදුම වෙනවා, සාරධර්ම ගැන කථා කරන, සදාචාරය ගැන කථා කරන ජේවීපී එක ගැන. මම එතැනින් එහාට ජේවීපී එකේ සදාචාරය ගැන, සාරධර්ම ගැන බලන්න යන්නේ නැහැ. COPE එකට ගෙන්වන ආයතන 487ක් තිබෙනවා. එයින් එකක් විතරයි ක්‍රිකට් ආයතනය කියන්නේ. මට පෞද්ගලිකව චෝදනාවක් ඒ ආයතනයේ කිසිම වාර්තාවක නැහැ. මම කොළඹ විශ්වවිද්‍යාලයෙන් Public Administration සඳහා මගේ ශාස්ත්‍රපති උපාධියත්, පශ්චාත් උපාධියත් ලබා ගත්තා. Public Service එකේ කොහොමද වැඩ කරන්නේ කියලා මම දන්නවා. මට ඒ කරපු චෝදනාව ගැන මම කනගාටු වෙනවා. ජනතා විමුක්ති පෙරමුණ ඒ ගැන කථා කරපු එක ගැන මම COPE කමිටුවත් එක්ක සාකච්ඡා කරන්නම්. මෙතැනදී උත්සාහ කරන්නේ, මේ පත්වීම පිළිබඳව නායකයන් ඇඳාගෙන දේශපාලන වාසියක් ගන්න කියලායි මට හිතෙන්නේ.

අද මේ නියෝගවලින් උත්සාහ කරන්නේ ක්‍රීඩාව සම්පූර්ණයෙන් ශුද්ධ පවිත්‍ර කරන්න නම්, නීති මීට වඩා ශක්තිමත් කරන්න ඕනෑ. අද ක්‍රීඩාව දේශපාලනීකරණය වීම ගැන කථා කරනවා. ඇත්තටම මේවා ක්‍රීඩා සංගම්. සමිති, ස්වේච්ඡා සමිති එකතු වෙච්ච සංවිධාන. ඒවාට නීත්‍යනුකූල විධියට ඉදිරියට යන්න නම් සමාගම් නීතිය හෝ සමිතිවල නීති මීට වඩා ශක්තිමත් කරන්න ඕනෑ. අධ්‍යක්ෂවරුන් සහ සාමාජිකත්වය කියන එක ඕනෑ තරම් ලෝකයේ තිබෙනවා. ලංකාවයි, තව රටවල් දෙකකුයි ඇරෙන්න අනෙක් හැම රටක්ම ඒවා සංගම් හැටියට ලියාපදිංචි කරනවා; incorporate කරනවා. බැංකුවක, එහෙම නැත්නම් එවැනි ආයතනයක එවැනි වංචා කරන කොට නඩු දාන්න පුළුවන්.

මීට අමතරව මට තව කාරණයක් කියන්න තිබෙනවා. මීට අවුරුදු ගණනාවකට කලින්, තරඟ පාවාදීම් සම්බන්ධයෙන් ලංකාවේ ක්‍රීඩකයන් දෙදෙනෙකුගේ නම් කියැවුණා. අර්ජුන රණතුංග මන්ත්‍රීතුමාත් කිව්වා, එතුමාගේ නමත් කියැවුණා කියලා. ඒ පරීක්ෂණයෙන් ඔවුන් නිදොස් කොට නිදහස් කළේ නැහැ. ඒ තරඟය පවත්වා තිබුණේ ලක්නව්වල. ලක්නව්වල තිබුණු තරඟයට, ඒ තරඟයේ තිබුණු -

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය මම වග කීමකින් කියනවා. අද ගෙනැල්ලා නැති වුණාට ඒ ලේඛන මම ළඟ තිබෙනවා. එන සතියේ මම ඒක එවන්නම්. ඒ පරීක්ෂණයෙන් නිදොස් කොට නිදහස් කරලා තිබෙනවා. අරවින්ද ද සිල්වා ගැන මම දන්නේ නැහැ. මා නිදොස් කොට නිදහස් කරලා තිබෙනවා. ICC එකෙනුයි, මේ රටේ එක්කෙනායි පරීක්ෂණ කරපු වාර්තා ඔක්කෝම මම ළඟ තිබෙනවා. මාධ්‍යයට වැරැදි තොරතුරක් දෙන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

මම දන්නේ නැහැ, කොහෙන්ද නිදොස් කොට නිදහස් කළේ කියලා. ක්‍රිකට් පාලක මණ්ඩලය වාර්තාවක් හැදුවා, ඩෙස්මන් ප්‍රනාන්දු මැතිතුමා මඟින්. එහිදී ගත්තු ස්ථාවරය වුණේ මෙයයි. ඒ තරඟය ලංකාවේ නොවෙයි පවත්වා තිබෙන්නේ. තරඟයේ නීති ප්‍රකාරව, ගිවිසුම් ප්‍රකාරව තමයි තීන්දුව ගැනීමට තිබෙන්නේ. ලංකාවත් ඉන්දියාවත් අතර පැවැති තරඟයකදී තමයි මුදල් අරගෙන පාවා දුන්නා කියන්නේ. ඒ නිසා අපට ඒ පරීක්ෂණය ඉදිරියට ගෙන යෑමේ හැකියාවක් තිබුණේ නැහැ. ඒ වෙන කොට ලෝක කුසලානය ජයග්‍රහණය කරලා තිබුණේ. අපට මේ පරීක්ෂණය ඉදිරියට කරගෙන යෑමේදී ලොකු ගැටලුවක් තිබුණා. එක කාරණයක් කියන්න ඕනෑ. මේ චෝදනාවට හැන්සි ක්‍රොන්යේ මහත්මයා අහු වුණා; එංගලන්තයේ ඇලෙක් ස්ටුවර්ට් අහුවුණා; මාටින් ක්‍රෝ අහුවුණා. ඒ වාගේම පාකිස්ථානයේ හිටපු ක්‍රීඩකයන් අහුවුණා. හත්දෙනෙකුට දඬුවම් කළා. අපේ ක්‍රීඩකයන් දෙදෙනා ඇරෙන්න ඒ වාර්තාවේ හිටපු අයට දඬුවම් කළා. ජීවිතාන්තය දක්වා ඔවුන් ක්‍රීඩාවෙන් ඉවත් කළා. මම ඒ ගැන ඊට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

අවසාන වශයෙන් මට මේ කාරණය කියන්න ඕනෑ. ග්ලින් පාමර් නැමැති කෙනෙක් මම අවුරුදු 20කට විතර කලින් දැන ගෙන හිටියා. මම දැනගෙන හිටපු ග්ලින් පාමර් දැනට අවුරුදු 12ක, 15ක විතර කාලයක සිට මට මුණ ගැහිලාත් නැහැ; කථා කරලාත් නැහැ. එම ග්ලින් පාමර් ICC එකට තොරතුරු දුන්නාද කියන්න මම දන්නේ නැහැ. ඒ වාගේම අර්ජුන රණතුංග ඇමතිතුමා ඉදිරිපත් කළාය කියන ක්‍රීඩා ඇමතිතුමාගේ ලිපියෙහි පිටපතක් ගැන මට දැන ගන්න අවස්ථාවක් ලැබුණේත් නැහැ. මම ඒ ගැන තොරතුරු දන්නේත් නැහැ.

ඒ පිළිබඳව යම්කිසි කරුණු ඉදිරිපත් කළා. ඒ කිසි එකකට මම සම්බන්ධ වෙලාත් නැහැ; මට අවබෝධයකුත් නැහැ. ඒ ලිපියේ තිබුණු අන්තර්ගතය සම්පූර්ණ අසත්‍යයක් කියලා මම කියනවා. ඒ වාගේම එහි තිබෙන කරුණු සියල්ල මම ප්‍රතික්ෂේප කරනවා. හැබැයි ඒ ලිපිය ලබාගෙන අධ්‍යයනය කරලා, ඒ සියලු පාර්ශ්ව පිළිබඳව දේශීය හා ජාත්‍යන්තර වශයෙන් නීතිමය පියවර ගන්න මම බලාපොරොත්තු වනවා. ඒ නිසා මම ඒ ලිපිය පිළිබඳව මීට වඩා කතා කරන්න බලාපොරොත්තු වන්නේත් නැහැ.

ක්‍රීඩාව ගැන කථා කරන මේ අවස්ථාවේ දී මම එක උදාහරණයක් කියන්න කැමතියි. පසුගිය අවුරුදු පහෙන් අවුරුදු තුනකට කිට්ටු කාලයක්, අවුරුදු දෙකහමාරක් විතර මම එම තනතුරේ සිටියා. මම දන්නා තරමට අපේ ක්‍රීඩකයන් පළවෙනි විසිපස්දෙනා කිසිම තරඟයක් පාවා දුන් බවට කිසිම වාර්තාවක් ICC එකේවත්, ලංකාවේවත් නැහැ. තරඟ පාවා දෙනවා කියලා අපිම ගිහින් ප්‍රචාරය දීමෙන්, ලංකාවට පැමිණ පරීක්ෂණ කරන්න

කීමෙන්, ඒවා හොයන්න ලංකාවේ කාර්යාලයක් දමන්න කීමෙන් අපි කළේ අපේ රට දූෂිතයි කියලා ලෝකයට කියපු එකයි. ක්‍රීඩකයන් කිසිම දෙයකට සම්බන්ධ නැත්නම්, හොරකම් කරලා නැත්නම් තරග පාවා දෙන්න අමාරුයි. ඒ නිසා තරගයක් පාවා දුන්නා කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. මම කතා කරන්නේ අන්තිම අවුරුදු පහ ගැන.

දැන් ලසිත් මාලිංග වාගේ ක්‍රීඩකයෙක් ගත්තාම, ඔහු ඉතාම දක්ෂ තනි පුද්ගලයෙක්. ඔහු නායකත්වයට ඇවිත් දැන් තරග 23ක captaincy කරලා තිබෙනවා, තරග 22ක් පරාදයි. ඔහු ඕනෑකමින් matches පරදින්නේ නැහැ නේ. දැනට ක්‍රිකට් ක්‍රීඩාවේ තේරීම් කමිටුවේ, එක්දින සංචිතයේ, Test සංචිතයේ, T20 සංචිතයේ අර්බුදකාරී තත්ත්වයක් තිබෙනවා. දැනට පුහුණුකරු ඉවත් කරලා තිබෙනවා. ඔහුට මාස්පතා ගෙවනවා. හිටපු කීප දෙනෙක් එළවා තිබෙනවා. ක්‍රීඩා ඇමතිතුමා මැදිහත් වෙලා දේශපාලන තීන්දු අරගෙන, පරිපාලනයෙන් ඒ අය සියලුදෙනා ඉවත් කරන්න නියෝග දීලා තිබෙනවා. ඒ නියෝග දීලා ඔවුන් ඉවත් කරලා තිබෙනවා. ක්‍රීඩා අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන්, දැනුවත් වීමෙන් තමයි ක්‍රිකට් පාලක මණ්ඩලයේ ස්වාධීනත්වයෙන් තොරව දැන් සම්පූර්ණයෙන්ම මේ කටයුතු පවත්වාගෙන යන්නේ. ඒක නිසා ඡන්දයෙන් තේරී පත් වූ ඒ අයට ටික කාලයක් පාඩුවේ කටයුතු කරන්න ඉඩ දීලා ඉවසීමෙන් බලාගෙන හිටියොත් හොඳයි කියලා අපි හිතනවා. උපදෙස් දෙන්න අයිතියක් තිබෙනවා. ඒවා ක්‍රියාත්මක වුණා නම් හොඳයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
හොඳයි.

මම හිතන විදියට දැන් අවුරුදු එකහමාරකට වඩා කාලයක් මම ක්‍රිකට් ආයතනයේ වැඩ කරන්න ගියේ නැහැ. මම 2018 මැයි මාසයෙන් පස්සේ ඉවත් වුණා. ගිය වර නිලවරණයට මම ඉදිරිපත් වුණේ නැහැ. දේශපාලනයේ නියැළුණු කෙනකු හැටියට මම එයින් ඉවත් වුණා. හැබැයි, ඡන්දය ඉල්ලද්දී මම සහයෝගය දීපු අය දිනුවා. ඡන්දය ඉල්ලලා දිනන්න බැරි වුණු අය ඉන්නවා. ප්‍රතික්ෂේප වුණාම ඒ අයට යම්කිසි සාධාරණ හිතේ අමාරුවක් ඇති. අතීතයේ සිදු වූ සියලු දේවල් කල්පනා කර කර වර්තමානයේ අපට වැඩ කරන්න බැහැ. අලුත් දක්ෂයන් ඇවිත් ඉන්නවා, ඒ අයට අවස්ථාවක් දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරමින් මිනිසුන්ගේ චරිත ඝාතන කරන්න - defamation සඳහා - අවස්ථාවක් ලබාගන්න ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ. මම අද උදේත් කථානායකතුමාට ඒ ගැන කියා සිටියා. මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරලා, මඩ ගැසීමේ චේතනාවෙන් නෛතික නොවන ලිපි පිළිබඳව කරුණු ඉදිරිපත් කරමින් යම්කිසි ප්‍රකාශ කරනවා නම්, ඒ සියලු අය වෙනුවෙන් මා නීතිය ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වනවා; නීතිය ක්‍රියාත්මක කරනවා. ඒ නිසා වර්තමානයේ මේ රෙගුලාසි මොනවා ගෙනාවත් අන්ත විදියට දේශපාලනීකරණය වුණොත් කවදාවත් ක්‍රීඩාව බේරගන්න පුළුවන් වන්නේ නැහැ කියලා මම හිතනවා. මාත් දැන් දේශපාලනඥයෙක්. හැබැයි, මම පළමු වන ශ්‍රේණියේ ක්‍රීඩා කරපු කෙනකු හැටියට, ක්‍රීඩාවේ යෙදී සිටි කෙනකු හැටියටයි පරිපාලනයට ආවේ. අපි ක්‍රීඩකයෝ වෙලා තමයි පරිපාලනයට ආවේ. පරිපාලනයට ආවාට පස්සේයි අපි දේශපාලනයට එන්නේ. ඒ නිසා මේ චේතනාව අවංක වුණත් හැම එක්කෙනාටම ඇඟිලි දිගු කරන්න ගියොත් සම්මජ්ජාති මේවා හදන්න බැහැ.

මම අවසාන වශයෙන් කියනවා, වංචාවක් පිළිබඳව මට විරුද්ධව කිසිම පරීක්ෂණයක් නැහැ කියලා. මට කිසිම charge sheet එකක් නැහැ. Match-fixing කිරීමට අවුරුදු 25ක් තුළ මම ගැවිලාවත් නැහැ. Match-fixing කිරීම ගැන මට කිසිම සම්බන්ධයක් නැහැ. ඒ වාගේම ජාත්‍යන්තරයේ කිසිම පරීක්ෂණයකට මා ගැවිලා නැහැ. ඒ වාගේම, ලංකාවේ පරීක්ෂණයකදීවත් මගේ නම ගැවිලා නැහැ. ඒ නිසා මේ අලුතින් ගන්න යන ස්ථාවරය ගැන අපට පැහැදිලියි. මේක යම්කිසි දුරකට ක්‍රීඩාව දේශපාලනීකරණය කිරීමේ අවශ්‍යතාවක් විදියට තමයි අපට පෙනෙන්නේ. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට ගරු ආශු මාරසිංහ මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.1.52]

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩා පනත යටතේ නියෝග ඉදිරිපත් කරමින් විශේෂයෙන්ම ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් කටයුතු කරන්න හදන ඉතා වැදගත් අවස්ථාවක මට කතා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා.

මම හිතනවා, තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා එතුමාගේ කථාවෙන් පසුව සභාවෙන් පිටව යන්නේ නැතිව රැඳී සිටියි කියලා. මොකද, එතුමා ගැන තමයි අද අපට කථා කරන්න තිබෙන්නේ. වෙන කවුරුත් ගැන නොවෙයි. එම නිසා එතුමා මේ සභාවේ රැඳී සිටියොත් හොඳයි. මොකද, එතුමා කථා කළාට පස්සේ අපි එතුමාට උත්තර දෙන්නත් ඕනෑ. මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවේ සිදුවෙලා තිබෙන දූෂණ, වංචා සහ ක්‍රීඩාව බූකිකරණයට ලක්වීම යන මේ සියලු කාරණා වෙනුවෙන් පැහැදිලි උත්තරයක් ලබා දිය යුතු වෙනවා. විශේෂයෙන්ම ලෝක කුසලානය ලංකාවට ලබා දුන් ක්‍රිකට් නායකයා හැටියට අර්ජුන රණතුංග මැතිතුමා 2001 වසරේ පටන් මේ වෙනුවෙන් සටන් කළ ආකාරය අපි දැක්කා. නමුත්, ඒ අවස්ථාවල හිටපු ක්‍රීඩා ඇමතිවරු හැසිරුණු ආකාරයත් අපි දැක්කා. වත්මන් ක්‍රීඩා ඇමතිතුමා වන හරින් ප්‍රනාන්දු මැතිතුමාට ජාතියේ ගෞරවය හිමි වෙනවා. ක්‍රීඩා ඇමතිතුමනි, ඔබතුමාට කොන්දක් තිබුණා. ඔබතුමා නිර්භයව හැම තිස්සේම කිව්වා, "නැහැ, මේක අනිවාර්යයෙන් මගේ කාලයේ දී හදනවා" කියලා. එම නිසා අපට ඒක කර ගන්න ලැබුණා. ඒ වාගේම, මේකට අදාළ පනත් කෙටුම්පතත් අපි කොහොම හරි 16 වෙනිදාට කලින් මේ පාර්ලිමේන්තුවට අනිවාර්යයෙන් ඉදිරිපත් කරලා ඒකත් සම්මත කර ගන්න ඕනෑ. කුණු වෙලා ගඳ ගහන තත්ත්වයට පත් වූ ක්‍රිකට් ක්‍රීඩාව නැවත හදා ගන්න පුළුවන් වෙන්නේ ඒ විදියටයි.

දැන් තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා කොහොම කිව්වත්, ICC Report එකේ එතුමාගේ නම පැහැදිලිව තිබෙනවා. අර්ජුන රණතුංග ඇමතිතුමා එතුමාගේ කථාවේදී එම වාර්තාව කියෙව්වා. කාට හෝ එවෙලේ තේරුණේ නැත්නම් හෝ ඇහුණේ නැත්නම්, මට ආයෙත් එය කියවන්න පුළුවන්. අපි මේවා ගැන ජනතාවට පැහැදිලිව පිළිතුරු ලබා දෙන්නට ඕනෑ.

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ අවස්ථාවේ දී පාර්ලිමේන්තුවට යෝජනාවක් කරනවා. ජනාධිපතිතුමාටත් නැවත මේ ගැන හිතන්න කියලා කියනවා. එනම්, මින් ඉදිරියට ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරු පත් කරනකොට, බුකිකාරයෝ පත් නොවිය යුතුය කියන එක. එහෙම නීතියකුත් මේ රටට ඕනෑ. ඒ විතරක් නොවෙයි. සූදුකාරයෝ, වංචාකාරයෝ වාගේ අය ජාතික ලැයිස්තුවලට අවශ්‍ය නැහැ. ජාතික ලැයිස්තුව තිබෙන්නේ ඡන්දයකින් දිනන්න බැරි අයට පාර්ලිමේන්තුවට එන්න නොවෙයි. ජාතික ලැයිස්තුව තුළින් වෘත්තිකයන්ට පාර්ලිමේන්තුවට එන්න අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. එම නිසා මේ වටිනා ජාතික ලැයිස්තුව විනාශ කරන්න, දූෂණය කරන්න ඇත්තටම අපට ඉඩදෙන්න බැහැ. විශේෂයෙන්ම බුකිකාරයන්ට, රේස්කාරයන්ට, එහෙම නැත්නම් දූෂිත පුද්ගලයන්ට ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට එන්න ඉඩ දෙන්න බැහැ. මේ සම්බන්ධයෙන් කථා කරන කොට විශේෂයෙන්ම කියන්නට ඕනෑ, අපේ අර්ජුන රණතුංග ඇමතිතුමා ක්‍රීඩා තරග පාවාදීම්, දූෂණ, නීතිවිරෝධී මෙහෙයවීම්, නීතිවිරෝධී ඔට්ටු ඇල්ලීම් වැළැක්වීම සඳහා ලෝකයත් එක්ක දිගින් දිගටම සටන් කරලා, ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් අද මේ යෝජනාව ගෙනෙන්න සහාය දක්වා තිබෙන බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හා සම්බන්ධව තවත් කථාවක් තිබෙනවා. එක් අවස්ථාවක ලසිත් මාලිංග Waters Edge එකේ පැවැති ක්‍රිකට් සමුළුවක දී පැහැදිලිවම කිව්වා, තමන් ඉල්លූ තණ තිලි දුන්නේ නැහැයි කියලා. ඒ ගැන ක්‍රිකට් බලධාරීන් මොකක්ද කිව්වේ? Blade එක මාරු වුණා කියලා ඔවුන් විහිළු උත්තරයක් දුන් බවත් ලසිත් මාලිංග එහිදී අනාවරණ කළා. මේ අතරවාරයේ තමයි "අල්ජසීරා" රූපවාහිනී නාලිකාව ලංකාවේ ක්‍රිකට් තරග පාවාදීම ගැන අනාවරණ කළේ. ගාල්ල තණ තීරුවත් මේ තරග පාවා දීම සිදු වූ තැනක්. විශේෂයෙන්ම එක් අවස්ථාවක ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ තණ තීරුව සකස් කිරීමට සේවකයන් 15දෙනෙකු පත් කරන්න, ක්‍රිකට් ආයතනයේ ජාත්‍යන්තර තණ තීරු භාරකරු විසින් 15දෙනෙකුගේ නාම ලේඛනයක් ගාල්ල ක්‍රීඩා සමාජයට යවා තිබුණා. නමුත්, ප්‍රේමසිරි හැලඹගේ මහතා එය ප්‍රතික්ෂේප කරනවා. පසුව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී ලෙස එවකට සිටි ඈෂ්ලි ද සිල්වාගේ නියෝගයක් මත එම 15දෙනා සේවයට එක් කරන ලෙස ලිඛිතව දන්වනවා. මේ අය කවුද? ඔවුන් තමයි ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව අතර පැවැති තරගවල දී තණ තිලි වංචාවට හවුල් වුණේ. ඒවා පැහැදිලි දේවල්. ක්‍රිකට් පාලක මණ්ඩලයේ හිටපු සභාපතිවරු මේවාට වග කියන්න ඕනෑ. මේ ගොල්ලන් ඒ වගකීම් පැත්තකින් තියලා COPE කමිටුවටත් රිංගලා COPE කමිටුවත් මුළා කරන්න උත්සාහ කරන එක පිළිකුලින් යුතුව ප්‍රතික්ෂේප කරන්න ඕනෑ. පාර්ලිමේන්තුවට ආයෙත් එන්න ඕනෑ නම්, ඡන්දය ඉල්ලා එන්න කියලා තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාට අපි අභියෝග කරනවා. ආයෙත් ජාතික ලැයිස්තුවට රිංගන්න ලෑස්තිවන්න එපා, ඡන්දය ඉල්ලා එන්න කියලා අපි එතුමාට කියනවා. එතුමාට ඡන්දය ඉල්ලා පාර්ලිමේන්තුවට එන්න බැරිව පැරදිලා, ජාතික ලැයිස්තුවෙන් ඇවිල්ලා මෙවැනි කටයුතුවලට පාර්ලිමේන්තුව පාවිච්චි කිරීම ඉතා බරපතළ නීතිවිරෝධී හා විනය විරෝධී ක්‍රියාවක්. එම නිසා තමයි ICC එකෙන් කෙළින්ම චෝදනා එල්ල වෙලා තිබෙන්නේ. ICC එකෙන් කෙළින්ම අපරාධ වරදක් කළ හැටියට criminal charges එල්ල කරලා තිබෙන්නේ ඒකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක බරපතළ ප්‍රශ්නයක්. මේ ICC වාර්තාව සම්බන්ධයෙන් කරුණු පරීක්ෂා කරන්න පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම අවශ්‍යයි. අපේ රටේ ජනතාව සමහර වෙලාවට ක්‍රිකට් ක්‍රීඩාව ආගමක් විදියට වැළඳගන්නා තත්ත්වයක් තිබෙනවා. ක්‍රිකට් කියන්නේ, අපේ රටේ උප සංස්කෘතියක්. මේ ක්‍රීඩාවට අපි සියලුදෙනාම ආදරය කරනවා. ඒ නිසා මේ පිළිබඳව සොයා බලන්න විශේෂ කාරක සභාවක් රටට අවශ්‍යයි කියන යෝජනාව මම කරනවා. විශේෂයෙන්ම, හරින් ප්‍රනාන්දු ඇමතිතුමාගෙනුත් මා ඉල්ලා සිටිනවා, ICC එකෙන් ක්‍රීඩා අමාත්‍යාංශයට එවා තිබෙන සියලු ලිපි ලේඛන අපට ලබා දෙන්න කියලා. ඒවා ලබාගෙන, පාර්ලිමේන්තුවේදී අප ඒ ගැන වෙනම වාද විවාද කරන්න ඕනෑ.

ඇත්තටම මේ දේවල් වුණාද? මේ වාර්තාවේ පැහැදිලිව තිබෙනවා, මේ ගිණුම්වලට කොහොමද මුදල් එව්වේ කියලා. මේ සියලු කාරණා පැහැදිලිව පරීක්ෂා කරන විශේෂ කාරක සභාවක් මේ පාර්ලිමේන්තුවට අවශ්‍යයි. ඒ හරහා සියලු දේවල් හෙළිදරව් කරගත යුතුයි. එහෙම වුණොත් විතරයි, අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව පිරිසිදු, පැහැදිලි, රටේ ජනතාව ආදරය කරන තැනකට ගෙන එන්න පුළුවන් වන්නේ.

1996දී ලෝක කුසලානය දිනපු අපේ රටේ ක්‍රිකට් කණ්ඩායමේ හිටපු ක්‍රීඩකයන්ගේ නම් ටික අපට අදටත් කට පාඩම්. අපි ක්‍රිකට්වලට ඒ තරම් ආදරය කළා. පසුකාලීනව, අපේ ක්‍රිකට් කණ්ඩායමේ ඉන්න ක්‍රීඩකයන් 11 දෙනාගෙන් හතර පස්දෙනෙකුගේවත් නම් අපි දන්නේ නැහැ. එහෙම වුණේ ඇයි? අවස්ථාව අනුව, අවශ්‍ය විදියට ඒ ගොල්ලන් මේ ක්‍රිකට් කණ්ඩායම විනාශ කරලා, තමන්ට ඕනෑ කණ්ඩායමක් දමාගෙන, තමන්ගේ සෙල්ලම් ටිකට, රේස් ඔට්ටු ව්‍යාපාරයට අවශ්‍ය දත්ත ටික සපයා ගන්න ඕනෑ ආකාරයට ක්‍රියා කළා. ඒ නිසා තමයි මේ දේවල් සිද්ධ වුණේ.

මේ වාර්තාව FCID එකටත් දෙන්න ඕනෑ; අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට වාගේම වංචා, දූෂණ සම්බන්ධයෙන් ක්‍රියා කරන සියලු කොමිෂන් සභාවලටත් දෙන්න ඕනෑ. පාර්ලිමේන්තුවේදී විතරක් නොවෙයි, එළියට ඇවිල්ලාත් මේවා ගැන කථා අපි කරන්න ලෑස්තියි; ඒ සියලු දේවල් ගැන කථා කරන්න අපි ලෑස්තියි. අපි ඇත්ත කථා කරන්නේ. මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව අර පරණ තත්ත්වයට, නැවත ලෝක කුසලානයක් දිනන තත්ත්වයට ගෙන එන්න ඕනෑ. ක්‍රිකට් ක්‍රීඩකයන්ට තනිවම, නිදහසේ ක්‍රීඩා කරන්න අයිතිය ලබා දෙන්න ඕනෑ. ඒ අයිතිය ලබා දෙන්න තමයි හරින් ප්‍රනාන්දු ඇමතිතුමා මේ වීර ක්‍රියාව ජාතිය වෙනුවෙන් කළේ. එතුමාට හතර වටෙන්ම බලපෑම් ආපු බව අපි දන්නවා. එතුමා කොන්ද කෙළින් තබාගෙන ඒ වැඩේ කළා. කොන්ද කෙළින් තබා ගෙන වැඩ කළ නායකයකු හැටියට ක්‍රීඩා අමාත්‍ය ගරු හරින් ප්‍රනාන්දු මැතිතුමාගේ නාමය අනාගතයේදී රන් අකුරින් ලියැවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු අර්ජුන රණතුංග ඇමතිතුමා කිව්වා වාගේ, මේ රටේ හිටපු දූෂිත ක්‍රීඩා ඇමතිවරු සියලුදෙනාටම මේ මාසයේ 16වන දාට නිවැරදි උත්තරය ලැබෙනවා. 16වන දා ඒ උත්තරය ලැබුණාට පස්සේ, ඒ සියලුදෙනා ඊළඟට පැවැත්වෙන මහ මැතිවරණයෙන් ගෙදර යැවිය යුතුයි. ඒ දේ කරන්න, නිසි උත්තර දෙන්න කියලා රටේ ජනතාවගෙන් අපි ඉල්ලනවා. ඒ උත්තර දීම හරහා, මින් ඉදිරියටවත් ජාතික ලැයිස්තුව හරහා රේස් බුකිකාරයන්, හොරු, තක්කඩින් පාර්ලිමේන්තුවට එවන්නේ නැතිව ඉදියි කියලා අපි බලාපොරොත්තු වෙනවා. එවැනි තැනකට රට තල්ලු විය යුතුයි. එහෙම නැති වුණොත් වෙන්නේ, මේ රටේ ජනතාව, - විශේෂයෙන්ම අපේ දූ දරුවන්- අපට ශාප කරන එකයි. අද උදේත් අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ, "ස්වර්ණවාහිනියෙන්" විකාශනය වන, ළමයි ප්‍රශ්න අහන, ඒ වැඩසටහනේදී ඒ ළමයි පළමුවෙන් අහන ප්‍රශ්නයක් මේක. දූෂිත පුද්ගලයන් පාර්ලිමේන්තුවේ තියාගෙන කොහොමද පාර්ලිමේන්තුව ගෙන යන්නේ? පාසල් ශිෂ්‍යයන් දැන් එහෙම ප්‍රශ්න කරනවා. "නාඩිය"

කියන වැඩසටහනට මම සම්බන්ධ වූ අවස්ථාවේදීත් ප්‍රශ්න කළේ, "දූෂිත පුද්ගලයන් ගැන ඔබතුමන්ලා පාර්ලිමේන්තුව ඇතුළේ ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ ඇයි?" කියලායි. දූෂිතයන් ආරක්ෂා කරන්න කිසිම නිලධාරියෙක් support කරන්නේ නැහැ. එහෙම support කරන නිලධාරින් ඉන්නවා නම් ඒ අයත් මේවාට වග කියන්න ඕනෑ; ඒ අයත් මේවා දැන ගන්න ඕනෑ. විශේෂයෙන්, පාර්ලිමේන්තු වරප්‍රසාද ඇතුළේ තිබෙන යම් යම් දේවල්වලට මුවා වෙලා කාටවත් කියන්න බැහැ, "මම හිටපු නියෝජ්‍ය කථානායක, ඒ නිසා මෙවැනි, මෙවැනි දේවල් කරන්න ඕනෑ" කියලා. ඒ කථා හරියන්නේ නැහැ. "මම නියෝජ්‍ය කථානායක වෙලා හිටපු නිසා මේවා කරලා නැහැ" කියලා බේරෙන්න බැහැ. ඒවායින් බේරෙන්න පුළුවන් වෙන්නේ හරියට උත්තර දීමෙන් විතරයි. රටේ නීතියක් තිබෙනවා. ඒ නීතිය හරහා මේවාට පිළිතුරු දිය යුතුයි. ඒක තමයි රටට අවශ්‍ය වන්නේ.

ක්‍රීඩාව ආරක්ෂා කර ගන්න අද මේ ගන්නා තීරණ හරහා, ක්‍රිකට් ක්‍රීඩාව රටේ ක්‍රීඩකයන්ට ආදරණීය ක්‍රීඩාවක් හැටියට නැවත බාර දෙන්න අපට හැකියාව ලැබෙනවා. මේක කරන්න අවශ්‍යයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩාව කියන්නේ අපේ ජන සමාජයේ එක්තරා පැතිකඩක්. අපට හොඳ ක්‍රීඩකයෝ හිටියොත්, ක්‍රීඩකයෝ වැඩි වුණොත් හිර ගෙවල් වහන්න වෙනවා. ඒවා අවශ්‍ය වන්නේ නැහැ. ඒක තමයි, ලෝක සම්මතය. ක්‍රීඩාව තුළින් හික්මීම ඇති කර ගත්තාම හිර ගෙවල්වලට යන්න වෙන්නේ නැහැ. මින් ඉදිරියට, තමන් කැමැති විධියට, කාගේවත් බලපෑමකට යටත්නොවී තමන් දන්න ක්‍රීඩාවක නියැලෙන්න රටේ ජනතාවට අවස්ථාව ලබා දෙන්න ඕනෑ. ඔට්ටු අල්ලන්නන්ට උදවු කරන ක්‍රීඩකයකු බවට පත් නොවී සිටීමේ ශක්තිය ඒ අයට ලබා දෙන්න ඕනෑ. ඒක තමයි, අද අවශ්‍යතාව.

මේක මතක තියා ගන්න. 16වන දාට මේ දේවල් ආපස්සට හරවන්න යම් අය බලාගෙන ඉන්නවා නම්, ඒක හරියන්නේ නැහැ. මේ රටේ ජනතාවගෙන් අපි ඉල්ලා සිටිනවා, 16වන දාට නිවැරදි උත්තරය ලබාදෙන්න කියලා. මේ රටට, ක්‍රීඩාව පිරිසිදු කර ගන්න අවශ්‍යයි. ඒ සඳහා, බුකිකාරයෝ ක්‍රීඩාවෙන් අයින් කර ගන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, පාර්ලිමේන්තුවේ හැසිරෙන්න දන්නේ නැති, මිරිස් කුඩු ගහන, පුටු කඩලා ගහන, බයිබලයෙන් ගහන අය ගැන ලබන 16වන දාට උත්තරයක් ඕනෑ. රටේ ජනතාව 16වන දාට නිවැරදි උත්තරය දෙනතුරු අපි බලාගෙන ඉන්නවා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමේ කාර්යය තවදුරටත් ශක්තිමත් කිරීම සහ පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීම රටට අවශ්‍ය වෙනවා. එම නිසා, 16වන දාට ලැබෙන උත්තරය හරහා අපට තවත් ශක්තිමත් විධියට ඉදිරි ක්‍රියාමාර්ග ගන්න පුළුවන් වෙනවා.

ක්‍රීඩා අමාත්‍යතුමාට මම නැවතත් ස්තුතිවන්ත වෙනවා. හෘදය සාක්ෂියට එකඟව වැඩ කරන ඇමතිවරයකු හැටියට ඔබතුමා ඉතා හොඳ ක්‍රියාමාර්ගයක් අරගෙන තිබෙනවා. අපි සියලුදෙනා ඔබතුමාත් සමඟ ඉන්නවා, මේ සියලු බලවේග පරද්දන්න. පාර්ලිමේන්තුවේදී විතරක් නොවෙයි, එළියේදීත් අපි ඒ සඳහා ලෑස්තියි. කිසි කෙනෙකුට අප සල්ලිවලට ගන්න බැහැ වාගේම, විකල්ප ක්‍රමවලින් අපේ කටහඬ නිහඬ කරන්නත් බැහැ. ඒවා හරියන්නේ නැහැ; ඒවා බැහැ. අපි ඒවාට මුහුණ දෙන්න ලෑස්තියි. අපි සියලුදෙනාම 16වන දාට නිවැරදි පිළිතුර ලබා දෙමු, ඒ හරහා මේ රට ශක්තිමත් කරමු කියන යෝජනාව කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
Sir, I move,

"That the Regulations made by the Minister of Telecommunication, Foreign Employment and Sports under Section 41 read with Section 31 of the Sports Law No. 25 of 1973 regarding National Associations of Sports and published in Gazette Extraordinary No. 2137/85 of 23rd August, 2019, which were presented on 23.10.2019, be approved.

(Cabinet approval signified.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
Sir, I move,

"That the Regulations made by the Minister of Telecommunication, Foreign Employment and Sports under Section 41 read with Section 31 of the Sports Law No. 25 of 1973 regarding National Associations of Sports and published in Gazette Extraordinary No. 2137/86 of 23rd August, 2019, which were presented on 23.10.2019, be approved.

(Cabinet approval signified.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
## இலங்கை நிர்மாணக் கைத்தொழில் சம்மேளனம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
## CHAMBER OF CONSTRUCTION INDUSTRY OF SRI LANKA (INCORPORATION) BILL

***පනත් කෙටුම්පත (ස්ථාවර කාරක සභාවෙහි දී) සංශෝධනය කළ ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.***
*[நிலைக் குழுவில்] திருத்தப்பட்டவாறு, சட்டமூலத்தைப் பரிசீலித்தற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for consideration of Bill, as amended (in the Legislative Standing Committee), read.*

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
Sir, I move,

"That the Report of the Legislative Standing Committee on the Chamber of Construction Industry of Sri Lanka (Incorporation) Bill be accepted."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
Sir, I move,

"That the Bill, as amended, be now read the Third time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
## இலங்கை ஐக்கிய கிறிஸ்தவ நட்புரிமை (கூட்டிணைத்தல்) சட்டமூலம்
## UNITED CHRISTIAN FELLOWSHIP OF SRI LANKA (INCORPORATION) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
Sir, I move,

"That the Bill titled United Christian Fellowship of Sri Lanka (Incorporation) be now read a Second time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදින්, 53(3) වන ස්ථාවර නියෝගය යටතේ, ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් එය ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී.***

*சட்டமூலம் இதன்படி, இரண்டாம் முறை மதிப்பிடப்பட்டு நிலைக் கட்டளை 53(3)இன்படி சட்டவாக்க நிலைக்குழுவுக்கு மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்களால் சாட்டப்பட்டது.*

*Bill accordingly read a Second time, and allocated by* THE HON. DEPUTY SPEAKER *to Legislative Standing Committee under Standing Order 53(3).*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ඊට පෙර, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

## ජාතීන් සහ ආගම් අතර සමගිය සඳහා නීති සම්පාදනය
## சமூக மற்றும் மதங்களுக்கிடையில் ஒற்றுமையை ஏற்படுத்துவதற்கான சட்டம்
## LEGISLATION FOR COMMUNAL AND RELIGIOUS HARMONY

[අ.භා. 2.06]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා මූලාසනයේ සිටින වෙලාවේ මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. අද දින සභාව කල් තබන අවස්ථාවේ මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද අපගේ මාතෘ භූමිය වෙත බලපා ඇති ගෝලීය අන්තවාදී නව ත්‍රස්ත උවදුර මුලින් උපුටා දැමීමට මෙන්ම, අතීතයේදී මෙන් යුද්ධයක් අනාගතයේදී මේ රට තුළ ඇති නොවීමටද, සියලු ජාති, ආගම් අතර මිත්‍රත්වය ගොඩනැඟීමටද හැකි වන පරිදි නව නීති සම්පාදනය කිරීම පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමු විය යුතු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

සාමාජයීය, සංස්කෘතික, අධ්‍යාපන හා මානවයා කෙරෙහි බලපා ඇති විවිධ වූ විෂමතාවන් දුරු කළ හැකි සියලුම පැතිවලින් විද්‍යාමාන වන මානව බැඳීම් ශක්තිමත් වන ආකාරයේ පනත් සැදීම යුගයේ ජාතික අවශ්‍යතාවක් වේ.

උතුරු - නැඟෙනහිර දෙපළාත් එක් කිරීම, ස්වයං තීරණ අයිතිය ලබාදීම, ඒකීය රාජ්‍ය ක්‍රමයෙන් බැහැරවීම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම, සිදු වූ බව කියන යුධ අපරාධ ජාත්‍යන්තර මැදිහත් වීමක් තුළින් විසඳීම ඇතුළු රටට අහිතකර කරුණු ගණනාවක් සම්බන්ධයෙන් මේ වන විට මහා සංඝරත්නය ප්‍රමුඛ ආගමික නායකයින්ගේද, මහ ජනතාව අතරද විශාල කථා බහක් ද ඇති වෙමින් පවතී.

එබැවින් මෙවැනි තත්ත්වයක් තුළ සියලුම ජාතීන් අතර සමගිය ඇති කිරීමෙහිලා ඉවහල් වන පනත් සැදීම ආණ්ඩුවේ ප්‍රබල වගකීමක් වන අතර, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය නීති - රීති සම්පාදනය කළ යුතු බවට මෙම ගරු සභාව මඟින් ආණ්ඩුවට යෝජනා කරමි. "

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ ඉතිහාසය පුරා පැවති තත්ත්වය හා සාපේක්ෂව සැසඳීමේදී, අද දවසේ අපි තීරණාත්මක පැයකට එළැඹ තිබෙන බව මා විශ්වාස කරනවා.

මේ රට අවුරුදු 2,500කටත් වඩා පැරණි ලිඛිත ඉතිහාසයකට උරුමකම් කියන රටක්. පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා, සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් කියන සියලු ජන කොටස්වලට කැමැති තැනක ජීවත් වීමට හා ජීවනෝපාය සලසා ගැනීමට හැකි, එක් නීතියක් යටතේ ක්‍රියාත්මක වන, ඒකීය, ස්වෛරී, ස්වාධීන රාජ්‍යයක් ලෙස මේ රට පැවැතිය යුතු බව අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෑත ඉතිහාසයේ විශාල කතා බහකට ලක්ව ඇති, අපේ රටේ ඉරණම් ගමන තීරණය කරන තීරණාත්මකම ජනාධිපතිවරණය තමයි 2019 නොවැම්බර් මාසයේ 16වන දා පැවැත්වෙන්නේ. එය පැවැත්වෙන අවස්ථාවේදී ජාතීන් අතර, ආගම් අතර සමඟිය, සහජීවනය, සංහිඳියාව ඇති වන මාවතට පටහැනිව ඉදිරිපත් කළ, බල ලෝභී දේශපාලනඥයන්ගේ දේශපාලන මත පදනම් වූ යෝජනාවලියක් අපේ පිලේ ජනාධිපති අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාටත්, අනෙකුත් ජනාධිපති අපේක්ෂකයන්ටත් ඉදිරිපත් කෙරුණා. ඒ ඇතැම් යෝජනා සම්බන්ධයෙන් අපේ අදහස වන්නේ, ඒවා ජාතිවාදී පදනමකින් ඉදිරිපත් වූ බවයි. එකී යෝජනාවලට අදාළව ඔක්තෝබර් 21වන සඳුදා "දිවයින" පුවත් පතේ පළ වූ ලිපියක් ගැන මා කියන්න කැමැතියි. ජනාධිපතිවරණ අපේක්ෂකයන් වෙත යොමු කිරීම සඳහා වූ යෝජනා 13ක් මාධ්‍යවල පළ වෙලා තිබුණු බවත්, ඒවායෙන් යෝජනා 8ක් ම ජාතිභේදවාදී යෝජනා බවත් දේශප්‍රේමී භික්ෂු පෙරමුණේ ලේකම්, ජාතික හිමිකම් සංවිධානයේ සභාපති වාගේම ජාතික සංවිධාන සම්මේලනයේ සභාපති පූජ්‍ය බෙංගමුවේ නාලක ස්වාමීන් වහන්සේ එහි සඳහන් කොට තිබෙනවා. එකී යෝජනා මෙසේයි:

1. දෙමළ නිජබිමේ අනන්‍යතාව පිළිගනිමින් ඒ සඳහා වන අයිතිය තහවුරු කළ යුතුය.

2. ජාත්‍යන්තර නීතියට අනුව මෙරට දෙමළ ජාතියට ස්වයං තීරණ අයිතිය හිමි වන බව පිළිගනිමින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කිරීමේදී ඒකීය රාජ්‍ය සංකල්පය ඉවත් කොට ජාතික ගැටලුවලට ෆෙඩරල් විසඳුමක් ලබා දිය යුතුය.

3. මොරගහකන්ද ජලාශය නමින් වන්නි දිස්ත්‍රික්කයේ සිදු කෙරෙන ජනපදකරණය නතර කළ යුතුය.

4. රජයේ මැදිහත් වීම මත උතුර - නැඟෙනහිර පළාත්වල සිදු කරනු ලබන සිංහල ජනපදකරණය නතර කළ යුතුය.

5. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් උතුරු නැඟෙනහිර පළාත්වල සිදු කරනු ලබන ඉඩම් අත් පත් කර ගැනීම් වහා නතර කළ යුතුය.

6. උතුර - නැඟෙනහිර පළාත්වල රජයේ ආයතනවල රැකියා අවස්ථා එම පළාත්වල තරුණ තරුණියන්ට පමණක් ලබා දිය යුතුය.

7. උතුරු නැඟෙනහිර පළාත්වල රැකියා වියුක්තිය හා ආයෝජන අවස්ථා වැඩි කිරීම සඳහා විදෙස් රටවල ජීවත් වන මෙරට දෙමළ ජනතාවට සෘජුවම මූල්‍ය ප්‍රදානයන් කිරීමට හැකි පරිදි නීති රීති ලිහිල් කළ යුතුය.

ඒ ගෞරවනීය ස්වාමීන් වහන්සේ සඳහන් කරන පරිදිම අපත් දකින්නේ, රටට ඉදිරිපත් කර තිබෙන ඒ යෝජනාවලිය එක රටක්, එක නීතියක් යන සංකල්පයෙන් බැහැරව, බෙදීමට, කැඩීමට, වෙන් වීමට අදාළ වන යෝජනාවලියක් ලෙසයි. එසේ කීමට හේතුව මොකක්ද? දැනට වෙන් වී තිබෙන පළාත් දෙකක් වන උතුර සහ නැඟෙනහිර දෙපළාතේ තිබෙන සම්පත් වාගේම දකුණේ තිබෙන සම්පත් ද සිංහල හෝ වේවා, ද්‍රවිඩ හෝ වේවා, මුස්ලිම් හෝ වේවා සැමට සාධාරණව ශ්‍රී ලාංකිකයන් ලෙස බෙදී යා යුතුයි. කොළඹ නගරය ගත්තොත්, කොළඹ නගරය ආශ්‍රිතව තිබෙන සම්පත් -භූමි සම්පත්, සාගර සම්පත්, වන සම්පත්, මානව සම්පත් ඇතුළු අනෙකුත් සියලු සම්පත්- මුස්ලිම් ජනතාවත්, සිංහල ජනතාවත්, ද්‍රවිඩ ජනතාවත් සමාන ලෙස බුක්ති විඳිනවා. කොළඹ නගරය පිහිටි පළාත ද ඇතුළුව සෙසු පළාත් වෙන් වෙන්ව තිබෙන පළාත්. ඒවා බස්නාහිර පළාත, සබරගමුව පළාත, දකුණු පළාත ආදි වශයෙන් වෙන් වෙන්ව තිබෙනවා. විවිධ ජන වර්ග ජීවත් වුණත් මේ පළාත්වල ජනයා පළාත් ඒකාබද්ධ කළ යුතුය කියා කිසි අවස්ථාවක කියන්නේ නැහැ. එහෙම නම්, උතුර පළාතට නැඟෙනහිර පළාත එකතු කරන්න කියන්නේ ඇයි? මේ රටට, මේ ලෝකයට ඉතාම වටිනා ස්වාභාවික වරායක් වාගේම, සබ්මැරීන පවා සැඟවිය හැකි මෙවැනි දුර්ලභ වරායන් ලෝකයේ තුනයි තිබෙන්නේ. ඉන් එකක් තමයි, ත්‍රිකුණාමලය වරාය. නැඟෙනහිර පළාතේ පිහිටා තිබෙන ත්‍රිකුණාමලය වරාය ප්‍රධාන නගරයේ වරාය ලෙස එලෙසින්ම පැවතිය යුතුයි, අප සියලුදෙනාට පොදුවේ බුක්ති විඳින්න.

අද ප්‍රීමා සමාගම ලෝකයේ දැවැන්තම නැව් ගෙනැල්ලා, තිරිඟු ඇට නැවේ තියාගෙන, කම්හලට තමයි පොම්ප කරන්නේ. එවැනි විශාල නැව් පාවිච්චි කරමින් තිරිඟු ඇට කුඩු කරලා හදන නිෂ්පාදනය සමස්ත ලාංකීය ජනතාව පරිභෝජනය කරනවා. එතකොට පොදුවේ භාවිත කරන, එක පළාතක තිබෙන වරායක් තවත් පළාතකට එකතු කරන්නේ ඇයි?

දෙවන ලෝක මහා සංග්‍රාමයේදී, මවුන්ට්බැටන් සාමිවරයා ඒ යුද්ධය මෙහෙයවන අවස්ථාවලදී, අපේ රට යුද්ධයේ කේන්ද්‍රීය ස්ථානයක් ලෙස පැවතියදී තෙල් ගබඩා කිරීම සඳහා ත්‍රිකුණාමලයේ දැවැන්ත තෙල් ටැංකි 91ක් තිබුණා. එය අපේ රටට තියෙන ඌන උපයෝජනය කළ සම්පතක්. එම සම්පත උතුරු පළාතට ඒකාබද්ධ කිරීම සාධාරණ වෙන්නේ කෙසේද කියන එක මට තේරුම් ගන්න අපහසුයි. ඒ වාගේම. ඛනිජ සම්පත්, ගෑස් ගත්තොත් අපේ රටේ මීගමුව ප්‍රදේශයේ වෙරළේවත්, හම්බන්තොට, උස්වැටකෙයියාව, දෙහිවල මුහුදු තීරවල ඒවා නැහැ. ඛනිජ තෙල් හා ගෑස් තියෙන්නේ මන්නාරම් ද්‍රෝණියේ පමණයි. දැනට තෙල් ළිං 9ක් ජාතිය සතු සම්පත් ලෙස කණිනවා. ඒවා උතුරේ ප්‍රදේශයකට එකතු කළාම, ඒ සම්පත් පොදුවේ සමස්ත ලාංකීය ජනතාවට භුක්ති විඳින්න තියෙන අවස්ථා ඇහිරීමට හෝ විශේෂතා ඇතිවීමට තිබෙන ඉඩකඩ වැඩියි. පුල්මුඩේ ඉල්මනයිට් නිධිය තිබෙනවා. නැඟෙනහිර පළාතේ තල්මසුන් සිටින පාසිකුඩා, කල්කුඩා කියන ඉතාම දර්ශනීය මුහුදු තීර දෙකක් තිබෙනවා. අද ඉන්දියාවෙන් පවා ඇවිල්ලා මුතු, මුහුදු කුඩැල්ලන් හා වෙනත් සාගර සම්පත් හොරෙන් අරගෙන යනවා. නමුත් ඒ සියල්ල පොදුවේ භුක්ති විඳින්න ඕනෑ සම්පත් නිසා තමයි මහින්ද රාජපක්ෂ යුගයේදී උතුරු නැඟෙනහිර විශේෂ ලෙස නොසලකා, රටේ සියලු ජනතාවට ලැබෙන අයිතිවාසිකම් හා වරප්‍රසාද ආදිය යුද්ධයෙන් පස්සේ උතුරට ලබාදීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගත්තේ. අපි දන්නවා, යුද්ධය පවතින සමයේ උතුරට දුම්රිය මාර්ගයක් තිබුණේ නැහැ. මේ රේල් පීලි බංකර හදන්න තමයි පාවිච්චි කරලා තිබුණේ. සිල්පර කොට බංකර හදන්න තමයි පාවිච්චි කරලා තිබුණේ. යුද්ධය නිම වුණාට පස්සේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඉන්දියාවට ණය වෙලා, එම දුම්රිය මාර්ගය යාල් දේවි දුම්රිය ධාවනය කරන්න පුළුවන් විධියට හදලා, විවෘත කිරීමේ කටයුත්ත කළා. දරුවන් අතර සහජීවනය ඇති වෙන්න අවශ්‍ය නිසා පාසලින් පාසල, සතෙන් සතය එකතු කරලා තමයි අලිමංකඩ දුම්රිය ස්ථානය සෑදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ සල්ලි වියදම් කළේ. එයට "සෙනෙහසේ නවාතැන්පොළ" කියලා නමක් දැමුවා. ද්‍රවිඩ - සිංහල අය අතර සෙනෙහස ඇති කරන නවාතැන්පොළ ලෙස ලංකාවේ සිංහල,

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

දෙමළ, මුස්ලිම් දරුවන්ගෙන් සල්ලි එකතු කරලා තමයි අලිමංකඩ දුම්රිය ස්ථානය හැදුවේ. ඒ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කළේ මමයි. ඒ වනවිට මුළු යාපනය දිස්ත්‍රික්කයම අඳුරේ තමයි තිබුණේ. මහින්ද රාජපක්ෂ යුගයේදී ලෝකයෙන් ණය අරගෙන තමයි විදුලි බලය ලබා දුන්නේ. විදුලි සංදේශ කටයුතු කිසි දෙයක් තිබුණේ නැහැ, රූපවාහිනිය තිබුණේ නැහැ, ගුවන් විදුලිය තිබුණේ නැහැ, දුරකථන තිබුණේ නැහැ. ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව හා වෙනත් මූල්‍ය ආයතනවලින් ලබාගත් ණයවලින් විශාල ප්‍රමාණයක් "උතුරු වසන්තය" හා "නැඟෙනහිර උදානය" සඳහා ලබාගත් ණය. දකුණේ කිසි තැනක නැති දැවැන්ත පාලම්, පාරවල්, ඇනිකට්, වේලි, A9 මාර්ග ඇතුළු ඒ සියල්ල දකුණට වඩා අබමල් රේණුවකවත් කිසිම අඩුවක් නොවෙන ආකාරයට තමයි උතුරේ නිර්මාණය කළේ. මම උතුරු මැද පළාතට මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 81ක් හදනකොට, උතුරට 96ක් හදලා, නැඟෙනහිර පළාතට 106ක් හැදුවා. එහෙම නම් අපි උතුරුමැද පළාතේ දරුවන්ට අඩු සැලකිල්ලක් තමයි කරලා තිබෙන්නේ. ඊට වඩා වැඩියෙන් නැඟෙනහිර හා උතුරු පළාතේ දරුවන්ට සලකලා තියෙනවා. තාක්ෂණ විෂය නිර්දේශය හඳුන්වා දෙනකොට ඉංජිනේරු තාක්ෂණය, ජෛව පද්ධති තාක්ෂණය උතුරේ දරුවන්ටත්, නැඟෙනහිර දරුවන්ටත්, දකුණේ දරුවන්ටත් එක ලෙස තමයි හඳුන්වා දුන්නේ.

මං මාවත්, විදුලිය, ජලබස්නා, ජලාපවහන ක්‍රම, වැව් අමුණු, යටිතල පහසුකම් සියල්ල ලබා දීමෙන් පසු උතුරේ ජනතාවගෙන් මම අහන්න කැමැතියි, මහින්ද රාජපක්ෂ යුගයේ යුද්ධය නිම කරලා, බිම් බෝම්බ ඉවත් කරලා, පුනරුත්ථාපනය කරලා, ඉඩම් නිදහස් කරලා ඇති කරපු ඒ සංවර්ධනයට පසුගිය අවුරුදු හතර හමාර තුළ මොකක්ද වුණේ කියලා. එතුමා ගෙන ගිය සාධාරණ, හොඳ, යහපත් ව්‍යාපෘති එකක්වත් ඉදිරියට අරගෙන ගියේ නැහැ. ඒ ගෙන ගිය වැඩ පිළිවෙළ නිසා ජන වර්ග අතර විශාල සමගියක් ඇති වෙලා තිබුණා. මට උදාහරණයක් සඳහන් කරන්න පුළුවන්. මම අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් හිටපු කාලයේ උතුරේ දරුවන් දකුණේ ඉන්න දරුවන් සමඟ සම්බන්ධ කරන්න කටයුතු කළා. ඒ ගෙවල්වල නවාතැන් ගෙන ටික දවසක් ඉඳලා ඔවුන් මේ කියන අත්දැකීම ලබා ගත්තා. එහෙම උතුරේ දරුවන් පිරිසක් හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ දරුවන්ගේ ගෙවල්වල නතර වෙලා හිටියා. ඔවුන් සති දෙක තුනක් බොහොම සුහදව ගත කරලා ආපසු යාපනයට ගියා. ඒ දරුවා යාපනයට ගිය අවස්ථාවේ, ගෙදර රණ්ඩු සරුවල් ඇති වෙලා බස් එකක නැඟලා යාපනයේ ඉඳලා ආපසු කොළඹට ආවා. ඒ දරුවා ආපසු හෝමාගම හිටපු ගෙදරට හොයා ගෙන ගියා. ඒ පිළිබඳව පුවත් පත්වල වාර්තා පළවෙලා තිබුණා. එහෙමයි සංහිඳියාව ඇති විය යුත්තේ. නැතුව ජාතිවාදී ඉල්ලීම් ඉදිරිපත් කිරීමෙන් පමණක් සංහිඳියාවක්, සහජීවනයක්, කල් පවත්නා සාමයක් රටක ඇති වෙන්නේ නැහැ.

2019 ඔක්තෝබර් 21 වැනිදා "දිවයින" පුවත් පතේ මුල් පිටුවේ පළ වූ වාර්තාවක් මම මේ අවස්ථාවේදී කියවන්න කැමැතියි. එහි මෙසේ සඳහන් වනවා:

> "අපේක්ෂකයන්ට දුන් ඉල්ලීම් 13ට ප්‍රතිචාරයක් නැති නම් විගීගෙන් සුරේෂ්ගෙන් වෙනත් විකල්පයක් උතුරේ දෙමළ දේශපාලන පක්ෂ පහක් විසින් ජනාධිපතිවරණයට ඉදිරිපත් වී සිටින අපේක්ෂකයන් වෙත භාර දෙන ලද කරුණු 13ක් ඇතුළත් ලිපියට කිසිවකුගෙන් හෝ පැහැදිලි ප්‍රතිචාරයක් නොලැබෙන්නේ නම් ඊට වෙනත් විකල්පයක් අනුගමනය කළ යුතු බවට දෙමළ දේශපාලන පක්ෂ දෙකක් තීරණය කොට තිබේ."

මෙහෙම දේශපාලන පක්ෂයක් විසින් විශේෂයෙන් ආණ්ඩු පක්ෂය විසින් තමන්ගේ දේශපාලන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහාත්, අපේක්ෂකයෙක් දිනවීම සඳහාත් රටේ බෙදුම්වාදය, ජාතිවාදය, වර්ගවාදය, අන්තවාදය ඇති වන විධියේ යෝජනාවලට එකඟ වනවා නම් අපි බොහොම පැහැදිලිව මෙහෙම කියනවා. අපේ පිලේ අපේක්ෂකයා වන ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කිසි විටෙකත් මේ රට කඩන, බෙදන, සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ආදී සියලු කොටස් අතර සමගිය නැති කරන, මේ රට නැවත ලේ විලක් කරන කිසිම පියවරක් ගැනීමට එකඟතාව පළ නොකරන අතර, අපේ රට කඩන්නේ නැතිව, බෙදන්නේ නැතිව, සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් කියන සියලු ජනයාට කැමති තැනක ජීවත් වෙන්න හා ජීවනෝපාය සලසා ගන්න පුළුවන්, මනුෂ්‍යයන් අතර උතුම් මනුෂ්‍යකම පදනම් වෙච්ච, එක රටක් හා එක නීතියක් තුළ මේ රට ගොඩ නැඟීම සඳහා නව නායකත්වයක් හා දැක්මක් සහිත වැඩ පිළිවෙළක් ඇති නායකයා ලෙස 16 වැනිදා නියත වශයෙන් ජයග්‍රහණය කරන බව මා මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. ජයග්‍රහණය කිරීමෙන් පසු ඕනෑම පාර්ශ්වයක තිබෙන දුක්ගැනවිලිවලට සාධාරණ හා යුක්ති සහගත විසඳුම් ලබා දීමට ජනාධිපති ධුරයට පත් වන අපේ ගෝඨාභය රාජපක්ෂ මහතා රට වෙනුවෙන් ක්‍රියා කරනවාය කියන ටික සඳහන් කරමින් මගේ යෝජනාව මෙයින් අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Next, the Hon. Sisira Jayakody to second the Adjournment Motion.

[අ.භා.2.22]

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරපු සභාව කල් තැබීමේ යෝජනාව මා ස්ථිර කරනවා. විශේෂයෙන්ම අන්තවාදී, ජාතිවාදී බලවේගවල වුවමනාව මත ඉදිරිපත් කරපු යෝජනාවලට එකඟතාව දක්වමින් ඔවුන්ගේ සහයෝගය දිනා ගැනීම සඳහා වර්තමාන රජය කටයුතු කරන බව ඉතාම පැහැදිලියි. මේ ආණ්ඩුව රටේ ආර්ථිකය බංකොලොත් කරලා, රටේ ජාතික ආරක්ෂාව විනාශ කරලා, මහ පොළොව නුහුලන මහ බැංකු හොරකම් වැනි අපරාධ කරමින් අවුරුදු හතර හමාරක් තිස්සේම කළේ මේ අන්තවාදී, ජාතිවාදී වුවමනා ඉෂ්ට කිරීම සඳහා මේ පාර්ලිමේන්තුව මෙහෙය වීමයි. මේ පාර්ලිමේන්තුව තුළ ඒකීයභාවය විනාශ කිරීමටත්, රට තුළ අන්තවාදීන්ගේ වුවමනා ඉෂ්ට කිරීම සඳහාත් වූ ව්‍යවස්ථා සම්පාදන වැඩසටහනක් තමයි වසර හතර හමාරක් තුළම කළේ. ඒ හදපු ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියේම දිගුවක් තමයි මේ දෙමළ ජාතික සන්ධානය ඉදිරිපත් කරලා තිබෙන යෝජනා මාලාව. අදාළ දේශපාලන පක්ෂ සජිත් ප්‍රේමදාස මැතිතුමාට සහාය පළ කරලා තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියටත්, මේ අන්තවාදී යෝජනාවලටත් මේ රටේ මහා සංඝ රත්නයත්, ඒ වාගේම මේ රටේ බහුතර ජනතාවත් පසුගිය කාල පරිච්ඡේදය තුළම විරෝධය පළ කළා. මේ සියල්ල කිරීමෙන් සමස්ත පාවාදීම කරලා, මේ රටට හතුරුකම කළා. අපි දන්නවා, එක්සත් ජාතික පක්ෂය බලයට පත් වුණු හැම දවසකම රටට මේ ද්‍රෝහී වැඩේ කළාය කියලා; උපන් මව් බිමට මේ විනාශය කළාය කියලා. එක්සත් ජාතික පක්ෂය ඡන්ද ලබා ගැනීමේ පටු බලාපොරොත්තුවෙන් රටට කරන්න පුළුවන් සියලු පාවාදීම් ඉතිහාසය තුළම කළා. අදත් ඒ ඡන්ද ප්‍රමාණය බලාපොරොත්තුවෙන් කටයුතු කරනවා. තමුන්නාන්සේලාට උතුරෙන් ඡන්ද ලැබෙයි. විශේෂයෙන්ම උතුරේ මධ්‍යස්ථ ද්‍රවිඩ තරුණයන් වෙනස් මතයකයි ඉන්නේ.

තමුන්නාන්සේලා සියලු පාවාදීම් කරලා අන්තවාදී, ජාතිවාදී කල්ලිවල ඡන්ද ලක්ෂ 3ක් ලබා ගනියි. හැබැයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ගම්පහ දිස්ත්‍රික්කයෙන් පමණක් වැඩි ඡන්ද ලක්ෂ 4ක් ලබාදීලා ජයග්‍රහණය මොකක්ද කියලා අපි පෙන්වනවා.

මම දන්නේ නැහැ, මේ රටට ආදරය කරන මිනිසුන්ට එක්සත් ජාතික පක්ෂය තුළ ඉන්න පුළුවන්ද කියලා. අද අන්තවාදී, ජාතිවාදී කල්ලි කිහිපයක් එක්සත් ජාතික පක්ෂයේ නායකයන් අත් අඩංගුවට අරගෙනයි තිබෙන්නේ. පසුගිය අවුරුදු හතරහමාර තුළ ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය පරාජය කරන්න අපට පුළුවන් වුණේ, "දින 51 ආණ්ඩුව" නිසායි. ඒ නිසා තමයි සමහර බටහිර රටවල් දින 51 ආණ්ඩුවට භයවෙලා තිබුණේ. මට මතකයි, ඒවාට විරුද්ධව ජනතා විමුක්ති පෙරමුණ විශ්වාස භංග යෝජනාවක් ගෙනැවිත් අධිකරණයට ගිය බව. හැබැයි මේ යෝජනාවලියේම දිගුවක් වන ඉඩම් විශේෂ විධිවිධාන පනත් කෙටුම්පතට විරුද්ධව අධිකරණයට යන්න ජනතා විමුක්ති පෙරමුණට බැහැ. ජනතා විමුක්ති පෙරමුණ ඒ සම්බන්ධයෙන් අධිකරණයට යන්නේ නැහැ. හැබැයි බටහිර තානාපති කාර්යාලවල අත් පොළසන් මධ්‍යයේ සුමන්තිරන් මැතිතුමා සමඟ එකතුවෙලා විශ්වාස භංග යෝජනාව භාර දෙනවා; ඒ සම්බන්ධයෙන් අධිකරණයටත් යනවා. ඒ නිසා අපට ප්‍රශ්නයක් මතු වෙනවා. ඒ ප්‍රශ්නය තමයි, ආණ්ඩුව තකහනියේ, කඩිමුඩියේ Millennium Challenge Corporation ගිවිසුමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාදීම. Millennium Challenge Corporation ගිවිසුම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය දීමේ සහතිකය තුළින්, දෙමළ ජාතික සන්ධානය ඉදිරිපත් කරන, විශේෂයෙන්ම උතුරේ අන්තවාදී කණ්ඩායම් ඉදිරිපත් කරන යෝජනා ඉෂ්ට කිරීම සඳහා ව්‍යංගයෙන් සෘජුව එකඟ වීමක් තිබෙනවා. Millennium Challenge Corporation ගිවිසුමේ සඳහන් වෙනවා, "එකී ආර්ථික කොරිඩෝව ජනවාර්ගික ගැටලුව ඇති වූ නගර දක්වා පුළුල් කළ හැකි වේ" කියලා. විදේශ මැදිහත් වීම්, විදේශ හමුදාමය මැදිහත් වීම් සිදු කිරීම සඳහා වූ ක්‍රියාදාමයට එකඟ වීම සඳහා වූ මේ යෝජනා 13ත්, Millennium Challenge Corporation ගිවිසුමත් එකට එක්ව සලකා බැලිය යුතුයි. අද පරාජයේ වියරුවෙන් බෙරෙන්න රටට කරන්න පුළුවන් තරම් ද්‍රෝහීකම් කරන්න මේ රටේ සමස්ත ජනයා, මේ රටේ බහුතර ජනයා ඉඩ දෙන්නේ නැහැ. මේ රටේ ඉතිහාසයේ අනාදිමත් කාලයක සිට පැවතෙන ඒකීයභාවය විනාශ කිරීමට දේශ ද්‍රෝහී පාලකයෝ කටයුතු කරනවා. ඉතිහාසයේ සිටම, ජිනීවා නුවරට ගිය දවසේ සිටම මංගල සමරවීර, රනිල් වික්‍රමසිංහ ඒ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඒ නිසා එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දෙන්න, ආත්ම ගරුත්වයක් තිබෙන, මේ මව් බිමට ආදරය කරන මිනිසුන් ඉන්න පුළුවන්ද කියලා මම දන්නේ නැහැ. මේ වාගේ අන්තවාදී බලවේගවල එල්ලිලා සිටින එක්සත් ජාතික පක්ෂය අද ඇත්තටම සුළු වාර්ගිකයන්ගේ පක්ෂයක් කියලා මම නැවත වතාවක් කියනවා. එක පැත්තකින් සහරාන්ලා -බෝම්බ පුපුරවන කණ්ඩායම්- ඔවුන් අත් අඩංගුවට ගෙන තිබෙනවා. අනික් පැත්තෙන් පැරණි කොටි නෂ්ටාවශේෂ ටික එක්සත් ජාතික පක්ෂය අත් අඩංගුවට ගෙන තිබෙනවා. මේ රටේ උතුරු පළාතේ හැර දකුණේ අනික් සියලු ප්‍රදේශවලින් එක්සත් ජාතික පක්ෂයට ලැබෙන්නේ සියයට 22කටත් වඩා අඩු ඡන්ද ප්‍රමාණයක්. අද ඒක ලියා තබාගන්න. මේ රටේ සමස්ත බහුතර ජනතාව බොහොම කනගාටුවකින් ඉන්නේ.

මේ රටේ නීතියක් නැහැ; විනයක් නැහැ; නිශ්චිත පාලන යන්ත්‍රයක් නැහැ. අන්තවාදය පෝෂණය කිරීම සඳහායි මේ ආණ්ඩුව කටයුතු කරන්නේ. මේ රටේ සංස්කෘතික උරුමයන් එළි පිට විනාශ කරන ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පරිවර්තනය වෙලායි තිබෙන්නේ.

ලංකා ඉතිහාසයේ සියලු රජවරු යුද්ධයක් අවසාන වුණාම ඒ වෙනුවෙන් සිහිවටනයක් හදනවා. ඒ නිසා තමයි දුටුගැමුණු රජ්ජුරුවෝ ජය කොන්තය තැන්පත් කරලා මිරිසවැටිය හැදුවේ. ඒ වාගේ මහින්ද රාජපක්ෂ මැතිතුමාත් රුවන්වැලි සෑයට එහා පැත්තේ සඳගිරි සෑය හදන්න පටන් ගත්තා. සඳගිරි සෑය හදන කොට ඒ සඳහා රන් බුදු පිළිමයක් නිර්මාණය කිරීම අවශ්‍ය වුණා. ඔබතුමන්ලා සියලුදෙනා දන්නවා නීත්‍යනුකූල අනුමැතිය ඇතිව ඒ රන් බුදු පිළිමයට රත්‍රන් ලබා දුන්නු රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සති ගණන්, මාස ගණන් හිරේ ඉන්න බව. හැබැයි, අප්‍රේල් 21 - පාස්කු දිනයේ- මේ රටේ කතෝලික ජනතාව ඉලක්ක කරගෙන එල්ල වුණු ප්‍රහාරයට සම්බන්ධ, බෝම්බ හදන්න තඹ දුන්නු ඊබ්‍රහිම් දවස් තුනෙන් නිදහස් කළා. ඒ නිසා මේ රටේ කතෝලික ජනතාවට තමුන්නාන්සේලා පිළිබඳව තිබෙන්නේ වෛරයක්; ක්‍රෝධයක්. ඊබ්‍රහිම්ට දවස් තුනෙන් ඇප දෙනවා. හැබැයි, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩ සිටින ස්ථානයට එහා පැත්තේ චෛත්‍ය හදන්න, රේගු අධ්‍යක්ෂ ජනරාල්තුමා තමාට පැවරී තිබෙන ව්‍යවස්ථාපිත බලතල යටතේ රත්‍රන් දුන්නාම මාස තුනක් හිරේ දමනවා. ඒ නිසා මේ ආණ්ඩුවට සහ පාලකයන්ට මේ රටේ මිනිස්සු ශාප කරනවා. මේ ආණ්ඩුව හැම දාමත් අන්තවාදීන් පෝෂණය කරමින්, ජාතික ආරක්ෂාව විනාශ කරමින් යනවා. තමුන්ගේ පැවැත්ම සඳහා මේ රටට කරන්න පුළුවන් බරපතළම හතුරුකම් ටික 30/1 දරන ජිනීවා යෝජනාව මඟින් සිද්ධ කළා. උතුරේ අන්තවාදී කල්ලි, කණ්ඩායම්වල වුවමනාව ඉටු කිරීම සඳහා අපේ රටේ අභිමානය දිගින් දිගටම කෙලෙසුවා. මේ රටේ සමහර මැති ඇමතිවරු ජනාධිපතිවරයා නොදැන එවැනි ගිවිසුම්වලට අත්සන් කළා. සටන් විරාම ගිවිසුමට අත්සන් කරන කොට හිටපු ජනාධිපතිතුමිය ඒ ගැන දන්නේ නැහැ. වර්තමාන ජිනීවා යෝජනාවලියට අත්සන් කරන කොටත් වර්තමාන ජනාධිපතිතුමා දන්නේ නැහැ. ඒ වාගේම තමයි වර්තමාන ජනාධිපතිතුමා සහ සමහර ඇමතිවරුන් විරුද්ධ වෙද්දී Millennium Challenge Corporaton ගිවිසුමට කැබිනට් අනුමැතිය ලබා ගන්නවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු ඉතිහාසයේ පටන්ම කුමන්ත්‍රණකාරී විධියටයි ගමන් කළේ.

අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ඕනෑම කෙනකුට ඕනෑම භූමියක නිදහසේ ජීවත් වීමට හැකි පරිසරය සකස් කරලායි තිබෙන්නේ. හැබැයි, ඔබතුමන්ලා දන්නවා, 2017 වර්ෂය වන විට අපේ රටට ආපු අනවසර සංක්‍රමණිකයන් දාහතරදහසින් නවදහස් අටසියයක් වීසා රහිතව හොරෙන් හැංගිලා ඉන්න බව. හැබැයි, ඒවාට එරෙහිව නීති නැහැ.

ඊළඟට විනිමය පාලන පනත ඉවත් කරලා 2017 අංක 12 දරන විදේශ විනිමය පනත ගෙනාවා. රවි කරුණානායකලාට නිදහස් වෙන්නයි ඒක කළේ. ඒ පනත නිසා කෝටි ප්‍රකෝටි ගණන් මුදල් අන්තවාදී, ත්‍රස්තවාදී කල්ලිවල ගිණුම්වලට ආවා; සහරාන්ලාගේ ගිණුම්වලට ආවා. හැබැයි, තමුන්නාන්සේලා ඒවා ගැන පරීක්ෂණ කළේ නැහැ. අපි දන්නවා සහරාන්ලාගේ ගිණුම්වලට සල්ලි ආපු හැටි. හිස්බුල්ලාට අයත් යැයි කියන සරසවියට 2017දී කෝටි හාරසිය හතළිහක් ලැබී තිබෙනවා. මහ බැංකු අධිපතිතුමා කියනවා, "විදේශ විනිමය පනත ගෙනාපු නීති නිසා, මේ ආණ්ඩුවෙන් කරපු ඒ දේශ ද්‍රෝහී කටයුත්ත නිසා අපට පරීක්ෂණයක් කරන්න විධියක් නැහැ" කියලා. ඒ විතරක් නොවෙයි. උතුරේ අන්තවාදීන් පෝෂණය කරන්නත් විදේශ මුදල් ලැබෙනවා.

ඔබතුමන්ලාගේ මහ බැංකු වාර්තාව බලන්න. ඒකේ කියන විධියට ආජන්ටිනාවේ බුවනෝස් අයර්ස් හි පැවැති සමුළුවේදී

[ගරු සිසිර ජයකොඩි මහතා]

අපේ රට අසාධු ලේඛනයට ඇතුළත් කර තිබෙනවා, අන්තවාදයට, ත්‍රස්තවාදයට, මුදල් ලැබීම් අතින් ඉහළම තත්ත්වයේ තිබෙන රටක් නිසා. ඒ නිසා අපි ගිනි ගත්ත දේශයකයි ඉන්නේ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබෙන හැම වෙලාවකම මේ වාගේ ද්‍රෝහිකම් මේ රටට කරනවා. එක්සත් ජාතික පක්ෂය මේ රටට හැම දාම මේ ද්‍රෝහිකම කරනවා. ඒ අවනඩුව තමයි අපට කියන්නේ තිබෙන්නේ. අපි මේ පාර්ලිමේන්තුවේ ඕනෑ නම් තව දවස් කිහිපයක් ඉඳීවි. එතැනින් එහාට අප දේශපාලනය කරන්නත් පුළුවන්, නොකරන්නත් පුළුවන්. හැබැයි, මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ඉඳගෙන ඉන්න අය අද අන්තවාදීන් කිහිප දෙනෙකු අතේ නැටවෙනවා. ඩී.එස්. සේනානායක මහත්මයා හදාපු එක්සත් ජාතික පක්ෂයේ උදවිය ලජ්ජා වෙන්න ඕනෑ, අන්තවාදීන්ට ඕනෑ විධියට නැටවෙන එක ගැන. ඡන්ද ටිකක් ගන්න අන්තවාදී ඉල්ලීම්වලට එකඟ වන කුහක ප්‍රතිපත්තියෙන් ඇත් නොවන තාක්කල් එක්සත් ජාතික පක්ෂයට පැවැත්මක් නැහැ.

එක පැත්තකින් අපේ භූමි ප්‍රදේශය අත්පත් කර ගනිමින් සිටිනවා; තවත් පැත්තකින් සංක්‍රමණිකයින් පැමිණෙනවා; අනෙක් පැත්තෙන් මූල්‍ය රීති, රෙගුලාසි ඉවත් කිරීම පදනම් කරගෙන, විනිමය නීති ලිහිල් කිරීම මත අන්තවාදී කල්ලි කණ්ඩායම්වල ගිණුම්වලට මුදල් එනවා. කොහේද මේ රටේ නීතිය? කොතැනද මේ රටේ නීතිය? කාටද මේවා කියන්නේ? මේ පාර්ලිමේන්තුවටද අපි මේවා කියන්නේ? මේවා ග්‍රහණය කරගෙන ඉන්නේ කවුද? පසුගිය කාල පරිච්ඡේදය පුරාම මේ උපක්‍රමය ගෙන ගියා. ව්‍යවස්ථාදායක සභාව හැසිරෙව්වේ කවුද, කාට ඕනෑ විධියටද? අන්තවාදීන්ට අවශ්‍ය පරිදි තමයි රටේ සියලු පද්ධති වෙනස් කළේ; බිලිගත්තේ. පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට නඩු ඉදිරිපත් වෙලා තිබෙනවා; තීන්දු දීලා නැහැ. බළලා මල්ලෙන් එළියට පනිනවා වාගේ, තමුන්නාන්සේලා "ස්වාධීනයි" කියපු, පරසක්වළ ගහපු, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ වැටුප් වැඩි කරලා පූජනීය තත්ත්වයට පත් කළා. හැබැයි, තමුන්නාන්සේලාගේ ආත්ම ගරුත්වය කෙලෙසුවා. අර්ජුන මහේන්ද්‍රන්, රනිල් වික්‍රමසිංහ, රාජිත සේනාරත්න, පාඨලී චම්පික රණවක, අනුර කුමාර දිසානායක එකතු වෙලා තමයි දූෂණ විරෝධී කොමිසමේ ඉඳගෙන උපදෙස් දුන්නේ, දේශපාලන පළිගැනීම් මත, වෛරය මත අපේ රටේ සමහර තැනැත්තන්ට විරුද්ධව නඩු පවරන්න. මේ නඩු පැවරීම අවශ්‍ය වන්නේ සුමන්තිරන් මන්ත්‍රීතුමාටයි. මේ නඩු පවරන්න සුමන්තිරන් මන්ත්‍රීතුමාට අවශ්‍යයි; දෙමළ ජාතික සන්ධානයට අවශ්‍යයි. ඔවුන්ට වාඩුවක් තිබෙනවා ගන්න, යුද්ධය නිම කළ රණ විරුවන්ට විරුද්ධව, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට විරුද්ධව, මහින්ද රාජපක්ෂ මැතිතුමාට විරුද්ධව. ඒ වාඩුව තමයි ගන්නේ. හැබැයි ඒ වාඩුව ගන්න මේ රටේ, මේ මහ පොළොවේ උපන්න මේ මහ ජනතාව ඉඩ දෙන්නේ නැහැ. අන්තවාදයට, ජාතිවාදී කල්ලියක ග්‍රහණයට එක්සත් ජාතික පක්ෂය නතු වුණාට මේ රටේ මේ මාතෘ භූමියට ආදරය කරන සියලුදෙනා එයට ඉඩ දෙන්නේ නැහැ. මේ වාගේ කොන්දේසි ඉදිරිපත් කරනවා නම්, Millennium Challenge Corporation ගිවිසුම වාගේ මේ රටට හානිකර ගිවිසුම් ඇති කරනවා නම්, අන්තවාදී බලවේගවලට අවශ්‍ය පරිදි නීති සකසනවා නම්, මේ පාර්ලිමේන්තුව ඒ සඳහා අවශ්‍ය ඉඩකඩ සලසනවා නම්, පසුගිය අවුරුදු හතරහමාරම පාර්ලිමේන්තුව ගෙන ගියේ, නීති සම්පාදනය කළේ, වැඩ පිළිවෙළ ගෙන ගියේ අන්තවාදී යෝජනා අරමුණු කරගෙන නම් මේ රටට යන කල දසාව මොකක්ද? ඒක මේ රටේ ජනතාව තේරුම් අරගෙන ඉවරයි. ඒ නිසා අපේ රටේ ජනයා අද තීරණය කරලා තිබෙනවා, එක්සත් ජාතික පක්ෂයට ඉතිහාසයේ දැවැන්තම පරාජය එල්ල කරන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ සඳහා රටේ ජනයා පෙළ ගැහිලා සිටින බව මතක් කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා.

[අ.භා.2.36]

**ගරු මුජිබූර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ විවාදයට සහභාගි වීමට අවස්ථාව ලබා දීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඊයේ-පෙරේදා කරළියට ආපු MCC යෝජනාව සහ උතුරු-නැඟෙනහිර ප්‍රදේශ සම්බන්ධව තිබෙන යෝජනා සම්බන්ධයෙන් මේ රජයේ ස්ථාවරය පිළිබඳව තමයි එතුමා මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා මෙය ඉදිරියේදී පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය ඉලක්ක කොටගෙන ඉදිරිපත් කළ යෝජනාවක් බව බැලූ බැල්මට අපට පෙනෙනවා. මට කලින් කථා කළ ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා සභාවෙන් පිටතට ගියා. මේ MCC - Millennium Challenge Corporation - ගිවිසුම ගැන අද වන විට අපේ පැත්තෙන් තරග කරන අපේක්ෂකතුමා නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා, ඡන්දය ඉවර වෙනකල් එම ගිවිසුම අත්සන් කරන්නේ නැහැ, ඒ වාගේම ඡන්දයෙන් පසුවත් එම ගිවිසුම ගැන අධ්‍යයනය කරලා තමයි තීන්දුවක් ගන්නේ කියලා. මේ සභාවේ විරුද්ධ පක්ෂයේ ඉන්න උදවිය නැවත වතාවක් මේ පිළිබඳව අවධානය යොමු කළා.

උතුරු-නැඟෙනහිර ඉන්න යම් දේශපාලන සංවිධාන විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගැනත් මේ සභාවේදී සාකච්ඡා වුණා. ඒ ගැනත් මා කියන්න ඕනෑ. අද වන විට උතුරු-නැඟෙනහිර නියෝජනය කරන යම් යම් දේශපාලන සංවිධාන වෙන්න පුළුවන්, පක්ෂ වෙන්න පුළුවන්, ඔවුන් ඉදිරිපත් කරලා තිබෙන කිසිදු යෝජනාවකට අනුමැතියවත්, එකඟත්වයවත් සජිත් ප්‍රේමදාස මැතිතුමා -අපේ පැත්තෙන් ඉදිරිපත් වන ජනාධිපති අපේක්ෂකතුමා- ලබා දීලා නැහැ. අද TNA සංවිධානය පවා පැහැදිලිව ප්‍රකාශ කළා, කිසිම කොන්දේසියක් නැතුව තමයි මෙම මැතිවරණයේ දී සජිත් ප්‍රේමදාස මැතිතුමාට සහයෝගය ලබා දෙන්නේ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනාධිපතිවරණයක් ආපු හැම වෙලාවේම විරුද්ධ පක්ෂයේ ඉන්න උදවිය මෙම කාරණාව මතු කරනවා. මේක අලුත් දෙයක් නොවෙයි. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ඡන්දය ඉල්ලනකොටත් මේ වාගේම වේදිකාවල කියවාගෙන ගියා. "ඔන්න රට කඩන්න යනවා, උතුරු නැඟෙනහිර එක් කරන්න හදනවා, ඔවුන්ට ස්වයං තීරණ අයිතිය දෙන්න යනවා" කියලා තමයි 2015 දීත් එතුමන්ලාගේ වේදිකාවේ බෙරිහන් දුන්නේ. 2015දී ඡන්දය ජයග්‍රහණය කරලා අද වෙනකොට අපි අවුරුදු හතරහමාරක් ඇවිල්ලා තිබෙනවා. උතුරු නැඟෙනහිර එක් වුණෙත් නැහැ, ඔවුන්ට ස්වයං තීරණ අයිතිය ලැබුණෙත් නැහැ, ඔවුන් කියපු එකක්වත් වුණෙත් නැහැ. නමුත්, මේ රටේ උතුරේ ජනතාව, නැඟෙනහිර ජනතාව මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට ඡන්දය පාවිච්චි කළා. එදා සිවාජිලිංගම් මහතා ඔවුන්ගේ ජනාධිපති අපේක්ෂකයා විධියට ඉදිරිපත් වෙනකොටත් -ද්‍රවිඩ ජාතිකයෙක් ඉදිරිපත් වුණත්- ඒ ද්‍රවිඩ ජාතිකයාට ඡන්දය නොදී පොළොන්නරුවේ හිටපු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඡන්දය දුන්නා. ඒ කාරණය ගැන අපි ආඩම්බර වෙන්නට ඕනෑ. ඒ වාගේම අපි සන්තෝෂ වෙන්නට ඕනෑ. මොකද, සිවාජිලිංගම් වාගේ අය ජනාධිපති අපේක්ෂක ලෙස ඉදිරිපත් වී තිබියදී, උතුරු නැඟෙනහිර ජනතාව දකුණෙන් ඉදිරිපත් වුණු සිංහල නායකයෙකුට ඡන්දය දුන්නාය කියන එක හොඳ ප්‍රවණතාවක්. ඒක තමයි අපි හදාගන්න ඕනෑ ප්‍රවණතාව. අද මේ කථා කරන

මහත්තුරු ඔක්කෝම එදාත් ඒ ප්‍රවණතාවට විරුද්ධව මේ කථාවම කළා. "රට කඩන්න යනවා, බෙදන්න යනවා, රට ඉවරයි, මෛත්‍රීපාල ඇවිල්ලා උතුරු නැඟෙනහිර එක්කරන්න යනවා" මෙන්න මේ වාගේ පට්ටපල් බොරු දකුණේ ජනතාව ඉදිරියට ගිහිල්ලා, දකුණේ ජනතාවගේ ඇස් නිලංකාර වෙන කථා කියලා, ජාතිවාදය අවුස්සලා ඡන්දය ගන්න පුළුවන්ද කියලා බලනවා. එදා ඒ උත්සාහය බංකොලොත් වුණා. එහෙම කිව්වත් 2015දී ඒ අය පැරදුණා. 2019, මෙම ඡන්ද ව්‍යාපාරයටත් දැන් නැවතත් ඒ කථාව ගෙනැල්ලා කරකවන්න පුළුවන්ද කියලා බලනවා. මොකද, අපි දන්නවා හැම දාම බංකොලොත් වුණු දේශපාලනඥයන්ට තිබෙන එකම අවිය තමයි "ජාතිවාදය". ඒ අය ප්‍රතිපත්ති ගැන කථා කරන්නේ නැහැ. ඔය දේශප්‍රේමීන් කියන්නේ, මේ රටට ආදරය කරන අයට ඡන්දය දෙන්න කියලා නේ. ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා කිව්වා, මේ රටට ආදරය කරන කෙනෙකුට ඡන්දය දෙන්න කියලා. මේ රටට ආදයර කරනවා කියලා ඒ ගොල්ලෝ කවුරුන් ගැනද කියන්නේ? ඇමෙරිකානු පුරවැසියාට ඔහුගේ නෝනාගේ ඡන්දයවත්, දරුවාගේ ඡන්දයවත් ලැබෙන්නේ නැහැ. ඔහුට තමයි ඡන්දය දෙන්න කියලා මේ කියන්නේ. ඔහුගේ නෝනයි, දරුවයි ඡන්දය දෙන්නේ ඩොනල්ඩ් ට්‍රම්ප්ට. තමන්ගේ මහත්තයාට පක්ෂව ඡන්දය දෙන්න බැහැ. තව මාස තුනකින් ඇමෙරිකාවේ ජනාධිපතිවරණය එනවා. ඔහුගේ නෝනාටයි, දරුවාටයි ඇමෙරිකාවේ ජනාධිපතිවරණයේ දී ඡන්දය දෙන්න පුළුවන්. ඒ දෙදෙනාම ලංකාවේ පුරවැසියෝ නොවෙයි. තමුන්නාන්සේලා දේශප්‍රේමීත්වය ගැන කථා කරනවා නම්, මේ රටට ආදරය කරන අපේක්ෂකයෙක් ගැන කථා කරනවා නම්, තමුන්නාන්සේලාගේ අපේක්ෂකතුමාට ඉස්සෙල්ලාම කියන්න ඕනෑ, තමන්ගේ නෝනාටයි, දරුවාටයි ලංකාවේ පුරවැසිභාවය අරගෙන දෙන්න කියලා. ඒක කියන්නේ නැතුව මෙතනැට ඇවිල්ලා බයිලා කියනවා, රටට ආදරය කරන මිනිහෙකුට ඡන්දය දෙන්න කියලා. රටට ආදරයක් තිබෙන මිනිහෙක් තමයි සජිත් ප්‍රේමදාස මැතිතුමා. එතුමා වෙනත් රටවල්වලට ගිහිල්ලා පුරවැසිභාවය ගත්තේ නැහැ. එතුමාගේ නෝනාට වෙනත් රටක පුරවැසිභාවයක් නැහැ. එතුමා දිනුවත් පැරදුණත් මේ රටේ ජීවත් වෙනවා. එහෙම බැලුවාම දැන් මේ ඔක්කෝම දේවල් පටලවාගෙන තිබෙන්නේ. මොකක්ද කියන්නේ, මොනවාද කථා කරන්නේ කියලා තේරෙන්නේ නැහැ.

දැන් දේශප්‍රේමීත්වය ගැන කථා කරනවා. එහෙම නම්, හමුදා මූලස්ථානය තිබුණු Galle Face එකේ ඉඩම පැය 24න් සින්නක්කරව වික්කේ කවුද? ඔය දේශප්‍රේමී කියන නායකයා නේද එදා ඒක වික්කේ? මහ මුහුදෙන් අක්කර 500ක් චීන්නුන්ට සින්නක්කරව වික්කේ කවුද? අපිද වික්කේ? නැහැ, ඔය දේශප්‍රේමී නායකයා තමයි වික්කේ. තමුන්නාන්සේලා ඔය කියන රටට ආදරය කරන නායකයා තමයි හමුදා මූලස්ථානය තිබුණු ඉඩම ෂැංග්‍රි-ලා සමාගමට සින්නක්කරව වික්කේ. හමුදාවට තවමත් මූලස්ථානයක් නැහැ. කුලී ගොඩනැඟිලිවල තමයි හමුදා මූලස්ථානය තිබෙන්නේ. නමුත් අද ඇවිල්ලා දේශප්‍රේමීත්වය ගැන කථා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට මේ ගොල්ලෝ අන්තවාදය ගැන කථා කරනවා. අපි අන්තවාදයට යටවෙලා ඉන්නවා ලු. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔය වගේ අන්තවාදී කතා කියනකොට අපි විශේෂයෙන්ම අහන්නට ඕනෑ, TNA සංවිධානයේ නායක සම්පන්දන් මැතිතුමා පසුගිය අවුරුදු හතරහමාර තුළම මේ පාර්ලිමේන්තුවේ දී මොනවාද කථා කළේ කියලා. මේ රටේ ද්‍රවිඩ ජනතාව විසින් මේ රටේ සිංහල ජනතාවගේ විශ්වාසය දිනාගන්න ඕනෑ කියලා එතුමා කිව්වා. ඒ විශ්වාසය හරහා තමයි මේ රටට දේශපාලන විසඳුමක් ගෙනෙන්න පුළුවන් වෙන්නේ කියලා එතුමා කිව්වා. නිදහස් දිනයේ එතුමා යාපනයට ගිහිල්ලා අපේ ජාතික කොඩිය එසවුවා. ජාතික කොඩිය ඔසවලා එතුමා පෙන්නුවා, එතුමා ශ්‍රී ලාංකිකයෙක් කියන එක. සම්පන්දන් මැතිතුමා එය පිළිගත්තා. මේ පාර්ලිමේන්තුවේ හැම දාම එතුමාගේ කථා අහනකොට අපට පෙනුණා, එතුමා ශ්‍රී ලාංකිකයකු හැටියට කථා කළ බව. මේ රට කඩන්න, රට බෙදන්න, මේ රට දෙකට තුනට වෙන් කරන්න, දෙමළ අන්තවාදය පෝෂණය කරන්න සම්පන්දන් මැතිතුමා මේ පාර්ලිමේන්තුව තුළ මේ අවුරුදු හතරහමාර තුළ එකම කථාවක්වත් කළේ නැහැ. නමුත් තමුන්නාන්සේලාත් එක්ක එකතු වෙලා ඉන්න උදවිය කවුද? සම්පන්දන් මැතිතුමා ජාතික කොඩිය ඔසවනකොට තමුන්නාන්සේලාගේ පෙරමුණට ගත්තේ කවුද? ඊළාම් කොඩිය ඔසවපු වර්ධරාජා පෙරුමාල් අද ඉන්නවා තමුන්නාන්සේලාගේ වේදිකාවේ. අද ඔහු ඉන්නවා, ගෝඨාභය රාජපක්ෂත් එක්ක. එදා අනූ ගණන්වල මේ රටේ ඊළාම් රාජ්‍යයක් හැටියට උතුරු නැඟෙනහිර ප්‍රකාශයට පත් කරපු ඊළාම් කොඩිය ඔසවපු වර්ධරාජා පෙරුමාල් ඉන්නවා, ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ වේදිකාවේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

மாண்புமிகு உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் இரண்டு நிமிடங்கள் உள்ளன.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

உங்களுடைய விடயம் சம்பந்தமாகத்தான் பேசுகிறேன். இன்னும் கொஞ்சம் கூடுதலாக time தாருங்கள்.

ඊළඟට, කවුද? හිස්බුල්ලා මැතිතුමා. සහරාන් එක්ක ගිවිසුම අත්සන් කළා. එතුමා කොහේද ඉන්නේ? එතුමා ඉන්නෙත් ගෝඨාභය රාජපක්ෂට සහයෝගය දෙන්න. එතුමා ඡන්දය ඉල්ලන්නේත් ඒකයි. එතුමාගේ දෙවැනි මනාපය හම්බ වෙන්නේ ගෝඨාභයට. එතුමා ඒ බව පැහැදිලිවම කිව්වා. එතුමාගේ මැතිවරණ වේදිකාවල ප්‍රතිපත්ති ප්‍රකාශනය නිකුත් කරනකොට කිව්වා, දෙවැනි මනාපය ගෝඨාභයට දෙන්න කියලා. සහරාන් එක්ක කාත්තන්කුඩියේ ගිවිසුම් අත්සන් කරපු හිස්බුල්ලා කාගේ වේදිකාවේද ඉන්නේ? ඉන්නේ ගෝඨාභයගේ වේදිකාවේ. ඊළඟට, පසුගිය කාලයේ මේ රටේ බෝම්බ පිපිරෙන්න කලිනුත්, බෝම්බ පිපිරුණාට පසුවත් මේ රටේ වර්ගවාදය, සැකය, අවිශ්වාසය, ජාතීන් අතර ප්‍රශ්න ඇති කරන්න, ජාතීන් අතර ඇන කොටා ගැනීම් ඇති කරන්න, ඒ සියලු දේවල් කරන්න කටයුතු කරපු ඒ නායකයෝ ටික ඉන්නේ කාගේ වේදිකාවේද? ඒ ඉන්නෙත් ගෝඨාභය මහත්මයාගේ වේදිකාවේ.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Ananda Aluthgamage, what is your point of Order?

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුජිබුර් රහුමාන් මැතිතුමා දෙවැනි මනාපයක් ගැන කිව්වා. ගරු සභාවට මා

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

කියනවා, රටටම කියනවා, අපි දෙවැනි මනාපයක් ගැන කථා කරලා නැහැ කියන කාරණය. ඒ වාගේම ගෝඨාභය මැතිතුමාට දෙවැනි මනාපයක් ගණන් කරන්න අපි ඉඩ තියන්නේ නැහැ. වන්ෂොට් ගහලා අපි ගේම finish කරනවා. [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் பேசலாம்.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එකේ point එකක් නම් නැහැ, Order එකක් නම් තියෙනවා. මොකද, හිස්බුල්ලා මැතිතුමා තමයි කිව්වේ ගෝඨාභය මහත්මයාට දෙවැනි ඡන්දය දෙන්න කියලා. එහෙම කිව්වේ ඇයි කියලා දන්නවාද? [බාධා කිරීමක්]

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அளுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ඔබතුමාගේ මස්සිනා ද?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මගේ මස්සිනා නම් නොවෙයි. අම්මෝ! නැහැ. මගේ ළඟින් ගෑවිලාවත් නැහැ. නමුත් එතුමා තමයි කිව්වේ. මොකද, එතුමාට ඡන්දය ඉල්ලන්න කිව්වේ මහින්ද රාජපක්ෂ මැතිතුමා. ඔබතුමා ඒක දන්නවාද? ඔබතුමා දැන ගන්න, හිස්බුල්ලා මැතිතුමා සහ මහින්ද රාජපක්ෂ මැතිතුමා සාකච්ඡාවක් තියලා හිස්බුල්ලා ලෑස්ති වුණා, ගෝඨාභය රාජපක්ෂත් එක්ක මේ මැතිවරණ ව්‍යාපාරයට යන්න. නමුත් මහින්ද රාජපක්ෂ මහත්තයා කිව්වා, "ඔබතුමා මේ ඡන්දයේ දී ගන්න බැහැ, ඔබතුමා මේ ඡන්දයේදී වෙනම ඉල්ලන්න, සජිත් ප්‍රේමදාසට එන මුස්ලිම් ඡන්ද ටික නවත්වන්න ඉදිරිපත් වෙන්න" කියලා. "ඔබතුමා පාර්ලිමේන්තු මැතිවරණයේ දී ගන්නම්" කියලා කිව්වා. [බාධා කිරීමක්] මහින්ද රාජපක්ෂ මහත්මයායි, හිස්බුල්ලා මැතිතුමායි සාකච්ඡා වෙච්ච දේ ඒකයි.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அளுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ඔබතුමා අසත්‍ය ප්‍රකාශ කරනවා. රට ජාතිය නොමඟ යවනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
කිසිම බොරුවක් නැහැ. ගරු මන්ත්‍රීතුමා, වාඩිවෙන්න කෝ. [බාධා කිරීමක්] මන්ත්‍රීතුමා, වාඩි වෙන්න කෝ. දිනනවා නම්, ඔහොම කෑ ගහන්න එපා. වාඩි වෙන්න. මම මේ කිව්වේ, ඒ දෙන්නා අතර කරපු සාකච්ඡාව ගැන අප දැන ගත් තොරතුරු. මොකද, අද හිස්බුල්ලා මැතිතුමා ඉදිරිපත් වෙලා ඉන්නේ වෙන මොකකටවත් නොවෙයි. සජිත් ප්‍රේමදාස මැතිතුමාට හම්බ වෙන මුස්ලිම් ඡන්දවලින් ටිකක් හරි එතුමාට කඩා ගන්න පුළුවන්ද බලන කොන්ත්‍රාත්තුවක් තමයි එතුමා කරන්නේ. මොකද, එතුමාට දිනන්න බැහැ නේ. හිස්බුල්ලාට දිනන්න පුළුවන්ද? දිනන්න බැහැ. එහෙම නම්, මොකටද ඡන්දය ඉල්ලන්නේ? මොකක්ද තියෙන වුවමනාව? වුවමනාව තමයි සජිත් ප්‍රේමදාස මහත්මයාට එන මුස්ලිම් ඡන්දවලින් 15,000ක්, 20,000ක් හෝ අඩු කර ගන්න පුළුවන්ද කියන එක.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அளுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
අනුර කුමාර දිසානායක ඡන්දය ඉල්ලන්නේ ඇයි?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒක අනුර කුමාරගෙන් අහගන්න කෝ. [බාධා කිරීමක්] ඒක අහන්න, අනුර කුමාරගෙන්. මගෙන් ඇහුවේ හිස්බුල්ලා ගැන නේ. [බාධා කිරීමක්] මම හිස්බුල්ලා ගැන කියන්නම්. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ඡන්ද ව්‍යාපාරය තුළ අද මෙතුමන්ලාගේ පරාජය සහතික වෙලා තිබෙනවා.[බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා වාඩිවෙන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මෙතුමන්ලාගේ පරාජය සහතික වෙලා තිබෙනවා. පරාජය ඉවසාගන්න බැරුව තමයි මේ කෑ ගහන්නේ. ඔබතුමා අපේ පැත්තේ ඉඳලා නේ, විරුද්ධ පක්ෂය පැත්තට ගියේ. නොවැම්බර් 16වන දායින් පස්සේ නැවතත් ඔබතුමා අපේ පැත්තට එන්න ඉඩ තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
நீங்கள் உரையை நிறைவு செய்ய வேண்டும்.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
நான் எனது உரையை நிறைவு செய்கின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා සියලු ජන කොටස්වල පිළිගැනීමට ලක් වූ, සියලු ජන කොටස්වල ආකර්ෂණය දිනා ගන්න පුළුවන් වූ, සියලු ජන කොටස්වල විශ්වාසය දිනා ගන්න පුළුවන් වූ, සියලු දෙනාගේම ආදරයට පාත්‍ර වෙලා ඉන්න, ශ්‍රී ලාංකිකයන් හැටියට සියලුදෙනාම එකතු කරගෙන ගමනක් යන්න නායකත්වය දෙන්න පුළුවන් සජිත් ප්‍රේමදාස මැතිතුමා වටා උතුර, දකුණ, නැඟෙනහිර, කඳුකරය හා බටහිර සිටින සියලු ජන කොටස් අද ඒක රාශි වෙලා ඉන්නවා. ඒ ඒක රාශි වීම අද මෙතුමන්ලාට ඉවසා ගන්න බැරි වෙලා තිබෙනවා. එය ඉවසා ගන්න බැරි නිසා තමයි, මේ රටේ දකුණේ සමාජය තුළ උතුර ගැන වැරදි තොරතුරු දීලා, වැරදි දේවල් කියලා, නැවත දකුණේ සාමාන්‍ය ජනතාවගේ හැඟීම් අවුස්සලා තමන්ගේ ඡන්ද ව්‍යාපාරය ජය ගන්න පුළුවන්ද කියලා බලන ඉතාම පහත් උත්සාහයක මේ අය නිරත වෙලා සිටින්නේ.

අපට මේ රටේ ජනතාවට කියන්න තිබෙන්නේ මෙච්චරයි. අපි මේ අවුරුදු හතරහමාර තුළ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය හා නිදහස,

ඒ වාගේම මාධ්‍ය නිදහස ඇති කරලා, මේ රට ශක්තිමත් කරගෙන ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. දේශපාලන ප්‍රතිසංස්කරණ සිදු කරලා මේ රටේ සංහිඳියාව ඇති කරලා තිබෙනවා. ඒ සියලු දේවල් කරමින් මේ ආණ්ඩුව ඉස්සරහට ඇවිත් තිබෙනවා. අප්‍රේල් මාසයේ 21වන දා සිදු වූ බෝම්බ පිපිරීම් එක්ක අපේ රට යම් පසු බෑමකට ලක් වුණා. නමුත්, මේ රටේ ජනතාවට තේරිලා තිබෙනවා, සහරාන්ගේ බෝම්බ පිටු පස හිටපු කුමන්ත්‍රණකාරයෝ කවුද, ඒ බෝම්බ මෙහෙයවූයේ කවුද, සහරාන්ට පඩි ගෙව්වේ කවුද, සහරාන් නඩත්තු කළේ කවුද කියලා. අද ඒවා රටට හෙළිදරව් වෙලා තිබෙනවා.

2019 අප්‍රේල් 21වන දා සිදු වූ ප්‍රහාර පිළිබඳව සොයා බැලීමට පත් කළ විශේෂ කාරක සභාවට සාක්ෂි දෙන්න නාලක ද සිල්වා මැතිතුමා කැඳවා තිබුණා. එතුමා TID එකේ හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරයා. මා ළඟ දැන් තිබෙනවා, එම විශේෂ කාරක සභාවේ වාර්තාව. එම වාර්තාවේ 2 වෙළුම අරගෙන බලන්න. එහි පිටු අංක 111 සිට 135 දක්වා කොටසේ තිබෙනවා, එතුමා දුන්න කට උත්තරය. එතුමා කියන්නේ මොකක්ද? "මම සහරාන් අත්අඩංගුවට ගන්න සියලු ලියකියවිලි ලෑස්ති කරගෙන උසාවියට 'බී' වාර්තාව ඉදිරිපත් කරලා, කොළඹ අලුත්කඩේ උසාවියෙන් open warrant එකක් ගත්තා. ඒ open warrant එක ගන්න හදනකොට මා අත්අඩංගුවට ගන්නවා ගෝඨාභයයි, ජනාධිපතිතුමායි ඝාතනය කරන්න හැදුවා කියලා." කවුද මේ කියන්නේ? ත්‍රස්ත විමර්ශන අංශයේ හිටපු නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මැතිතුමා. එතුමා තමයි ඒ කටඋත්තරය දෙන්නේ. ඒ අනුව අපට පෙනෙනවා, දේශපාලන වුවමනාවක් මත කවුරු හෝ සහරාන් මෙහෙය වූ බව; සහරාන් පාවිච්චි කළ බව. තමන්ට බලයට එන්න පුළුවන් කෙටි මාර්ග අරගෙන, මේ රටේ ජනතාවගේ මළ මිනී උඩින් හෝ බලය ගන්න ඔවුන් උත්සාහ කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ සියලු අයට මේ රටේ ජනතාව මේ මාසයේ 16වන දාට පිළිතුරු ලබා දෙයි කියලා අපි විශ්වාස කරනවා. ස්තුතියි.

[අ.භා.2.51]

**ගරු ඩී.බී. හේරත් මහතා**
(மாண்புமிகு டீ.பி. ஹேரத்)
(The Hon. D. B. Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව සම්බන්ධව කථා කරන්න පෙර, මම මේ කාරණය කිව යුතුයි. ජාතියේ ඉරණම තීන්දු කරන දවස එළැඹෙන්න තිබෙන්නේ තව දවස් අටක් පමණයි. දැන් ජනාධිපතිවරණ වේදිකාව රත් වෙලා තිබෙන්නේ. මෙවැනි වෙලාවක, මේ රටේ ඉතිහාසය පුරාම ලැබූ අත්දැකීම් පදනම් කරගෙන, වර්තමාන දේශපාලන නායකත්වය රට ගොඩනඟන්න ආදර්ශවත්ව කටයුතු කළ යුතුයි. නමුත්, ජනාධිපති අපේක්ෂකවරුන් මේ වාගේ පටු මතවාද ඉදිරිපත් කරලා, සහතික ලබා ගැනීමට කටයුතු කිරීම පිළිබඳව අපි අතිශයින්ම කනගාටුවට පත් වනවා. හැබැයි, රට විනාශ කරන අවස්ථාවාදී දේශපාලන වුවමනා ඉටු කර ගන්න ඉදිරිපත් කරන එවැනි යෝජනා අපේ ජනාධිපති අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ක්ෂණයකින් ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව අප එක පැත්තකින් සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1948 පෙබරවාරි 04වන දා අප නිදහස ලබා ගන්නකොට, එදා ඉංග්‍රීසීන්ට එරෙහිව ඒ නිදහස් අරගලය වෙනුවෙන් කටයුතු කළ අපේ නායකවරුන්ට ජාති, ආගම් හා කුල මල භේදයක් තිබුණේ නැහැ. ඔවුන් හැමදෙනාම ශ්‍රී ලාංකිකත්වය වෙනුවෙන් එකතු වෙලා කටයුතු කරලා ආදර්ශයක් ලබා දුන්නා. නමුත් මේ දක්වා පැමිණි ගමන් මාර්ගය තුළ අප දකින්නේ එකිනෙකා ඈත කොටා ගන්නා, ජාතීන්, ආගම් හැටියට බෙදුණු, තම-තමන්ගේ වුවමනා ඉටු කරගන්න නායකයන් පත් කරන්න කටයුතු කරන ආකාරයක්. එය අතිශයින්ම ශෝචනීයයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ ජනාධිපතිවරණයේදී දෙමළ දේශපාලන පක්ෂ ඉදිරිපත් කර තිබෙන යෝජනාවලියේ සඳහන්, උතුර සහ නැඟෙනහිර පළාත් ඒකාබද්ධ කිරීම, ස්වයං තීරණ අයිතිය ලබා ගැනීම, ඒකීය රාජ්‍ය සංකල්පයෙන් බැහැර වීම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම වැනි කාරණා දෙස බැලුවාම, මේ රට බෙදීමේ ක්‍රියාවලිය තවත් පියවරකින් ඉහළට ඔසවා තැබීමේ වුවමනාවක් තමයි ඒවා තුළින් පෙනී යන්නේ. ඒ විතරක් නොවෙයි, එම යෝජනාවලියේ සඳහන් වන, මොරගහකන්ද ජල ව්‍යාපෘතිය වෙනුවෙන් වන්නි ප්‍රදේශයේ ස්ථාපිත සිංහල ජනාවාස ඉවත් කිරීම, උතුරු හා නැඟෙනහිර පළාත්වල සිංහල ජනපද පිහිටුවීම නැවැත්වීම, දෙමළ ජනතාවගේ නිජභූමි තුළ පුරාවිද්‍යා, වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් නැවැත්වීම වාගේම, පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ රැකියා ලබාදීමේදී එම පළාත්වල තරුණ තරුණියන්ට මූලිකත්වය ලබාදීම යනාදී කාරණා අවස්ථාවාදී දේශපාලන වුවමනා හැටියටයි අපි දකින්නේ.

දියුණු වන ලෝකයේ ජාතීන් හැටියට අප සියලුදෙනාම එකට එකතු වෙලා, විවිධ ආගම් අදහන අය එක තැනකට ඇවිල්ලා, මේ රට ගොඩනැඟීමේ වුවමනාව තමයි වර්තමානයේ තිබෙන්නේ. ඒ වෙනුවෙන් ඉදිරිපත් කරන යෝජනාවලිය ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් රට ගොඩ නඟන වැඩ පිළිවෙළ තුළ අපූරුවට ඉදිරිපත් කර තිබෙන වෙලාවක්, මේක. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ පැවැති යුද්ධයෙන් සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ආදී සියලු ජාතීන්වලට අයත් අතිවිශාල පිරිසක් නිරපරාදේ මිය ගියා. ඒ කාරණාවත් අපි මේ වේලාවේ අමතක නොකළ යුතුයි. ජනාධිපතිවරණයක් පිළිබඳව කථා කරන මෙවන් මොහොතක, අපි හැම දෙනාම රටට උචිත, විනාශ වුණු රටක් නැවත ගොඩනැඟීම උදෙසා සිදු කළ යුතු ක්‍රියාකාරකම්වලට තමයි අවධානය යොමු කළ යුත්තේ.

අප දන්නවා, පසුගිය අවුරුදු හතරහමාරක කාලය තිස්සේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මේ රට පාලනය කරලා මොනවාද කළේ කියලා. ඒ අය රටේ ජන ජීවිතය සහමුලින්ම අඩාළ කරලා, අනාගත දැක්මක් එක්ක මහින්ද රාජපක්ෂ මැතිතුමා අපූරුවට ගොඩනඟපු රට විනාශ කළා. තමන්ගේ ජනාධිපති අපේක්ෂකයා දිනවාගන්න, අවස්ථාවාදී පටු දේශපාලන මතවාද එක්ක එකට එක්කාසු වෙන්න ඔවුන්ට මේ වනවිට සිද්ධ වෙලා තිබෙනවා. ඒ අනුව තමයි, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ප්‍රතික්ෂේප කළ මේ යෝජනාවලිය දෝතින් භාරගෙන, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් ඉදිරිපත් වන අපේක්ෂකයා මේ කටයුතු කරන්නේ. ඔහු කටයුතු කරන ආකාරය බැලුවාම, අපි හැමදෙනාටම රටේ අනාගතය පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් ඇති වෙනවා.

ඊළඟට Millennium Challenge Corporation ගිවිසුම අරගෙන බලන්න. මේ සියල්ල ගත්තාම, ලංකාවේ අන්තවාදීන් එක්ක එකතු වෙලා කටයුතු කිරීම සහ ජාත්‍යන්තර වශයෙන් ඇමෙරිකාව වාගේ රටවලට මේ රට ගිල ගැනීමට තිබෙන වුවමනාවට ඉඩ සැලසීම වැනි කාරණාවලින් එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් ඉදිරිපත් වන අපේක්ෂකයාට බැහැර වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ සියලු කාරණාවලින් එහාට ගියාම, ඔවුන්ගේ දේශපාලන බංකොලොත්භාවය අපි තවදුරටත් දකින කාරණයක් තිබෙනවා. වර්තමානයේ ඔවුන්ගේ දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳව කථා කරනකොට, රටේ අනාගත දැක්ම පිළිබඳව ජනතාව දැනුවත් කරමින් සමාජ ප්‍රගමනය වෙනුවෙන් දැවැන්ත කාර්ය භාරයක් ඉටු කරන මාධ්‍ය ආයතනවලට පවා පහර එල්ල කරමින් කටයුතු කරනවා. එම ක්‍රියාකාරකම් දිහා බැලුවාම,

[ගරු ඩී.බී. හේරත් මහතා]

මේ රටේ අනාගතය ඔවුන් මොන පැත්තටද හරවන්නේ කියන කාරණය පිළිබඳව අපට බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. අපි දන්නවා, විශේෂයෙන් වර්තමානයේදී ආණ්ඩුවේ මාධ්‍ය ආයතන හැරුණු කොට, මේ වෙලාවේ අනෙක් සියලු මාධ්‍ය ආයතන ජනතාව වෙනුවෙන්, රට වෙනුවෙන් පෙළ ගැසී සිටින බව. පසුගිය අවුරුදු හතරහමාරක කාලය තුළ විනාශ කළ රට පිළිබඳව, ඒ වාගේම රටේ දුර්වලකම් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මාධ්‍ය ආයතනවල යුතුකම සහ වගකීමයි. ඒ යුතුකම සහ වගකීම මැනවින් ඉටු කළ "සිරස" මාධ්‍ය ආයතනයට ආණ්ඩුවේ ඇමතිවරුන් විවිධ, -

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of Order?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ඩී.බී. හේරත් මන්ත්‍රීතුමා ජනාධිපතිවරණය ගැන සඳහන් කළා. මේ විවාදය පවත්වන්නේ ජනාධිපතිවරණය ගැන නොවෙයි. නමුත් එතුමා ඒ ගැන සඳහන් කළ නිසා මම කාරණයක් අහන්න කැමැතියි. එතුමා නියෝජනය කරන පක්ෂයෙන් ඉදිරිපත් වන අපේක්ෂකයා ගෝඨාභය රාජපක්ෂ. ඔහු ලංකාවේ පුරවැසිකමත් හරියාකාරව අරගෙන නැහැ. ඒ නිසා ඔහු ලංකාවේ පුරවැසියෙකුත් නොවෙයි. ඔහු තවම ඇමෙරිකානු පුරවැසියෙක්. [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Member, you carry on.

**ගරු ඩී.බී. හේරත් මහතා**
(மாண்புமிகு டீ.பி. ஹேரத்)
(The Hon. D. B. Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උසාවියට ගිහිල්ලා [බාධා කිරීම්] උසාවියෙන් නීත්‍යනුකූලව ලංකාවේ පුරවැසියෙක් කියලා සනාථ වුණු කාරණාව [බාධා කිරීම්] මෙතුමාට වැරදිලා, - [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර වාඩිවෙන්න. [බාධා කිරීම්]

**ගරු ඩී.බී. හේරත් මහතා**
(மாண்புமிகு டீ.பி. ஹேரத்)
(The Hon. D. B. Herath)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ගමන නවත්වන්න මෙතුමන්ලා ගත් ඒ ක්‍රියාමාර්ග අතිශයින්ම කනගාටුදායක කාරණා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කියන්නේ, මේ රට ගොඩගන්න මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට උදවු කළ, යුද්ධයට නායකත්වය දුන් කෙනෙක්.

එතුමා එතැනින් නැවතුණේ නැහැ. එතුමා ජාතීන් අතර සමඟිය ඇති කරන්න, උතුරු - නැඟෙනහිර එකට සම්බන්ධ කරලා උතුර, දකුණ යා කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා. එහෙම කරනකොට, එක්සත් ජාතික පක්ෂයට ඕනෑ වුණා, එතුමා නීතියේ රැහැනට හසු කරන්න. ඒ නිසා විවිධ චෝදනා ඉදිරිපත් කරලා අධිකරණයට අරගෙන ගියා. අවසාන මොහොතේ අපට මතකයි, එතුමාගේ පුරවැසිකම පිළිබඳව තිබුණු ප්‍රශ්නය සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂය අධිකරණයට ගිය බව. ඒ චෝදනාව ප්‍රතික්ෂේප කරලා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ලංකාවේ පුරවැසියකු බව නීත්‍යනුකූලව ඔප්පු කරන්නට තරම් ඒ අධිකරණ විනිශ්චය ආසනය නිවැරදි තීන්දුවක් ගත්ත බව.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of Order?

**ගරුඅජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා අධිකරණයේ විභාග වන නඩුවක් ගැන සඳහන් කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම අභියාචනාධිකරණ තීන්දුවේදී, "වංචනිකව පුරවැසිභාවය ලබා ගැනීම පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සිදු කරන පරීක්ෂණය ඉදිරියට කරගෙන යන්න පුළුවන්. ඒකට බාධාවක් නැහැයි" කියලා සඳහන් කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා සම්පූර්ණයෙන්ම කරුණු වැරැදියටයි ඉදිරිපත් කරන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Member, you carry on with your speech.

**ගරු ඩී.බී. හේරත් මහතා**
(மாண்புமிகு டீ.பி. ஹேரத்)
(The Hon. D. B. Herath)
අධිකරණයේ විනිශ්චයට භාජන වූ කාරණාව සම්බන්ධව අධිකරණය දුන්න තීන්දුව, පිරිසිදු තීන්දුවක් පමණයි. මැතිවරණ කොමසාරිස්වරයා - [බාධා කිරීම්]

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அளுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of Order?

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அளுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ඇමතිතුමාගේ ඒ ප්‍රකාශය ගැන අපි බොහොම කනගාටු වනවා. උගත් නීතිඥතුමනි, ඔබතුමාට උසාවියට ගිහිල්ලා ඔය කාරණා කථා කරන්න තිබුණා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

That is not a point of Order. Hon. Member, you carry on with your speech.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அளுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

නීතිඥයකු විධියට ඔබතුමාට ඔය විධියට කථා කරන්න පුළුවන්ද? එතුමා නිදොස් කොට නිදහස් කළා.

**ගරු ඩී.බී. හේරත් මහතා**
(மாண்புமிகு டீ.பி. ஹேரத்)
(The Hon. D. B. Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ වාගේ කාරණා එක්ක වර්තමාන තත්ත්වය ගත්තාම, එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකත්වය දේශප්‍රේමීන්ගේ උදහසට ලක් වෙලා තිබෙනවා. ඔබතුමා දන්නවා, පසු ගිය කාල වකවානුව තුළ රණවිරුවන් දඩයම් කරන්න ජිනීවා නුවරට ගිහිල්ලා, ආණ්ඩුවේ ඇමතිවරු ඇමෙරිකාවත් එක්ක එකට එකතු වෙලා ගත්ත තීන්දු-තීරණ පිළිබඳව. ඒ වාගේම යුද්ධය සැහැල්ලු කරන්නට කටයුතු කළ ආකාරය, සොල්දාදුවන්ට හිරිහැර කරලා, බුද්ධි අංශ නිලධාරින් වාගේ අය මේ රටේ ආණ්ඩුවෙන් උදහසට ලක් කරපු ආකාරය. අවසානයේ ඒ සියලු කාරණාවල ප්‍රතිඵලය වුණේ, සහරාන්ලා නිර්මාණය කරලා, පූජනීය වශයෙන් වැදගත් වූ පාස්කු ඉරිදා දිනයේ කතෝලික බැතිමතුන් තුන් හාරසිය දෙනෙකුට මේ රටින් තුරන් වෙන්නට -මේ ආත්මයෙන් සමු ගන්නට- සිද්ධ වුණ එක. එහිදී 500කට වැඩි පිරිසක් තුවාල ලැබුවා. අද එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා මෙහෙම කියනවා නම්, ඒ අපේක්ෂකතුමාගේ දෙපැත්තේ කවුද ඉන්නේ? සහරාන්ලා පෝෂණය කරපු රිසාඩ් බදියුදීන් ඇමතිවරයාගේ වනාතවිල්ලුවේ තිබුණු වත්තේ පුපුරණ ද්‍රව්‍යයත් එක්ක මේ ගොල්ලන් අහු වුණේ නැද්ද? ඒ වාගේම මාවනැල්ලේ බුදු පිළිමවලට ගහනකොට මේ ගොල්ලන් සම්බන්ධ වුණේ නැද්ද? ඊබ්‍රාහිම් කියන ව්‍යාපාරිකයාට මේ අමාත්‍යාංශයේ උපකරණ දුන්නේ නැද්ද? සතොස වාහන පාවිච්චි කළේ නැද්ද? ඒ විතරක් නොවෙයි, මුස්ලිම් කොංග්‍රස් පක්ෂයේ නායකතුමාත් එක්ක සහරාන් එකට වාඩි වෙලා ඉන්න ඡායාරූප දැක්කේ නැද්ද? බෝම්බයකින් තුවාල ලබපු එක්කෙනෙක් ඉස්පිරිතාලයේ ඉන්නකොට, ඔහු බලන්න මුස්ලිම් කොංග්‍රස් පක්ෂයේ නායකතුමාත් ගියේ නැද්ද? මේ අය තමයි එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකතුමාත් එක්ක ඉන්නේ. ඒ විතරක් නොවෙයි, පාර්ලිමේන්තුවේ මුදල් ඇමතිකම දරපු, ඒ වාගේම මහ බැංකු මංකොල්ලයට හවුල් වුණාය කියන, රුපියල් ලක්ෂ 1,600ක නිවසක් කොළඹින් ගත්තාය කියලා මුදල් ඇමතිකම අත් හැරපු, ඒ හිටපු ඇමතිවරයා අද වන විට සජිත් ප්‍රේමදාස මහත්මයාත් එක්ක නැද්ද? ඒ වාගේ අන්තවාදීන්ගේ ග්‍රහණයට ලක් වුණු මේ නායකත්වය, රට පිළිබඳව හැඟීමක් නැතිව කටයුතු කරනවා. ඇල්පිටියෙන් ලැබුණු ඡන්ද ප්‍රතිඵලයත් එක්ක කොතැනින්ද එතුමා මැතිවරණය පටන් ගත්තේ කියලා මන්දගාමී ස්වභාවයකින් ඉන්න කොට, අන්දමන්ද වෙලා ඉන්නකොට, එතුමාට මතක් වෙන කාරණා අනුව වේදිකාවේ කියන කථා නිසා මේ රටේ බුද්ධිමත් ජනතාව එතුමන්ලා දෙදෙනා අතර තිබෙන වෙනස හොඳට තේරුම් අරගෙන තිබෙනවා. මේ වාගේ පසුබිමක් තුළ පැහැදිලිවම අප මතක් කරලා දෙන්න ඕනෑ, එක්සත් ජාතික පක්ෂය මැතිවරණය ජයග්‍රහණය කරන්න හිතාගෙන කටයුතු කරන වෙලාවක, ඒ පවුල්වල අය ආර්යාවන් නිර්මාණය කරන්න කටයුතු කරනකොට, මේ රට නිදහස් කර ගන්නට කටයුතු කරපු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ මැතිනියට මේ වාගේ උත්තරීතර සභාවක අපේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා එවැනි අවලාද නගන එක මහා බරපතළ බේදවාචකයක් බව. අපි දන්නවා, එදා පිත්තල හන්දියේදී ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බෝම්බයට හසුවුණු වේලාවේ එතුමාගේ ජීවිතය බේරුණේ අනූනවයෙන් කියලා. මේ රටේ දෙකෝටි විසිපන්ලක්ෂයක් මිනිස්සු භයෙන්, සැකෙන් තමයි ජීවත් වුණේ. ඒ කාරණාවත් එක්ක ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා දියත් කළ සාමකාමී ව්‍යාපෘතිය වාගේම, මානුෂීක මෙහෙවර වෙනුවෙන් එතුමා ලබා දුන් නායකත්වය අතිශයින්ම අපි අගය කරන්නට ඕනෑ. නිදහස් කරගත් රටේ මහින්ද රාජපක්ෂ මැතිතුමා උතුරේ ඉඳලා දකුණට ජාති, ආගම්, කුල භේදයකින් තොරව සංවර්ධනය කළ හැටිත්, ඒකට ප්‍රතිඋපකාර කරන්නට යාපනයේ ද්‍රවිඩ ජනතාව අද පෙළ ගැහිලා ඉන්න හැටිත් අපි හොඳින් තේරුම් අරගෙන තිබෙනවා. ඒ පසුබිම ඒ ආකාරයට තිබෙන වෙලාවක, පසුගිය කාල වකවානුව තුළ විවිධ දේශපාලන මත දැරූ අය තමන් දැරූ ඒ මතයෙන් ඉවත් වෙලා රට නැවත ගොඩනහන්නට, නැවත වතාවක් අදහන්නට පුළුවන්, විශ්වාස කරන්න පුළුවන්, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ වැඩ පිළිවෙළත් එක්ක අනුගත වෙන්න හදනවා.

ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා දිනවන්නට කටයුතු කරනකොට, වරධරාජා පෙරුමාල්ලා අපිත් එක්ක එකට එක්කාසු වෙනකොට මේ ගොල්ලන්ට එය බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. හැබැයි, සහරාන්ලා නිර්මාණය කළ උදවිය ඒ ගොල්ලන්ගේ අපේක්ෂකයාත් එක්ක එකට එක්කාසු වෙන එක ඒ ගොල්ලන්ට ප්‍රශ්නයක් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දේශපාලන භූමිකාව තුළ ජාතීන් අතර භේද ඇති කරන්නේ නැතුව සියලුදෙනාම එකතු වෙලා එක නායකයෙක් බිහි කරන්නට, ඉතිහාසයේ අපේ වැඩිහිටි පරම්පරාව විදේශිකයන්ගෙන් රට නිදහස් කරන්නට කටයුතු කළා වාගේ ආර්ථික වශයෙන් කඩාගෙන වැටුණු, සමාජීය වශයෙන් සහ සංස්කෘතික වශයෙන් විනාශ වුණු මේ රට නැවත ගොඩනහන්නට එකට එක්කාසු වෙලා කටයුතු කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ නායකයන්ට වඩා ගම්බද අහිංසක ජනතාව, රටට ආදරය කරන උදවිය නිල් පාට, කොළ පාට, රතු පාට පැත්තකට දමලා, සියලු ජාති, ආගම්, කුල-මල භේද පැත්තකට දමලා, දේශප්‍රේමීත්වයෙන් යුක්තව ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වෙනුවෙන් පෙනී සිටින කාරණාව අතිශයින්ම ප්‍රශංසනීයයි. අනාගතය ගොඩනහන්නට එතුමාට පුළුවන්කමක් තිබෙනවාය කියන කාරණාව මේ දැවැන්ත ජන බලවේගයත් එක්ක තක්සේරු කරන්න අපට පුළුවන්කමක් තිබෙනවා. එහෙම වෙලාවක, එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය Millennium Challenge Corporation ගිවිසුම හරහා අද සජිත් ප්‍රේමදාස මහත්මයාගේ ඉදිරි දේශපාලන ගමන් මාර්ගය පිළිබඳව, එතුමාගේ පෞරුෂය පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් සමාජගත කරලා තිබෙනවා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ජාත්‍යන්තරයත් එක්ක ගනුදෙනු කරනකොට කිසිම දවසක ලංකාවේ ආධිපත්‍යය වසර 2500ක ලිඛිත ඉතිහාසයක් තිබෙන අපගේ පරමාදර්ශී රටේ ඒ පෞරුෂය විනාශ කරන්නට කටයුතු කළේ නැහැ. නමුත්, අද ඇමෙරිකාවට ඕනෑ කරන විධියට මේ රට හසුරුවන්නට, ඒ අයගේ වර්තමාන ජනාධිපති අපේක්ෂකයා තහවුරු කරන්නට Millennium Challenge Corporation ගිවිසුම ගෙනැල්ලා, ඒ ආණ්ඩුවෙන් දුන්නු සල්ලි ටික අරගෙන ඇවිල්ලා, "ගම්පෙරළිය" කියලා ගම්වල පාරවල්වල අඩි 100ක් විතර දුරට කැට අල්ලලා පාර හදලා, ඒ පාර දෙපැත්තේ ඉන්න එක්සත් ජාතික පක්ෂයේ අය සතුටු කරලා, ඔවුන්ගේ සීමිත ඡන්ද ප්‍රතිඵලය නිර්මාණය කරන්න උත්සාහ කරනවා. හැබැයි, මේ දේ පැහැදිලිව මතක් කරන්න ඕනෑ. අද මේ රටට ආදරය කරන දේශප්‍රේමී ජනතාව ජාති, ආගම්, කුල-මල භේද පැත්තකට දමලා හැමදෙනාම එකට එක්කාසු වෙලා දෙවුන්දර තුඩුවේ ඉඳලා පේදුරුතුඩුව දක්වා ජාතික කොඩිය, ජාතියේ අභිමානය ඉදිරියේ තියාගෙන දේශපාලන ක්‍රියාවලිය කිරීම සම්බන්ධව අපට දැනෙන්නේ ලොකු සතුටක්. ඒ

[ගරු ඩී.බී. හේරත් මහතා]

ඇයි? මේ රටේ අනාගතය අවිනිශ්චිත බවට පත් වෙලා තිබුණා, අනාගත දරුවන්ට අවිනිශ්චිත බවක් නිර්මාණය වෙලා තිබුණා. ඒ සියලු කාරණා පැත්තකට දමලා, අනාගත දරුවන් වෙනුවෙන් ශ්‍රී ලංකාද්වීපය ගොඩනහන්න පුළුවන් වටපිටාවක් හැදිලා තිබෙනවාය කියන කාරණාවත් අපි මතක් කරන්නට ඕනෑ. ඒ නිසා මාධ්‍ය ආයතන දඩයම් කරමින්, ඔවුන්ට පහර එල්ල කරමින්, විදේශීය ආධිපත්‍යයට යටත් වෙන්න සූදානම් වෙමින් අවස්ථාවාදී උදවිය වට වෙලා ඉන්න වෙලාවක, කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරන අයකු හැටියට මම පැහැදිලිව කියනවා, මෙවර ජනාධිපතිවරණයේදී කුරුණෑගල දිස්ත්‍රික්කය වැඩි ඡන්ද දෙලක්ෂ පනස්දහසකින් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා දිනවන්න සූදානම් වනවාය කියන කාරණය. 2019 නොවැම්බර් 16 වැනි දා ඡන්ද පොළට ගිහිල්ලා, දේශප්‍රේමී ඡන්ද බලය අරගෙන ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ නායකත්වයට පත් කරලා, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවක් තුළ මේ රටේ දැවෙන ප්‍රශ්න විසඳන්නට හොඳ ආරම්භයක් දෙන්න පුළුවන්ය කියන විශ්වාසය අප තුළ තිබෙන බව මතක් කරමින්, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව මෙතෙකින් අවසන් කරනවා.

[අ.භා.3.07]

**ගරු එඩ්වඩ් ගුණසේකර මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எட்வட் குணசேகர - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு பிரதி அமைச்சர்)
(The Hon. Edward Gunasekara - Deputy Minister of Lands and Parliamentary Reforms)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගැන අදහස් දැක්වීමට මටත් අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මේ යෝජනාව ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා ඉදිරිපත් කරද්දී, එතුමාගේ කථාවේදීත් කියැවුණා මේක ජාතිවාදී කතන්දරයක් කියලා. ඒ වාගේම, මේ යෝජනාවම ජාතිවාදීයි කියලා.

මේ මොහොතේ මේ යෝජනාව ගත්තේ ජාතිවාදය පදනම් කරගෙන දකුණේ සිංහල ජනතාවට අදහසක් දෙන්නයි. එතුමා හිටපු ඇමති කෙනෙක්; මගේ හොඳ හිතවත් මන්ත්‍රී කෙනෙක්. මම දන්නේ නැහැ ඇයි එතුමාට මේ වාගේ දේවල් කරන්න හිතෙන්නේ කියලා. මේ යෝජනාව ජාතිවාදීයි. රාජවරෝදියම් සම්පන්දන් මැතිතුමා ඇතුළු TNA පක්ෂයේ අය සජිත් ප්‍රේමදාස මැතිතුමාට සහයෝගය දෙන්න ආපු එක තමයි එතුමන්ලාට ගැටලුවක් වෙලා තිබෙන්නේ. සජිත් ප්‍රේමදාස මැතිතුමා කිසිම කොන්දේසියකට යටත් වෙලා, මේ රටේ කිසිම දේශපාලන පක්ෂයකින්, කිසිම දේශපාලන නායකයෙකුගෙන් මේ අවස්ථාවේ ඡන්දය ඉල්ලන්නේ නැහැ. එතුමා නිදහසේ මේ කටයුතු කරන්නේ. ඒ විධියට ජනාධිපතිකම අරගෙන ජනතාවට යමක් කරන්න, මේ රටට අලුත්, නැවුම් නායකයෙක් අවුරුදු 70කට පස්සේ පත් කරන අවස්ථාවක් තමයි මේ තිබෙන්නේ. ඒ සඳහා තමයි සජිත් ප්‍රේමදාස මැතිතුමා ඇවිත් ඉන්නේ. ඒකට වෙනස් මේ රටට මතයක් ගෙනෙන්න තමයි එතුමා මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මෙතැනදී කියනවා, MCC ගිවිසුම ගැන. මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා අපේ "ගම්පෙරළිය" ගැනත් කථා කළා. ඇමෙරිකාවෙන් දුන්නු සල්ලිවලින් ලු මේ වැඩසටහන කරන්නේ. ඒක පට්ටපල් අසත්‍ය නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඇයි මෙහෙම මෙච්චර වැදගත්, උසස්, උත්තරීතර සභාවේ ඉඳගෙන අර කජු ගස් යට, රබර් ගස් යට, stages ගානේ කථා කරන ඒවා කියන්නේ? ඒවා මේ ගරු සභාවේ කියන්න වලංගු නැහැ. මෙතැන කථා කරන්න ඕනෑ ඇත්තටම වැදගත් දෙයක්. මේ තත්ත්වයට මේ පාර්ලිමේන්තුව නොයන්න තමයි අපි සජිත් ප්‍රේමදාස මැතිතුමා හරහා අලුතෙන් හිතන්න පුළුවන් පුද්ගලයෙක් මේ රටේ ඊළඟ මැතිවරණයෙන් පත් කරන්න හදන්නේ. බාල ගණයේ, මේ රටේ ජාවාරම් කරන, කුඩු ගෙන්වන, මේ රට විනාශ කරන පදනමකින් තොරව, එදා මේ රටේ පාර්ලිමේන්තුවට ගරු කරපු තත්ත්වයට නැවත වතාවක් මේ පාර්ලිමේන්තුව පත් කර ගන්න ඕනෑ. එහෙම නැතිනම්, මේ රටට කරන්නේ මහා ශාපයක්. මේ හැම කෙනකුටම ඇමතිකමේ, අගමැතිකමේ, ජනාධිපතිකමේ සදාකල් ඉන්න බැහැ. අපි වයසට පත් වෙනවා; මැරෙනවා. ඒ කරුණු සිහියේ තබා ගෙන තමයි මේ ගමන් මගේ අපි ඉස්සරහට යන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is the point of Order, Hon. Minister?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු එඩ්වඩ් ගුණසේකර නියෝජ්‍ය අමාත්‍යතුමා කියනවා, "හැමදාම දේශපාලනයේ ඉන්න බැහැ වයසට පත් වෙනවා" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සජිත් ප්‍රේමදාස ජනාධිපති අපේක්ෂකතුමා අද කියලා තිබෙනවා, එතුමා ජනාධිපති ධුරයට පත් වුණාම පාර්ලිමේන්තුවේ විශ්වාසය දිනාගත හැකි නව අගමැතිවරයෙක් පත් කරනවා, ඒ වාගේම තරුණ පිරිසිදු කැබිනට් මණ්ඩලයක් පත් කරනවා කියලා. ඇත්තවශයෙන්ම ඒක අපි අගය කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

**ගරු එඩ්වඩ් ගුණසේකර මහතා**
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)

එතුමා කිව්ව ඒ ප්‍රකාශයට මාත් ඇහුම්කන් දුන්නා. එතුමා කිව්වේ, "ඊළඟ පාර්ලිමේන්තුවේ බහුතරයේ කැමැත්ත මත" කියලායි. එතුමා කවුරුවත් නම් කරලා නැහැ නේ. ඒක නේ ස්වාධීන වෙන්නේ. ඒක නේ ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ. ඒක නේ උත්තරීතරභාවය. ඒක නේ ශිෂ්ටභාවය. ඒකයි වෙන්න ඕනෑ. අන්න එතැනටයි අපි යන්න ඕනෑ. ඒ නිසා කවුරුවත් බලාපොරොත්තු වුණාට වැඩක් නැහැ. ඒවා ලැබෙන විධියක් තිබෙනවා; කරන විධියක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුව කුණු ක්‍රමයට නොගිහින්, නිවැරදි ක්‍රමයට යන්න ඕනෑ. අන්න එච්චරයි වෙන්න ඕනෑ. මෙතැන මම ඉන්නවාද, අජිත් පී. පෙරේරා මැතිතුමා ඉන්නවාද, මුජිබුර් ඉන්නවාද, එහෙම නැත්නම් බන්දුල ගුණවර්ධන මැතිතුමා ඉන්නවාද කියන එක නොවෙයි ප්‍රශ්නය. අපි ඒ නිවැරදි තැනට යන්න ඕනෑ.

Millennium Challenge Corporation ගිවිසුම ගැන දැන් කිව්වා. මම ඉඩම් නියෝජ්‍ය ඇමති. මෙයින් වැඩියෙන්ම මුදලක් ලැබෙන්නේ ඉඩම් ඔප්පු පිළිබඳ ප්‍රශ්නවලටයි. මේ රටේ මිනිසුන්ට

තිබෙන ලොකුම ගැටලුවක් තමයි ඉඩම් ඔප්පු ලබා ගැනීම. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මේ ආණ්ඩු පත් කර ගැනීමේදී හැම දාම කියන දෙයක් තමයි "ඉඩම් ඔප්පු නැති අයට සින්නක්කර ඉඩම් ඔප්පුවක් ලබා දෙනවා" කියන කාරණය. ලක්ෂ 11කට ආසන්න පිරිසක් මේ රටේ ඉඩම් ඔප්පු ලබා ගන්න ඉන්නවා. මම ඒ කටයුත්ත කරන්න බොහෝ උත්සාහ කළා. ගම්පහ දිස්ත්‍රික්කයේත් එවැනි ප්‍රශ්න බොහෝ තිබෙනවා. අපට ඒ ප්‍රශ්න අවසන් කර ගන්න බැහැ. කොච්චර කළත් අපට මේ සඳහා මුදල් නැහැ. අපට මුදල් ඕනෑ. මොනවා කළත් තවම අපට ඔප්පු ලබා දෙන්න පුළුවන් වෙලා තිබෙන්නේ ඉතා අඩු ප්‍රමාණයක්. ගරු ගයන්ත කරුණාතිලක මගේ ඇමතිතුමා, මම, ඉඩම් අමාත්‍යාංශයේ නිලධාරින්, කොමසාරිස්තුමිය සහ සභාපති කොච්චර මහන්සි වුණත් අපට සිද්ධ වෙලා තිබෙන්නේ ඒ ආකාරයට කටයුතු කරන්නයි. මේ MCC ගිවිසුමේ තිබෙන ප්‍රධාන කාරණයක් තමයි, මේ grant එකෙන් ලබා දෙන මුදලින් ඉඩම් ඔප්පු ලබා දීම. එලෙස ලෝකයේ තව රටවල් කිහිපයකට මුදල් දෙනවා. මීට කලින් ඇමෙරිකාවෙන් මුදලක් දීලා තිබෙන්නේ මහවැලි යෝජනා ක්‍රමයට පමණයි. ඊට පස්සේ පළමුවෙනි වතාවට තමයි අපට නැවතත් ඇමෙරිකාවෙන් මුදලක් දෙන්න හදන්නේ. ගිලන් රථවලට විරුද්ධ වුණා වාගේ, සමෘද්ධිය වැඩි කරනවාට විරුද්ධ වුණා වාගේ මේකටත් විරුද්ධ වෙලා දේශපාලන වශයෙන් අපට ගහනවා. මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ ගරු සභාවේ වාඩි වුණු මිනිස්සු ඒ දේ කරන්න හොඳ නැහැ. ඒ මන්ත්‍රීතුමා දැන් කිව්වේ කොහේ හෝ ගහක් යට හෝ stage එකක හෝ කථා කරන දෙයක් නේ. ඇත්තටම එහෙම දේවල් මෙතැන කථා කළාම මේ පාර්ලිමේන්තුව බාල වෙනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒකට නොවෙයි මේ පාර්ලිමේන්තුව තිබෙන්නේ. පනත් කෙටුම්පත් යනාදිය සම්මත කරගෙන ශිෂ්ට සම්පන්න විධියට ලෝකයේ අනෙකුත් පාර්ලිමේන්තු එක්ක සසඳන්න පුළුවන් විධියට අපේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුත් ලෝකයේ පාර්ලිමේන්තුවල ඉන්නා ශිෂ්ට සම්පන්න මිනිස්සු වාගේ වෙන්න ඕනෑ. එහෙම නැතිව, ආවේගශීලීව ඇවිල්ලා මෙතැන කථා කරලා වැඩක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කරපු කථාව ගැන ආයෙත් කියනවා නම්, මම අහන්න කැමතියි, මේ රටට ජාතිවාදය ගෙනාවේ කවුද, මේ රටට යුද්ධය ගෙනාවේ කවුද, මේ සිදුවීම් මොනවාද කියලා. ඔබතුමාත් නියෝජනය කරන, මේ සභාවේ ඉන්න තවත් මන්ත්‍රීතුමන්ලාත් නියෝජනය කරන උතුරේ දෙමළ ජනතාව ගැන දකුණේ මිනිසුන් තුළ වෛරයක් ඇති කරවන්නයි හදන්නේ.

අපි 2001දී සාම ගිවිසුමක් ගෙනාවා. ඒක හරිද වැරදිද කියන එක කෙසේ වෙතත්, මම පෞද්ගලිකව හරි සතුටුයි, වෙඩිල්ලක් බෝම්බයක් උතුරේ පත්තු නොවී මේ රටේ මිනිස්සු නිදහසේ හිටපු එක ගැන. එදා තුන් - හතර පාරක් අපි උතුරට ගියා. ඒ ගැන විවිධ කථා කියන්න ගත්තා. ඒ තත්ත්වය ඉවර වුණේ යුද්ධයකින්; ප්‍රභාකරන් ඝාතනය වෙලා. හැබැයි එහෙම වුණාට තවම ඒ මිනිසුන්ගේ බලාපොරොත්තු සඵල වුණේ නැහැ. අපි ඒකේ වැරැදිකාරයෝ. අපි ඒ අවශ්‍ය කටයුතු ඉටු කරන්න ඕනෑ. නමුත් සජිත් ප්‍රේමදාස මහත්තයා මේ වෙලාවේ සම්පන්දන් මහත්තයා එක්ක එකතු වුණේ ඒ ඉල්ලීම් දෙන්න නොවෙයි, මේ රටේ ඉන්න උගත්, බුද්ධිමත් නායකයන් සමඟ එකතුව මේ රට ඉස්සරහට ගෙන යන්නයි. ජාතිවාදය, ආගම්වාදය, කුලවාදය ඇති කරලා ගෝත්‍රිකවාදී තත්ත්වයකට නැවත මේ රට පත් කරගන්න එක නොවෙයි අපි කළ යුත්තේ. මම මේ කථා කරන්නේ, සජිත් ප්‍රේමදාස මහත්තයාටයි, ගෝඨාභය රාජපක්ෂ මහත්තයාටයි දෙන්නාටම පක්ෂග්‍රාහී නැතුව. මේ පාර්ලිමේන්තුවට ඡන්දයෙන් ආපු මිනිස්සු හැටියට අපේ යුතුකමක් තිබෙනවා, මේ පාර්ලිමේන්තුව තුළ වන ශිෂ්ට සම්පන්න කථිකාවක් තුළින් මේ රට ඉස්සරහට ගෙන යන්න. කවුරු මේ යෝජනාව ගෙනාවත් හොඳ චේතනාවකින් නොවෙයි ගෙනැවිත් තිබෙන්නේ. නැවත වතාවක් වේදනා දෙන්නයි ගෙනැවිත් තිබෙන්නේ. ජාතිවාදය ඇද්දාට මේ රටේ බහුතරයක් මිනිසුන්ට hurt වෙන්නේ නැහැ නේ. මේ රටේ සියයට 70ක් සිංහල ජාතින් ඉන්නේ. ඒ අය නොවෙයි, සුළු ජාතිකයන් හැටියට ඉන්න අයම තමයි පාරන්නේ. සහරාන්ලාගේ කථා ආරම්භ වෙන්න කලින් මොකක්ද වුණේ කියලා අපි කවුරුත් දන්නවා නේ. කාලයක් තිස්සේ අර ඥානසාර හාමුදුරුවන් පෝෂණය කළා. ඊට පස්සේ තව - තව අය පෝෂණය කළා. ඒ ගොල්ලන්ගේ කාලයේ කළුතර දිස්ත්‍රික්කයෙන් ලොකු අරගළයක් පටන් ගත්තා. ඒවා කොහොමද ඉවර වුණේ? අපේ ආණ්ඩුව ආවාට පස්සේ දිගන පැත්තේ යම් යම් දේ පටන් ගත්තා. කවුද මේවා පිටිපස්සේ හිටියේ? මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් ඒවායේ පිටිපස්සේ හිටියා නේ. එහෙම කරලා, අප්‍රේල් 21 සිද්ධියට එද්දී, අපිත් දන්නේ නැති කථාවක් නේ, එතුමන්ලාගේ "වියත් මඟ" වැඩසටහනෙහි කථා කරපු දයාන් ජයතිලක දැන් කියන්නේ. මහාචාර්ය දයාන් ජයතිලක කියනවා නේ, සහරාන්ලා පෝෂණය කරලා, අප්‍රේල් 21 සිද්ධිය පිටිපස්සේ සම්පූර්ණයෙන්ම ගෝඨාභය රාජපක්ෂ ඉන්නවා කියලා. ඇයි, මේක රටේ මිනිස්සු පිළිගන්නේ නැත්තේ? මේක අපිද කියන්නේ? එක්සත් ජාතික පක්ෂයේ කෙනෙක්ද දයාන් ජයතිලක? ඔහු ඒක කියනවා නේ. තවමත් පොහොට්ටුව අලවාගෙන, පොහොට්ටුවට වේදිකා ගහන, ඒ වේදිකා ගණනේ යන මිනිසුන්ට පිස්සුද? මම අහන්නේ ඒකයි.

මේ රටේ අහිංසක ජනතාව මරන්න, රටේ නැති කුමන්ත්‍රණ කරනවා. රටට ආදරය කරන, ගෙදර ඉන්න දරුවාට ආදරය කරන හැම මිනිහෙක්ම ගෝඨාභය රාජපක්ෂට කතිරයක් ගහනවා කියන්නේ තමන්ගේ ගෙදර හැදෙන දරුවාට විනාශයක් කරනවා කියන එකයි. ඒක තමයි මම කියන්නේ. ඒ තත්ත්වයට රටේ මිනිසුන් පත් කරලායි තිබෙන්නේ. කුමන්ත්‍රණය, බොරුව, - අසත්‍ය,- හොරකම, ජඩකම සියල්ලත් සමඟ ඇවිල්ලා නැවත වතාවක් ලබන 16වැනි දා මිනිසුන්ගෙන් ඡන්දය ඉල්ලන්න පුළුවන්ද? එහෙම කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එහෙම කරනවා නම් අපි මේ රටේ පුරවැසියෝ නොවෙයි. මේක හරිය කියලා මෙතැන කියලා ගියොත් ඡන්දය දීලා එවපු 225න් කෙනෙක් නොවෙයි, මාත්. ඒක වෙන්න දෙන්න බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා දන්නවාද, අප්‍රේල් 21වැනි දා සිද්ධිය වුණාට පසුව මොකක්ද වුණේ කියලා? මැයි 13 වැනි දා මිනුවන්ගොඩට- මගේ ආසනයට - ඇවිල්ලා නැවත ගැහුවා. කවුද ගැහුවේ? ඒ අවස්ථාවේදී ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු පාරේ ගියේ; පොහොට්ටුවේ හිටපු මන්ත්‍රීවරුන්ට උදව් කරන අය තමයි යාන - වාහන අරගෙන, පෙට්‍රල් අරගෙන එහේ - මෙහේ ගියේ. අද ඒක ජාති ආලය නොවෙයි, ඉඩම් ආලය බවට පත් වෙලා. නගර සභාවේ ඉඩම අද නගර සභාවේ සභාපති සමඟ එකතු වෙලා බෙදා ගන්න හදනවා; ඒකෙන් කඩ ඉල්ලනවා; ඒකට සල්ලි ඉල්ලනවා; මිනිසුන්ගෙන් කප්පම් ඉල්ලනවා. මිනුවන්ගොඩ එහෙම වුණා. කුලියාපිටිය ඇතුළු හැම තැනම මැරුවා. දරුවෝ ඉන්දෙද්දී පෙට්රල් වක්කරලා මිනිසුන් මැරුවා. ඒක ජාති ආලයද? මොකක්ද එතැන තිබෙන්නේ? එහෙම කරන්න පුළුවන්ද? සිංහලයා, දෙමළා, මුස්ලිම් කියලා එහෙම කරන්න පුළුවන්ද? එහෙම නම් මොකටද මේ පාර්ලිමේන්තුව? එහෙම නම්, අපි මේ පාර්ලිමේන්තුව තියාගෙන ඉන්න ඕනෑ නැහැ නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට යුතුකමක් තිබෙනවා. අපට කථා කරන්න පුළුවන් වෙලාවේයි මේවා ගැන කථා කරන්නේ. අපි මේවා කපු ගස් යට කථා කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතිවාදය අවුස්සන මිනිසුන් ගැන අපි රටට හෙළි කරන්න ඕනෑ. එදා සිටම

[ගරු එඩ්වඩ් ගුණසේකර මහතා]

ජාතිවාදයමයි ඇවිස්සුවේ; ආගම් වාදයමයි ඇවිස්සුවේ. මම බෞද්ධයෙක්. මට ඉතා දුකයි, අපේ හාමුදුරුවක් කීප නමකුත් ඒක පස්සේ යන එක ගැන. එදා අපි අම්මලා - තාත්තලා සමඟ කාලා - බීලා, බදාදාට බණ අහලා, පෝය දවසට පන්සල් ගිහින් කටයුතු කළා. එදා අපේ ගෙවල්වල හරි සාමකාමීකමක් තිබුණා. අද බලපුවාම පන්සලුත් විනාශ කරනවා නේ. පන්සල්වල ඉන්න හාමුදුරුවන්ගේ ඇඟේ මේවා ගහලා, හාමුදුරුවන්වත් උස්සාගෙන දුවනවා නේ මේ කටයුතුවලට. ඉතින් කොහොමද මේ බෞද්ධාගම රැක ගන්නේ? සියලු දේ අත් හැරලා, මිනිසුන් වෙනුවෙන් විවරය දා ගන්න හාමුදුරුවරු තමයි මේ. සෝභිත හාමුදුරුවෝ නම් එදා ඉදිරිපත් වුණේ මහා ගැටුමක් තිබුණු නිසා; අරගළයක් තිබුණු නිසා; මේ රටේ ප්‍රශ්නයක් තිබුණු නිසා. උන්වහන්සේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂට කලින් කිව්වා, සරත් ෆොන්සේකා නිදහස් කරන්න කියලා. ඒක කරන්න කිව්වා. ඒ වාගේ කෙළින් කථා කළා. වී මිල අඩු වුණාම, උන්වහන්සේ ගෝනි අරගෙන ගිහිල්ලා හිඟුරක්ගොඩ පැත්තේ වී ගත්තා. උන්වහන්සේ එහෙම කටයුතු කරපු හාමුදුරු නමක්. අනෙක් හාමුදුරුවරු මොනවාද කළේ? සමහරු අරගළ කරනවා; MCC ගිවිසුම ගැන උද්ඝෝෂණ කරනවා. නමුත් මෙලෝ දෙයක් ගැන දන්නේ නැහැ. මොකක්ද ඒ ගොල්ලන් කියන්නේ? මෙතැන ඉඳන් එහාට අදිනවා කියන්නේ? [බාධා කිරීමක්] ඔව්, දැන් ගාලු පාරත් එහෙම පාරක් නේ. ගාල්ල - කොළඹ යා කරන පාරක් නේ. මීගමුව - කොළඹ යා කරන පාරක් නේ. ඒකට නීතියක්-රීතියක් තිබෙනවා. මේ රටේ දැන් ප්‍රවාහනය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා; මාර්ග පද්ධතිය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ලෝකයේ උදව් කරන රටවල්වලින් මේ යෝජනාව දාපුවාම ඒ ගොල්ලන් ඒක අනුමත කරලා තිබෙනවා. ඒ ගැන සාකච්ඡා කරලා තිබෙනවා. Millennium Challenge Corporation එකේ මණ්ඩලයක් ඉන්නවා. අමාත්‍යාංශවල ලේකම්වරුන්, අගමැති, විපක්ෂ නායක, ඉඩම් අමාත්‍යාංශයේ කොමසාරිස් ඇතුළු දහදෙනෙකුගෙන් තමයි ඒ මණ්ඩලය හැදිලා තිබෙන්නේ. මේ කටයුතු නිකම්ම නිකම් ඇමෙරිකාවෙන් ඇවිත් කරන්නේ නැහැ. ඇමෙරිකන්කාරයෙක්වත් එන්නේ නැහැ. ඇමෙරිකන් හමුදාව එනවාලු. මාර කතාවක් කියන්නේ. මේ ගැන දන්නේ නැති මොට්ට මිනිස්සුන්ට මේවා කියන්න. අපි හිටියත් නැතත් මෙය ක්‍රියාත්මක වෙනවානේ. නැත්නම් නොවැම්බර් මාසයේ මේ මුදල අපට එන්නේ නැහැ. මේ රටේ දුප්පත් මිනිස්සුන්ට ඉඩම් ඔප්පු දෙන එකයි මේ නවත්වන්න හදන්නේ. මම ඉඩම් නියෝජ්‍ය ඇමති හැටියටයි මේ කරුණු කියන්නේ. සින්නක්කර ඔප්පු දෙන්න ලක්ෂ 10ක් ඉන්නවා. හැම දේශපාලනඥයාම කිව්වේ ඔප්පු දෙනවා කියලායි. හැබැයි ඒවා දෙන්න විධියක් නැහැ. ඒවා දෙන්න මුදල් ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒකත් කඩාකප්පල් කරන්න අද උද්ඝෝෂණ කරනවා, අර ගිලන් රථ ගෙනෙද්දී උද්ඝෝෂණ කළා වාගේ. දැන් සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා කිව්වා අර ඊබ්‍රාහිම් දවස් තුනෙන් නිදහස් කළා කියලා. මම මේ දැන් call කරලා අහලා බැලුවා. ඔහු තවමත් ඉන්නවා TID එකේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු එඩ්වඩ් ගුණසේකර මහතා**
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහෙම අසත්‍ය ප්‍රකාශ කර කර ඇයි මේ රට ජරාවට පත් කරන්නේ? මම මීට වැඩිය කතා කරන්නේ නැහැ, කාලය ගෙවී ගිහින් තිබෙන නිසා. නමුත් මම එකක් කියනවා. මේ ආණ්ඩුව උතුර, නැඟෙනහිර, දකුණ ඔක්කොම එකතු කරලා, සිංහල, මුස්ලිම්, ද්‍රවිඩ ජනතාව එකට එකතු කරන දියුණුවක් තමයි බලාපොරොත්තු වන්නේ. ඒ නිසා තමයි පලාලි ජාත්‍යන්තර ගුවන් තොටුපොළ හැදුවේ. ඒක අමතක කරන්න එපා. ඊළඟට ත්‍රිකුණාමලයත් ඒ වාගේ දියුණු කරනවා. ත්‍රිකුණාමලයට කොළඹ වරාය සම්බන්ධ කරලා අතීතයේ තිබුණු තත්ත්වයට ගෙන එනවා. ඒවා තමයි MCC එකේත් තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාලය කෙටි නිසා මට මේ ගැන පැහැදිලි කරන්න වේලාවක් නැහැ. බන්දුල ගුණවර්ධන මැතිතුමා ජනාධිපතිවරණයක් ආසන්නයේ මෙවැනි ජාතිවාදී යෝජනාවක් ගෙන ඒම ගැන මම කනගාටු වෙනවා. මේ වේලාව ලබාදුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඊළඟට ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා.

[අ.භා.3.21]

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ස්තුතියි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඉතා කාලෝචිත යෝජනාවක් බන්දුල ගුණවර්ධන මැතිතුමා මේ සභාවට ගෙන ආ මේ අවස්ථාවේදී ඒ පිළිබඳව අදහස් දැක්වීමට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ප්‍රථම කොට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ලබා දී තිබෙන කාලය කොච්චරද?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
You have 20 minutes.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
Thank you.

උතුරු නැඟෙනහිර පළාත් එක් කිරීම, ස්වයං තීරණ අයිතිය ලබා දීම, ඒකීය රාජ්‍ය ක්‍රමයෙන් බැහැර වීම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම, පසුගිය කාලයේ සිදු වූ බව කියන යුද අපරාධ ජාත්‍යන්තර මැදිහත් වීම තුළින් විසඳීම ඇතුළු රටට අහිතකර කරුණු 13ක් පිළිබඳව උතුරේ ඉලංගෙයි තමිල් අරසුකච්චි ඇතුළු දේශපාලන පක්ෂ පහක් කරුණු ඉදිරිපත් කළ ආකාරය මාධ්‍ය තුළින් අපට දකින්න ලැබුණා. ඔවුන් මේ කරුණු ඉදිරිපත් කළේ මේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකේ අපේක්ෂකයන් දෙදෙනාගෙන් කවුද මේ යෝජනා භාරගන්නේ, කවුද මේ යෝජනාවලට සහාය දෙන්නේ කියන බලාපොරොත්තුව තුළ සිටිමින්. හැබැයි, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, මහින්ද රාජපක්ෂ මැතිතුමා බොහොම පැහැදිලිව කිව්වා, "අපි මේ කිසිම කොන්දේසියකට එකඟ වෙන්නේත් නැහැ, අපට මේ ලියවිලිවලින් වැඩකුත් නැහැ, අපි මේ රටේ මහ ජාතිය සහ සුළු ජාතීන් සියල්ල මේ රටේ පුරවැසියන් හැටියට පිළිගන්නවා" කියලා. හැබැයි, මහ ජාතිය නැතිව, මහ ජාතිය පැත්තකට දාලා අද සජිත් ප්‍රේමදාස මැතිතුමා සුළු ජාතිකයන්ගේ ඡන්දය අරගෙන ආණ්ඩුවක් පිහිටුවන්න යනවා. අද බෞද්ධ ජනතාව පැත්තකට දාලා, මහ ජාතිය පැත්තකට දාලා සුළු ජාතිකයන්ගේ ඡන්දයෙන් ආණ්ඩුවක් පිහිටුවන්න යනවා. එහෙම

ආණ්ඩුවක් පිහිටෙව්වත් වැඩි කල් යන්න බැහැ. එහෙම වෙන්නේත් නැහැ. ඒක තමයි ඇත්ත. දැන් මේ එක් එක් මන්ත්‍රීවරු කථා කරන අවස්ථාවේදී මම අහගෙන සිටියා. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ කථාවේදී විවිධ චෝදනා අපේ පක්ෂයට, ගෝඨාභය මැතිතුමාට ඉදිරිපත් කළා. එක්සත් ජාතික පක්ෂයේ ආධාරකරුවන් උසාවි ගිහිල්ලා නඩු දාලා එතුමාට නාම යෝජනා නොදෙන තැනට තීන්දුවක් ගන්න ගියා. හැබැයි, ඒ ගෙනාපු චෝදනාව උසාවිය නිෂ්ප්‍රභ කළා. නඩු දෙක තුනක් දාලා බැලුවා, එතුමාට මොකක් හෝ චෝදනාවක් එල්ල කරන්න පුළුවන්ද කියලා. නමුත්, උසාවි තීන්දුව පිළිබඳව රටේ ජනතාව දැන් දැනුවත් වෙලා තිබෙනවා.

දැන් මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා එක එක යෝජනා ගෙනාවා. හැබැයි, මුස්ලිම් නායකයන් එක් කෙනෙකුවත් ඒ යෝජනා වෙනුවෙන් කථා කරන්නේ නැහැ. එතුමන්ලා මේ සභාවේ ඇත්තේත් නැහැ. මුළු ආණ්ඩු පක්ෂයම නියෝජනය කරමින් දැන් මේ සභාවේ ඉන්නේ කිරිඇල්ල මැතිතුමායි, -එතුමා නිදි- අජිත් පී.පෙරේරා මැතිතුමායි විතරයි. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාට මුස්ලිම් ජනතාව වෙනුවෙන් යෝජනා ටිකක් ඉදිරිපත් කරන්න තිබුණා. දෙමළ පක්ෂවල නායකයන් යෝජනා ටිකක් හෝ ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත්, මුස්ලිම් ජනතාව වෙනුවෙන් මුස්ලිම් නායකයන් යෝජනාවක්වත් ඉදිරිපත් කරලා නැහැ. "මේ මැතිවරණය වෙලාවේ අපට මේ මේ දේවල් දෙන්න, මුස්ලිම් ජනතාව වෙනුවෙන් මේ කාරණා ඉෂ්ට කර දෙන්න" කියලා යෝජනා කරන්න පුළුවන්. විවිධ දේශපාලන පක්ෂ විවිධ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. හැබැයි, මුස්ලිම් නායකයන් මුස්ලිම් ජනතාව වෙනුවෙන් එවැනි කිසිදු යෝජනාවක් ඉදිරිපත් කරලා නැහැ. ජනතාවගේ ඡන්දයෙන් ඇවිල්ලා, මහජන බදු මුදල්වලින් යැපෙනවා මිසක ජනතාව වෙනුවෙන් සේවයක් කිරීමට මුස්ලිම් නායකයන්ට වුවමනාවක් නැති බව බොහොම පැහැදිලිව පෙනෙනවා, මේ දේශපාලන පොර පිටිය තුළ.

අපට ලැබුණු ආරංචිය අනුව එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයකු මේ රටේ ජනාධිපතිවරණයට ඉදිරිපත් කිරීමට රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සූදානමක් තිබුණේ නැහැ. මොකද, ඉදිරිපත් කළොත් පරදින බව එතුමා දන්න නිසා. පසුගිය ජනාධිපති වරණයේදී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඉදිරිපත් නොකර, එක්සත් ජාතික පක්ෂයේ කවුරුන් හෝ ඉදිරිපත් කළා නම්, පරාජය වෙලා ගෙදර යන්න වන බව රනිල් වික්‍රමසිංහ මැතිතුමා දැන ගෙන හිටියා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා අවුරුදු 25ක් තිස්සේ දේශපාලනය කරනවා. ජනාධිපතිවරණ එකකටයි ඉදිරිපත් වුණේ. එයින් පැරදිලා එතුමා ආයෙත් ඉල්ලන්න ගියේ නැහැ. එතුමා දන්නවා, එක්සත් ජාතික පක්ෂයට මේ රටේ මහජන බලයක් නැහැ කියලා. ඒ නිසා කවුරු හෝ දාලා දිනන්නයි එතුමාගේ බලාපොරොත්තුව තිබුණේ. එතුමාගේ අදහස වුණේ, මෙවර වම්පික රණවක මැතිතුමා ගෙනෙන්නයි. එහෙම නැත්නම් කථානායක කරු ජයසූරිය මැතිතුමා ගෙනෙන්නයි. මොකද, එතුමාට බෞද්ධ පරිසරයක් තිබෙනවා; අත්දැකීම් තිබෙනවා. එතුමා රට තොට ගැන දන්නවා කියන හැඟීම තිබුණා. එක්සත් ජාතික පක්ෂයේම කෙනෙකු දමනවා නම් පරදින්න හරි එතුමා ඉදිරිපත් කරන්න තමයි බලාපොරොත්තු තිබුණේ. එතුමා ඉදිරිපත් කළොත්, ඡන්ද ටිකක් ගනීවි කියලායි හිතුවේ. හැබැයි, සජිත් ප්‍රේමදාස මැතිතුමාත් කකුල පස්සට තියන්නේ නැහැ. "මම කවුරුවත් කියන දේ අහන්නේ නැහැ. මගේ ප්‍රතිපත්තිය තමයි මම ක්‍රියාත්මක කරන්නේ. මට ඕනෑ කට්ටියක් තමයි පත් කරන්නේ." කියලා එතුමා කියනවා. අජිත් පී. පෙරේරා මැතිතුමා කිව්වා, තරුණ ඇමති මණ්ඩලයක් තමයි පත් කරන්නේ කියලා. එතකොට කිරිඇල්ල ඇමතිතුමන්ලා ගෙදර යන්න ඕනෑ. සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ කථාවේ හැටියට සරත් ෆොන්සේකා මැතිතුමා විතරයි මුහුකුරා ගිය කෙනෙකු ඉන්නේ. අනෙක් ඔක්කෝම තරුණ ඇමතිවරු.

දැන් අපි අහනවා, සජිත් ප්‍රේමදාස මහත්මයා යම්කිසි විධියකින් ජනාධිපතිවරයා ලෙස පත් වුණොත් -එතුමා පත් වෙන්නේ නැහැ.- මේ රටේ අගමැතිවරයා වෙන්නේ කවුද කියලා. එතුමා නම් කියනවා, "බැංකු හොරකම් කරපු උන්ට, මහ දවල් මහ බැංකුව කොල්ල කාපු උන්ට මම කිසි තනතුරක් දෙන්නේ නැහැ" කියලා. එතුමා අගමැතිතුමා වේදිකාවේ තියාගෙන අගමැතිතුමාට

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියනවා; අගමැතිකම එතුමාට දෙන්නේ නැහැ කියනවා. මේක තමයි අපි දැකපු ඇත්ත කථාව. සජිත් ප්‍රේමදාස මැතිතුමා මේ රටේ ජනාධිපති වුණොත්, පළමුවෙන්ම වරදින්නේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාටයි. මොකද, එතුමාගේ ජොබ් එක ගහලා යනවා; අගමැතිකම නැති වෙනවා.

දැන් බලන්න, අකිල් විරාජ් මැතිතුමා පක්ෂයේ මහ ලේකම්තුමා. පසුගිය දවසක අධ්‍යාපනය සම්බන්ධ රැස්වීමක් තිබුණා. සජිත් ප්‍රේමදාස මැතිතුමා ගිහිල්ලා කථා කළේ පුටු ටිකට. අකිල විරාජ් ඇමතිතුමා නිලධාරින් ගෙනාවේ නැහැ. "එන්න එපා" කිව්වා. "එන්න එපා" කියලා එතුමා ගිහිල්ලා අහනවා, "කෝ, මිනිස්සු? මට මේ රැස්වීමේ කථා කරන්න බැහැ. මම යනවා" කියලා. අපි දැක්කා, මාධ්‍ය තුළින්. එතුමා තමයි ඒ රැස්වීම සංවිධානය කරන්න ඕනෑ. එතුමා තමයි අධ්‍යාපන ඇමති. එතුමා තමයි පක්ෂයේ මහ ලේකම්. එතුමා කියනවා, "මම දන්නේ නැහැ. අපට කිව්වේ නැහැ" කියලා. එතුමාට කියන්න ඕනෑ නැහැ, එතුමා තමයි ඒවා සංවිධානය කරන්න ඕනෑ. මේ විධියට එක්සත් ජාතික පක්ෂය ඇතුළේ මහා අර්බුදයක් තිබෙන්නේ. මේ මාසයේ 16වැනි දායින් පස්සේ එක්සත් ජාතික පක්ෂය ඇතුළේ මහා ගිනි ජාලාවක් ඇති වෙනවා. එක්සත් ජාතික පක්ෂය ඇතුළේ පොරයක් තිබෙන්නේ. අපි ඒක දැක්කා, එක්සත් ජාතික පක්ෂය තුළ ඉන්න කොට. රනිල් වික්‍රමසිංහ මැතිතුමා අපිත් එක්ක සාකච්ඡා කරන හැම අවස්ථාවේදීම සිටියේ එක්සත් ජාතික පක්ෂයේ කෙනෙකු මැතිවරණයට ඉදිරිපත් කළොත් පරදිනවා කියන මතයේයි. ඒ නිසා වෙන පක්ෂයක කෙනෙකුට ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන්න අවස්ථාව දෙන්නයි එක්සත් ජාතික පක්ෂයේ නායකයාගේ අදහස වුණේ. යම්කිසි විධියකින් සජිත් ප්‍රේමදාස මැතිතුමා ජනාධිපති වුණොත් රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ අගමැතිකම ගහලා යනවා. එතුමා ඒකට කැමැති නැහැ. එතුමා කැමති පක්ෂ නායකත්වය තියාගෙන විපක්ෂයේ නායකයා හැටියට මෙතැන වාඩිවෙන්නයි. ඒක තමයි අගමැතිතුමාගේ තීන්දුව. ඒ නිසා මේ පක්ෂය තුළ කිසි දවසක නොවෙන දෙයක් තමයි සජිත් මැතිතුමාගේ ආගමනය. එතුමා දේශපාලන වේදිකාවේ විවිධ කථා කියනවා. ඒවා සුරංගනා කථා. කවදාවත් ඉල්ලන දේවල් ගැන නොවෙයි, කියන්නේ. නෝනාමහත්වරුන්ට සනීපාරක්ෂක පහසුකම් දෙනවා ලු. කවදාවත් ඒවා ඉල්ලලාත් නැහැ, ඒවා ගැන ප්‍රතිපත්ති ප්‍රකාශනයක සඳහන් කරන්න වුවමනාත් නැහැ. මොකද, එහෙම දෙයක් ඉල්ලලා නැති නිසා. චිරාත් කාලයක් ඒ දේවල් බොහොම සුරක්ෂිතව අපේ සමාජයේ සිද්ධ වෙනවා. මෙතුමාගේ නෝනාමහත්තයා -ආර්යාව- කියන්න ඇති මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා, මේක විසඳලා දෙන්න කියලා.

ඊළඟට කියනවා, චෛත්‍ය 1,200ක් හදනවා ලු. එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තියෙනවා, චෛත්‍ය 1,200ක් හදනවා කියලා. චෛත්‍ය හදන්න ඕනෑ. නමුත් මිනිස්සු ඉල්ලන්නේ චෛත්‍ය නොවෙයි. මිනිස්සු ඉල්ලන්නේ කන්න. අද අපේ පැත්තේ කරාබු, ගම්මිරිස්, කෝපි කඩන්නේ නැහැ. ඒ වාගේම රබර් කිරි කපන්නේ නැහැ; කුරුඳු ටික කපන්නේ නැහැ. රුපියල් 95ට තිබුණු තේ දලු කිලෝව අද රුපියල් 54යි. මිනිසුන්ට තේ දලු

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

කඩලා ඇති වැඩක් නැහැ. අපනයන කෘෂිකර්මය බිංදුවට වැටිලා. එතුමා කෘෂිකර්මය ගැන කථා කරන්නේ නැහැ. කෘෂිකර්මය ගැන එතුමා දන්නේ නැහැ. එතුමා ඒ දඬුවල යනවා; අරකේ යනවා; මේකේ යනවා. එතුමා ජනාධිපතිවරයෙකුගේ පුතෙක්. එතුමා සාමාන්‍ය පරාසය තුළ කථා කරනවා. හැබැයි, එතුමා ඉහළ තැනක වැජඹෙන කෙනෙක්. මිනිස්සුත් එක්ක තේ එකක් බොන්නේ නැහැ. අපි කිසි දවසක දැකලා නැහැ, සජිත් ප්‍රේමදාස මහත්මයා ඇවිල්ලා ගෙදරකින් වතුර ටිකක් බොනවා. අහිංසක මිනිසුන් ගැන මෙච්චර කථා කරනවා නම්, ගෙදරකට ගියාම තේ එකක් බොන්න එපා යැ. මිනිහෙක් දෙන වතුර වීදුරුවක් බොන්නේ නැහැ. නමුත් එතුමා කථා කරන්නේ සාමාන්‍ය මිනිස්සු ගැන. සාමාන්‍ය මිනිස්සු බොහොම කනගාටුවෙන් ඉන්නේ එතුමා පත්වෙයි කියලා.

එල්ටීටීඊ සංවිධානය අවුරුදු තිහක් යුද්ධ කරලා නොඉල්ලපු ඉල්ලීම් ටිකක් තමයි අද ඔවුන්ගේ යෝජනා තුළින් ඉල්ලන්නේ. මහින්ද රාජපක්ෂ මැතිතුමා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කිව්වා, මේ යෝජනා සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරනවා කියලා. ඒවා කියවලාවත් බැලුවේ නැහැ, ඒවා ඉවත් කරලා දැම්මා. හැබැයි, සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ පැත්තේ මන්ත්‍රීවරයෙක් කථා කරනකොට කිව්වා, කිසිම කොන්දේසියක් නැහැ ලු. කොන්දේසි නැත්නම් සජිත් ප්‍රේමදාස මහත්මයාට සහයෝගය දෙන්න ඒ ගොල්ලන් ඉදිරිපත් වෙලා තියෙන්නේ මොකටද? ඒ ගොල්ලන් කොන්දේසි පෙන්වන්නේ නැහැ. කොහොම හරි සජිත් ප්‍රේමදාස මහත්මයා මෙතැනට ගෙනැල්ලා, ඒ ගොල්ලන්ගේ බඩ පුරවා ගන්න තමයි යන්නේ. අවුරුදු තිහක් යුද්ධ කරලාත් එල්ටීටීඊ එක නොඉල්ලපු ඒ ඉල්ලීම් දෙන්න තමයි මේ හදන්නේ. සජිත් ප්‍රේමදාසගේ බෙල්ලෙන් අල්ලලා ඒ දේ කර ගන්න පුළුවන් වෙයි කියන විශ්වාසය තුළ තමයි අද එල්ටීටීඊ සංවිධානයට සහයෝගය දෙන ඒ පක්ෂ කටයුතු කරන්නේ. එල්ටීටීඊ සංවිධානය බලාපොරොත්තු වුණු ඒ දේවල් ලබා දීමට ද්‍රවිඩ සන්ධානය උත්සාහ කරනවා. ඒ වාගේම ජාතික වශයෙන් රටට විවිධ බලපෑම් කරන, රටේ කොටසක් කඩා ගන්න හදන, උතුර නැඟෙනහිර එක්කරන්න හදන, එවැනි දේවල් බලාපොරොත්තු වන පක්ෂවලට සහයෝගය දීලා, ඒ පක්ෂවල සහයෝගය ලබා ගැනීමයි සජිත් ප්‍රේමදාස කරන්න යන්නේ. අද සජිත් ප්‍රේමදාස මැතිතුමාට සිදුවෙලා තිබෙන්නේ රැවුලත් බේරාගෙන කැඳ ටිකත් බොන්නයි. මේ මැතිවරණයේ දී එතුමාට රැවුලත්, කැඳත් දෙකම නැති වෙනවා. ඒකට ප්‍රධාන හේතුව, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිකම බලාපොරොත්තු වෙන එක. රවි කරුණානායක මැතිතුමා යාපනයේ ගිහිල්ලා, අපේ අගමැතිතුමා කියලා කියනවා. අගමැතිතුමා වේදිකාවේ තියාගෙන සජිත් ප්‍රේමදාස ජනාධිපති අපේක්ෂකයා කියනවා, "අපි කිසි දවසක රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අගමැතිකම දෙන්න තීන්දු කරලා නැහැ, ඒක දෙන්නෙත් නැහැ" කියලා. මේ නිසා එක්සත් ජාතික පක්ෂය තුළ මහා අර්බුදයක් තියෙනවා. එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත් කරපු සරත් ෆොන්සේකා මහත්මයා විතරයි අද සජිත් ප්‍රේමදාස මැතිතුමාට උදවු කරන්නේ. අනෙක් ඔක්කෝම නිකම් කරන්නන් වාලේ වැඩ කරනවා. එක්සත් ජාතික පක්ෂයේ මහනුවර දිස්ත්‍රික්කයේ නායකතුමා අද මේ සභාවේ ඉන්නවා. මහනුවර අපේ නායකයෝ ඔක්කෝම දිස්ත්‍රික්ක පුරා, රට පුරා ගෝඨාභය මැතිතුමා ජයග්‍රහණය කරවන්න දුවනවා. නමුත් අද කිරිඇල්ල මැතිතුමා ඇවිල්ලා පාර්ලිමේන්තුවේ වාඩිවෙලා ඉන්නවා. පාර්ලිමේන්තු එන එක හොඳයි. හැබැයි ඒකෙන් අපට තේරෙනවා, එක්සත් ජාතික පක්ෂයේ සංවිධාන කටයුතු කොහේද තියෙන්නේ කියන කාරණය. මහනුවර මන්ත්‍රීවරයකු හැටියට මා දන්නවා, අද මහනුවර දිනන්න සජිත් ප්‍රේමදාස මැතිතුමාට හිතන්නවත් බැහැ කියන එක. එක්සත් ජාතික පක්ෂයට තමයි මහනුවර වැඩිම ඡන්ද තිබුණේ. නමුත් අද එහි කාර්යාලයක් ඇත්තේ නැහැ; සරසපු තැනක් නැහැ; ඒ වාගේම canvassing යනවා අපි දැක්කේ නැහැ; රැස්වීමක් අපි දැක්කේ නැහැ. මහනුවර තත්ත්වය එහෙම නම්, අනෙක් පළාත්වල තත්ත්වය ගැන අපට හිතා ගන්න පුළුවන්.

ඒ වාගේම අද උදේ ක්‍රීඩා ඇමතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා අඬන හැටි අපි දැක්කා. ආණ්ඩු පක්ෂයේ ඉන්නේ අපිද කියලා අපට හිතෙනවා. අද මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩුවක් නැහැ. ඔක්කෝම ඉන්නේ විපක්ෂයේ වාගේයි. අපි කියන්න ඕනෑ දේ එතුමන්ලා කියනවා. ආණ්ඩු පක්ෂයේ ඉඳගෙන ක්‍රීඩා ඇමතිතුමා අඬනවා, "මට කර ගන්න විධියක් නැහැ, මට නීත්‍යානුකූලව තීන්දුවක් ගන්න විධියක් නැහැ"යි කියලා. ආණ්ඩුවක් නැහැ වාගේ එතුමන්ලාටත් තේරිලා ඇති. හැබැයි, ඒක අපට හොඳට පැහැදිලිව තේරෙනවා. අද ආණ්ඩු පක්ෂයේ ඇමතිවරයෙකුගෙන් ප්‍රශ්නයක් ඇහුවාම ඒ ප්‍රශ්නයට උත්තර දෙන්නේ ගයන්ත කරුණාතිලක ඇමතිතුමා. එතුමා කොළයක් ගෙනැල්ලා උත්තරය කියවනවා. අපි බලාපොරොත්තු වන්නේ ඒක නොවෙයි. එම නිසා අද මේ පාර්ලිමේන්තුවේ තිබෙන්නේ බොහොම කනගාටුදායක තත්ත්වයක්. මන්ත්‍රීවරයකු ප්‍රශ්නයක් ඇහුවාම, ඒකට උත්තරය දෙන්නේ, ලබන සතියේ - ලබන සතියේ කියනවා. තවත් දවස් 16කින් අපි ඕවා වෙනස් කරලා, මහින්ද රාජපක්ෂ මැතිතුමා අපේ අගමැතිවරයා හැටියට පත් කර ගෙන, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා හැටියට පත් කර ගෙන ඒ සියලු කටයුතු, ඔය වැරදුණු තැන් හදන්න අපි ලෑස්ති වෙලා ඉන්නවාය කියන එක බොහොම පැහැදිලිව කියන්න ඕනෑ.

ඒ වාගේම මෙතුමන්ලා කිව්වා, හොරු අල්ලනවා කියලා, නමුත් අල්ලපු හොරෙක් ඇත්තේත් නැහැ. මහා හොරකමම මේ පාර්ලිමේන්තුවේ ඉන්න කීපදෙනෙකු එකතු වෙලා කළා. රවි කරුණානායක මැතිතුමා උසාවියට ගිහිල්ලා සාක්ෂි දුන්නා; අගමැතිවරයා උසාවියේ සාක්ෂි දුන්නා. මේවා ඉතිහාසයේ සිද්ධ වෙලා නැහැ. හිටපු ආරක්ෂක ලේකම්තුමා අද අත්අඩංගුවේ; පොලිස්පතිතුමා අත්අඩංගුවේ. මේ රටේ පාලනයක් ගෙන යැමට පාලක පක්ෂය අධෛර්යවීම, ඒ වාගේම පාලක පක්ෂයට පාලනය ගෙන ගන්න නොහැකි වීම තමයි මේ සියලු දේට හේතුව. ඒ වාගේම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මේ බැඳුම්කර සිද්ධියට සම්බන්ධයි. ඒවාට සාක්ෂි තිබෙනවා. රවි කරුණානායක මැතිතුමා උසාවියේ සාක්ෂි දෙනකොට අර්ජුන ඇලෝසියස්, අර්ජුන් මහේන්ද්‍රන් පිටුපස පුටුවල වාඩිවෙලා හිටපු හැටි අපි දැක්කා. මෙතුමන්ලා මේවාට සම්බන්ධයි කියලා සැකයක් හරි තිබුණා නම්, ඔවුන්ට රටින් පනින්න දෙන්න ඕනෑ නැහැ. මගේ විශ්වාසයේ හැටියට මේ අය කියන්න ඇති, "ඔය සල්ලි ටිකත් අරගෙන පිට රට ගිහිල්ලා අපට electionsවලට පුළුවන් නම් කීයක් හරි වියදම් කරන්න, එහෙම නැත්නම් මේ මැතිවරණයෙන් පැරදුණාම මට ඉන්න තැනක් හදන්න" කියලා. එතුමා ගිහිල්ලා ඒ දේවල් සිද්ධ කරනවා ඇති කියන සැකය අපට තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මේ ආණ්ඩුව කෙරෙහි තිබුණු මහා ජාතියේ විශ්වාසය අද බිඳ වැටිලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය කෙරෙහි තිබුණු මහා ජාතියේ විශ්වාසය බිඳ වැටිලා තිබෙනවා. ඒ වාගේම මේ ආණ්ඩුව කෙරෙහි තිබුණු බෞද්ධ පරිසරයේ විශ්වාසය බිඳ වැටිලා තිබෙනවා. මේ ආණ්ඩුව කෙරෙහි, මේ නායකයන් කෙරෙහි තිබුණු කතෝලික ජනතාවගේ විශ්වාසයත් අද බිඳ වැටිලා තිබෙනවා.

අද එක්සත් ජාතික පක්ෂයට සහයෝගය දෙන්න පක්ෂ ගණනාවක් එකඟ වෙලා තිබෙනවා. නමුත්, මේවා ඔක්කෝම ත්‍රීවිල් පක්ෂ; මිනිස්සු ඇත්තේ නැහැ. සරත් ෆොන්සේකා මැතිතුමා තමයි ප්‍රධානම කථිකයා. සජිත් ප්‍රේමදාස මැතිතුමා ජනාධිපති වුණොත් එතුමා තමයි දැනට සිටින වරප්‍රසාදලාභියා. එතුමා හංසයාගෙන් පසුගිය ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණා. එතුමා ඊළඟට පාර්ලිමේන්තු මැතිවරණයට තනියම තරග කළා. නෝනායි, දරුවෝ ටිකයි, ඒ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

සිටියදී එතුමා ලබා ගත්තේ ඡන්ද 28,000යි. ඡන්ද 28,000න් පළාත් සභාවටවත් යන්න බැහැ. එතුමා තමයි දැන් සජිත් දිනවන්න කෑ ගහන ප්‍රධාන කථිකයා වෙලා ඉන්නේ. නමුත්, එතුමා පාර්ලිමේන්තු මැතිවරණයෙන් ගත්තේ ඡන්ද 28,000යි. මේක තමයි ඇත්ත.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය ගැන හොඳින් දැනගෙන, එක්සත් ජාතික පක්ෂයත් එක්ක මේ කරන ගනුදෙනුව ගැන හොඳින් දැනගෙන මේ රට, ජාතිය, අපේ සභ්‍යත්වය, අපේ සංස්කෘතිය පිළිබඳව මේ ගොල්ලන් දරන මතය පිළිබඳව හොඳින් අවබෝධ කර ගෙන, මේ පාර්ලිමේන්තුවේ පළමුවෙනි වෙඩි මුරය පත්තු කරන්න මට පුළුවන් වුණා. මම තමයි එක්සත් ජාතික පක්ෂයෙන් පළමුවෙන් ඉවත් වෙලා විපක්ෂයට ආවේ. ඒ වරප්‍රසාද, වරදාන සියලු දේ එක්සත් ජාතික පක්ෂයට දීලා රට වෙනුවෙන්, අපේ ජාතිය වෙනුවෙන්, අපේ ආගම, අපේ සභ්‍යත්වය, සංස්කෘතිය වෙනුවෙන් මම ඒ තීන්දුව ගත්තා. අද ගම්මානවල ජනතාව, ප්‍රාදේශීය නායකයන්, සියලුදෙනාම එම තීන්දුවත් එක්ක එකතු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ යෝජනා හා මේ චෝදනා සියල්ල ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට, මහින්ද රාජපක්ෂ මැතිතුමාට එල්ල කරලා අපේ කඳවුර වට්ටන්න පුළුවන් වෙයි කියලා කවුරු හරි හිතාගෙන හිටියත්, මේ රටේ බලයට පත් කරන්නේ කවුද කියලා රටේ ජනතාව තීන්දු කරලා හමාරයි. අපි එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවට උදව් කරලා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට උදව් කරලා ආණ්ඩුවක් පිහිටුවා ගෙන අවුරුදු හතරහමාරක් ගතවෙලා තිබෙනවා. ඩඩ්ලි සේනානායක, ඩී.එස්. සේනානායක වැනි නායකයන් කටයුතු කරපු විධියට මේ අයත් මේ රට පාලනය කරයි කියලා අපි හිතුවා.

අද මේ පාර්ලිමේන්තුවේ ඉන්න එක්සත් ජාතික පක්ෂයේ නායකයෝ ඒ මිනිසුන්ගේ මයිල් ගහක් තරම්වත් වටින්නේ නැහැ. මේක තමයි ඇත්ත කථාව. අපි මහා වැඩ කොටසක් කරන්න බලාපොරොත්තුවෙන් සිටියේ. නමුත්, අපට එක රක්ෂාවක්වත් දෙන්න බැරි වුණා. එක්සත් ජාතික පක්ෂයේ polling boothsවලට ගිය තුන්දෙනෙකුට රැකියා දෙනවා කියලා මගෙන් තුන් හතර පාරක්ම නම් ලැයිස්තු ගත්තා. නමුත්, ඒ එක් කෙනෙකුටවත් රක්ෂාවක් හම්බ වුණේ නැහැ. ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා ගිහින් පාරවල් හදන්න මුල් ගල් තිබ්බා, තවම ඒ මුල් ගල් පැළවෙනවා. අගමැතිතුමා කිව්වා, නාවලපිටියේ හයින්පෝට් කොටසේ අක්කර 200ක භූමි භාගයක උසස් තාක්ෂණ මධ්‍යස්ථානයක් හදනවා කියලා. මගේ අතින් රුපියල් ලක්ෂ 5ක්, 10ක් විතර වියදම් වෙන්න ඇති, එතුමා වටේ ගිය අයට ඒ පහසුකම් සලසන්න. හැබැයි, ඒ තබපු මුල් ගල තවම පැළවෙනවා. ඒ උසස් තාක්ෂණ මධ්‍යස්ථානය හදන්න රුපියල් කෝටි 50ක් දෙනවා කියලා මාව රැවටුවා. ඉතින් මම කොහොමද නාවලපිටියට ගිහිල්ලා එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දෙන්න කියලා ඉල්ලන්නේ? මේ විධියට මිනිස්සු රවටන එක තමයි එක්සත් ජාතික පක්ෂය කළේ.

අද රනිල් වික්‍රමසිංහ මහත්මයාට මහනුවර පැත්තේ රැස්වීම්වලට යන්න බැරිවෙලා තිබෙනවා. පසුගිය දිනවල කඩුගන්නාවේ රැස්වීමක් තිබුණා. "රනිල් සමඟ සජිත් ඔබ අමතයි" කියලා තමයි ඒකට posters ගහලා තිබුණේ. සජිත් යනකොට මිනිස්සු හිටියේ නැහැ. රනිල් ආවේත් නැහැ. ඒ මොකද? එක්කෝ මිනිසුන්ගෙන් "හූ" හඬ ලැබෙනවා. එහෙම නැත්නම්, දැඩි ප්‍රහාර එල්ල වෙනවා. නාවලපිටියට ගිහින් කථා කරන්න රනිල් වික්‍රමසිංහ මහත්මයා ආවේ නැහැ. එතුමා ආවා නම් මිනිස්සු "හූවක්" දායි. මොකද, එතුමා නාවලපිටියට ගිහින් බොරුවට මුල් ගල් තියලා, මිනිස්සු රවටපු අගමැතිවරයෙක්. මේක තමයි ඇත්ත කථාව.

තමුන්නාන්සේලා දන්නවා, පසුගිය දිනවල සංවර්ධන නිලධාරීන් බඳවා ගත්ත බව. මේ නිලධාරීන්ට මාස දෙකක් තිස්සේ පඩි දීලා නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඡන්දයක් ප්‍රකාශයට පත් කරලා තිබෙන මේ කාලයේ එවැනි බඳවා ගැනීම් කරන්නත් බැහැ. නමුත්, ඒ ගත්ත මිනිසුන්ට පඩි දීලාත් නැහැ. ඊළඟට, මාර්ග සංවර්ධන අධිකාරියේ අවුරුදු තුනකට කලින් කළ කොන්ත්‍රාත් වෙනුවෙන් අදටත් ඒ කොන්ත්‍රාත්කරුවන්ට සල්ලි දීලා නැහැ.

ඊළඟට, "ළඟම පාසල හොඳම පාසල" කියලා එකක් ගෙනාවා. මටත් පාසල් දෙකක් දුන්නා. අන්න, ඒවා භාගෙට හදලා තිබෙනවා. කොන්ත්‍රාත්කාරයාට සල්ලි දීලා නැතිව ඔහු වහ බොන්න යනවා. මේ ආණ්ඩුව කාලයේ පුස්සැල්ලාව ප්‍රදේශයේ එක කොන්ත්‍රාත්කාරයෙක් -ද්‍රවිඩ මුදලාලි කෙනෙක්- එල්ලිලා මැරුණා, තමන්ට ලැබෙන්න තිබෙන සල්ලි ටික ආණ්ඩුවෙන් දුන්නේ නැති නිසා. මේක තමයි ඇත්ත කථාව.

පසුගිය මැතිවරණ කාලයේ මම නාවලපිටිය ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ ආසන සංවිධායකවරයා හැටියට ඉදිරිපත් වෙලා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජයග්‍රහණය කරවන්න කටයුතු කළා. එදා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජයග්‍රහණය කළේ ජනතා විමුක්ති පෙරමුණේ ඡන්ද ටිකෙන්. මම බොහොම පැහැදිලිව කියනවා, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට ජනතා විමුක්ති පෙරමුණේ ඡන්ද ටික නොතිබෙන්න එවරත් මහින්ද රාජපක්ෂ මැතිතුමා ජයග්‍රහණය කරන බව. ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර දිසානායක මැතිතුමා එදා කිව්වා, "අපට ලක්ෂ 6ක ඡන්ද කුට්ටියක් තිබෙනවා, මේ කුට්ටියම දාන්නේ හංසයාට, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති කරවන්න" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ ලක්ෂ 6 අඩු වුණා නම් එදාත් මහින්ද රාජපක්ෂ මැතිතුමා ඡන්ද ලක්ෂ 2කින් දිනනවා. ඒ ලක්ෂ 6 අඩු වුණාම මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ලක්ෂ 56යි ඉතිරි වෙන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයා ජනාධිපතිවරණයට ඉල්ලනකොට අඩුම ගණනේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඡන්ද ලක්ෂ 5ක්වත් එතුමාට වැටුණේ නැද්ද? ඇල්පිටියේ ඡන්දයෙන් ඒක තේරෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පොහොට්ටුවත් එක්ක agreement එකක් ගහලා තිබියදී, සියයට 12ක් ඇල්පිටියේ ජනතාව ඡන්දය දැම්මා. එතකොට, තව ඡන්ද ලක්ෂ 5ක් අඩු වුණාම ඡන්ද ලක්ෂ 50ක් විතර තමයි එදා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට හම්බ වෙන්නේ.

හිතන්න එපා, මේ මැතිවරණයේදී අපට කිට්ටු වෙන්නවත් සජිත් ප්‍රේමදාස මැතිතුමාට හම්බ වෙයි කියලා. අපි මේ මැතිවරණය පටන් අරගෙන තිබෙන්නේම ඡන්ද ලක්ෂ 28ක් ඉස්සරහින් තියාගෙනයි. පසුගිය ආසන්නම මැතිවරණය -පළාත් පාලන මැතිවරණය- එනකොට එදා මම එක්සත් ජාතික පක්ෂයටයි වැඩ කළේ. ඊට ඉහත පැවති ජනාධිපතිවරණයේදී සරත් ෆොන්සේකාගේ පක්ෂයේ ලකුණ වන හංසයා ලකුණින් ඉදිරිපත් වුණු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටයි අපි වැඩ කළේ.

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

ඒ ඡන්ද ප්‍රතිඵලය දිහා බැලුවාම පෙනෙනවා, එදාත් මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි ජයග්‍රහණය කරන්නේ කියලා. ආසන්නම මැතිවරණය වන පළාත් පාලන මැතිවරණයේදී පොහොට්ටුව ලබාගත් ඡන්ද සංඛ්‍යාව ලක්ෂ 51යි. බුලත් කොළය ලකුණ යටතේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඡන්ද ලක්ෂ 14ක් අරගෙන තිබෙනවා. මේ දෙක එකතු වුණාම, මුළු ඡන්ද ප්‍රමාණය ඡන්ද ලක්ෂ 65ක් වෙනවා.

තොණ්ඩමන් මැතිතුමා මේ දෙපැත්ත ගැනම බැලුවා, කොයි පැත්තටද බර වැඩි කියලා. බර වැඩි පැත්තට හේත්තු වෙන එක සුළු ජාතීන් හැටියට එතුමන්ලා කරන නුවණක්කාර වැඩක්. මම හිතන විධියට, එතුමාටත් මේ රට පුරා ලක්ෂ 3-4ක ඡන්ද ප්‍රමාණයක් තිබෙනවා. එතුමාගේ CWC unionවල - වෘත්තීය සමිතිවල - ලක්ෂ 2, 3කට වඩා ඡන්ද තිබෙනවා. පටන් ගැන්මක් හැටියට, මේකෙන් ඡන්ද ලක්ෂයක් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට වැටුණොත්, එතුමාට ඡන්ද ලක්ෂ 66ක් එනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන එක මන්ත්‍රීවරයෙක්වත් මේ අවස්ථාවේ මෙම ගරු සභාවේ නැහැ. විපක්ෂයේ මන්ත්‍රීවරු විතරයි අද මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ. ආණ්ඩු පක්ෂයේ අය නැහැ. මේ වැදගත් යෝජනාවට උත්තර දෙන්නේ නැතිව ඒ සියලුදෙනාම නැඟිටලා ගිහිල්ලා. ඒකෙන් පෙනෙනවා, සජිත් ප්‍රේමදාස මැතිතුමා අද කොතැනද ඉන්නේ කියලා. එතුමාගේ පරාජය ළඟ-ළඟම ඇති බව අද ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු තීන්දු කර තිබෙනවා. මේ දේවල් තුළින් ඒකයි අපට පෙනෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කළ ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා MCC ගිවිසුම පිළිබඳව; මේ ඇමෙරිකන් ආක්‍රමණය පිළිබඳව පොතක් ආශ්‍රයෙන් කරුණු ඉදිරිපත් කර තිබෙනවා. එතුමාට එම පොත සභාගත කිරීමට අවස්ථාව ලැබුණේ නැහැ. ඒ සඳහා ඔබතුමාගෙන් අවසර ඉල්ලා සිටිමින්, මා එම පොත **සභාගත*** කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
அடுத்ததாக, மாண்புமிகு சிவசக்தி ஆனந்தன் அவர்கள்.

[பி.ப. 3.45]

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, கௌரவ பந்துல குணவர்தன அவர்களினால் கொண்டுவரப் பட்டிருக்கின்ற இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணையிலே எனக்கும் பேசுவதற்கு நேரம் தந்தமைக்கு நன்றி தெரிவிக் கின்றேன். முக்கியமாக, 5 தமிழ்க் கட்சிகள் கைச்சாத்திட்டிருக் கின்ற 13 அம்சக் கோரிக்கையானது இந்த நாட்டைப் பிளவு படுத்தவிருக்கின்றது; வடக்கு, கிழக்கை இணைக்கவிருக் கின்றது என்று அவர் கூறினார். அவர் இதனை ஒரு பாரதூரமான விடயமாகக் கருதி இந்தப் பிரேரணையைக் கொண்டுவந்திருக்கின்றார். உண்மையிலே வடக்கு, கிழக்குப் பல்கலைக்கழக மாணவர்கள், மதத்தலைவர்கள் மற்றும் சுயாதீன அமைப்புக்களும் இணைந்து கொண்டுவந்த இந்த 13 அம்சக் கோரிக்கையானது, கடந்த 70 வருட காலமாகத் தீர்க்கப்படாமல் இருக்கின்ற தமிழ் மக்களினுடைய பிரச்சினை சம்பந்தப்பட்ட முக்கியமான அம்சங்களை உள்ளடக்கியிருக் கின்றன. இந்தப் 13 அம்சக் கோரிக்கையிலே, அரசியல் தீர்வு பற்றிய விடயம் தவிர்ந்த ஏனைய 12 அம்சங்களும் யுத்தத்திற்குப் பிற்பாடு ஏற்பட்டிருக்கக்கூடிய நிலைமைகள் பற்றியதாகும். அதாவது, அரசியல் கைதிகளுடைய விடுதலை, காணி விடுவிப்பு, காணாமல் ஆக்கப்பட்டோருடைய விவகாரம், யுத்தம் நிறுத்தப்பட்டு 10 வருட காலமாகியும் நீண்ட காலமாக இந்த நாட்டில் இருக்கக்கூடிய பயங்கரவாதத் தடைச் சட்டம் நீக்கப்படாமை, மீள் குடியேற்றம், வேலைவாய்ப்பு, அபிவிருத்தி போன்ற விடயங்கள் இதில் உள்ளடக்கப் பட்டிருக்கின்றன. இவை எல்லாம் ஒரு தனிநாட்டுக்கான கோரிக்கைகள் அல்ல.

கடந்த 70 வருட காலமாக இந்த நாட்டை ஆட்சி செய்த 2 பிரதான கட்சிகளினாலும் தமிழ் மக்கள்மீது நடாத்தப்பட்ட இன வன்முறை அல்லது இனப்படுகொலைக்கான பிரச் சினைகளைத் தீர்த்துவைக்க வேண்டும் என்ற அடிப்படையில் எதிர்வரும் ஜனாதிபதித் தேர்தலிலே போட்டியிடுகின்ற பிரதானமான 2 வேட்பாளர்களுக்கும் இந்த 13 அம்சக் கோரிக்கையினைக் கையளிப்பதற்காக நாங்கள் ஆயத்தமாக இருந்தோம். ஆனால், பொதுஜன பெரமுனவினுடைய ஜனாதிபதி வேட்பாளர் கோட்டாபய ராஜபக்ஷ அவர்கள், "இவர்களைச் சந்திக்கவும் தயாரில்லை; இந்தப் 13 அம்சக் கோரிக்கைகளை ஏற்றுக்கொள்ளவும்மாட்டோம்" என்று வெளிப்படையாகவே கூறிவிட்டார். ஐக்கிய தேசிய முன்னணியினுடைய வேட்பாளர் சஜித் பிரேமதாச அவர்கள் அதற்கு ஒருபடி மேலே சென்று, "நான் யாரோடும் எந்த உடன்படிக்கையிலும் கைச்சாத்திடமாட்டேன்; யாருக்கும் அடிபணியமாட்டேன்; இவர்களைச் சந்திக்கவும் தயாரில்லை" என்று குறிப்பிட்டுள்ளார். ஆகவே, நீங்கள் இந்தத் தேர்தல் காலத்தில் தமிழ் மக்களுடைய வாக்குகளை எதிர்பார்த்துக் கொண்டிருக்கின்றபோதிலும், எங்களுடைய கோரிக்கைகளை நிராகரித்துக் கொண்டிருக்கின்றீர்கள். ஒரு சம்பிரதாயத்துக் குக்கூட நீங்கள் எங்களைச் சந்திப்பதற்குத் தயாரில்லாமல் இருக்கின்ற இந்த நேரத்திலே, தமிழ் மக்கள் உங்களுக்கு என்ன அடிப்படையில் வாக்களிக்க வேண்டும்? ஏன் வாக்களிக்க வேண்டும்? என்பதுதான் இன்றைக்கு வடக்கிலும் கிழக்கிலும் அதற்கு வெளியிலும் இருக்கக்கூடிய தமிழ் மக்களுக்கு முன்னாலிருக்கின்ற கேள்விகளாக இருக்கின்றன.

2010ஆம் ஆண்டு நடைபெற்ற ஜனாதிபதித் தேர்தலிலே மஹிந்த ராஜபக்ஷ அவர்கள் வெற்றி பெற்றுப் பதவிக்கு வரக்கூடாது என்பதற்காக, ஐக்கிய தேசியக் கட்சியின் வேட்பாளராகப் போட்டியிட்ட சரத் பொன்சேகா அவர்களுக்கு - ஒன்றரை இலட்சத்திற்கும் மேற்பட்ட பொதுமக்கள் படுகொலை செய்யப்பட்டு, பல்லாயிரக்கணக்கானவர்கள் காயப்பட்டு, பல பில்லியன் பெறுமதியான சொத்துக்கள் அழிவுக்குள்ளான இறுதிக்கட்ட யுத்தத்தைத் தளபதியாக இருந்து வழிநடத்திய சரத் பொன்சேகா அவர்களுக்கு வாக்களிக்கும்படி தமிழ்த் தேசியக் கூட்டமைப்பின் தலைமை கேட்டிருந்தது. ஆனால், எந்த நிபந்தனையுமில்லாமல் நாங்கள் அவ்வாறு ஆதரவளிக்கக்கூடாது என்று அன்றைக்கும் நாங்கள் கூறியிருந்தோம். அன்று தேர்தலில் போட்டியிட நிறுத்தப்பட்ட அந்த வேட்பாளர் தமிழ் மக்கள்மீது படுகொலை நடந்ததற்குக் காரணமான யுத்தத்தை வழிநடத்தியவர். ஆனால், மஹிந்த ராஜபக்ஷ அவர்கள் தேர்தலில் வெற்றிபெற்று வரக்கூடாது என்பதற்காகவே தமிழ் மக்கள் அவ்வாறானவருக்கு வாக்களித்தார்கள். அதுபோல, 2015ஆம் ஆண்டு நடைபெற்ற

---

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

ஜனாதிபதித் தேர்தலில் மஹிந்த ராஜபக்ஷ அவர்கள் மீண்டும் வெற்றி பெற்றுப் பதவிக்கு வரக்கூடாது என்பதற்காகவே ஐக்கிய தேசியக் கட்சி ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியிலிருந்து கொண்டுவந்த பொது வேட்பாளரான மைத்திரிபால சிறிசேன அவர்களுக்குத் தமிழ் மக்கள் வாக்களித்தார்கள். அந்தத் தேர்தல் நடைபெற்று இன்றைக்கு 5 வருட காலமாகப்போகின்றது. இந்த 5 வருட காலத்திற்குள்ளே நீங்கள் எதைச் செய்தீர்கள்? சாதாரணமாகக் கிராம மட்டத்திலிருக்கக்கூடிய அடிப்படைப் பிரச்சினைகளைக்கூட உங்களால் இன்றுவரை தீர்க்க முடியவில்லை.

தலைமன்னாரிலே இருக்கக்கூடிய கிராமத்து மக்களைத் தொழில் செய்ய முடியாதவாறு கடந்த 3 மாதங்களாகக் கடற்படையினர் தடுத்திருக்கின்றார்கள்; வன ஜீவராசிகள் திணைக்களத்தினர் தடுத்திருக்கின்றார்கள். ஆகவே, அந்த மக்கள் கடந்த 3 மாதங்களாக எந்தவிதமான தொழிலுமில் லாமல், தொழிலுக்குச் செல்ல முடியாமல் இருக்கின்றார்கள். இதனால் இன்றைக்கு அவர்களுடைய வாழ்வாதாரம் பாதிக்கப்பட்டிருக்கின்றது.

வன்னி மாவட்டத்தை எடுத்துக்கொண்டால், அது பெரும் காட்டுப் பிரதேசமாகக் காணப்படுகின்றது. அங்கே விவசாயிகளின் பயிர்கள் எல்லாவற்றையும் தொடர்ச்சியாக யானைகள் நாசமாக்குகின்றன; விவசாயிகளின் உயிர்களைப் பறிக்கின்றன. நாங்கள் எத்தனையோ பிரதேச ஒருங் கிணைப்புக் குழுக் கூட்டங்களில் இது தொடர்பில் பேசியிருக் கின்றோம்; இந்த யானைகளைக் கட்டுப்படுத்துவதற்கு நடவடிக்கை எடுங்கள் என்று கோரியிருக்கின்றோம். வன்னியிலுள்ள விவசாயிகள் பலர் கடன்பட்டு, கஷ்டப்பட்டுச் செய்த தென்னைப் பயிர் அதேமாதிரி பப்பாசி, இன்னும் பல்வேறுபட்ட பயிர்களை இந்த யானைகள் நாசமாக்கு கின்றன. இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்து ஐந்து வருட காலமாகப் போகின்றது. இந்த யானைகளைக் கட்டுப்படுத்த முடிந்ததா?

இதற்கப்பால், வடக்கிலேயும் கிழக்கிலேயும் தமிழ் மக்களுடைய பூர்வீக இடங்களிலே தொல்பொருள் திணைக்களம் தொடர்ச்சியாக ஆக்கிரமைப்பைச் செய்து கொண்டிருக்கின்றது என்பதை நாங்கள் தொடர்ந்தும் சொல்லி வருகின்றோம். கன்னியாவாக இருக்கலாம், நீராவியடியாக இருக்கலாம், நாவற்குழியாக இருக்கலாம். பல்வேறு இடங்களில் தொல்பொருள் திணைக்களம் ஆக்கிரமைப்பைச் செய்கின்றது. இந்தத் தொல்லியல் திணைக்களத்திலே ஒரு பௌத்த துறவியின் தலைமையில் 32 சிங்களவர்கள் இருக்கிறார்கள். அங்கு ஒரு தமிழரை நியமிக்க முடிந்ததா? தொல்லியல் திணைக்களம் வெறுமனே இந்த நாட்டிலே உள்ள பௌத்த மதத்திற்கும் சிங்களவர்களுக்குமுரிய திணைக்களமா? அல்லது ஒரு நடுநிலையான திணைக்களமா? வவுனியா பிரதேச செயலகத்திற்குட்பட்ட மாளிகை என்ற கிராமத்திலே இருக்கக்கூடிய பல நூறாண்டுகள் பழமைவாய்ந்த காட்டு விநாயகர் ஆலயக் காணியைக் கடந்த 26ஆம் திகதி இரண்டு நிருவாகிகள் துப்புரவு செய்தபோது, அவர்களுக்கெதிராகத் தொல்லியல் திணைக்களத்தினால் ஓமந்தைப் பொலிஸ் நிலையத்தில் முறைப்பாடு செய்யப்பட்டு, அவர்கள் வவுனியா சிறைச்சாலையிலே தடுத்து வைக்கப்பட்டிருக்கின்றார்கள். 70 வயதுடைய நல்லதம்பி சுப்பிரமணியம், 38 வயதுடைய அமரசிங்கம் அகிலன் ஆகிய இருவருமே தடுத்து வைக்கப் பட்டிருக்கின்றார்கள். அவர்கள் இருவரும் அப்பாவிகள். அவர்கள் என்ன குற்றம் செய்தார்கள்? தங்களுடைய பூர்வீகமான ஆலயக் காணியினைக் கனரக இயந்திரம் கொண்டு துப்புரவு செய்யும்போது நிலத்திற் குகீழிருந்த செங்கல் கிளறப்பட்டுவிட்டது. இதற்காகத்தான் அவர்கள் சிறையில் அடைத்து வைக்கப்பட்டிருக்கின்றார்கள்.

2010ஆம் ஆண்டு நடந்த தேர்தலின்போது எங்களு டைய மக்கள் மஹிந்த ராஜபக்ஷ அவர்களுக்கு வாக்களிக்கவில்லை. 2015ஆம் ஆண்டு தேர்தலின்போதும் எங்களுடைய மக்கள் மஹிந்த ராஜபக்ஷ அவர்களுக்கு வாக்களிக்கவில்லை. ஆனால், உங்களை நம்பி வாக்களித்து இன்றைக்கு 5 வருடகாலமாகின்றது. இந்தக் ஐந்து வருட காலத்திற்குள்ளே உங்களால் குறைந்தபட்சம் அடிப்படைப் பிரச்சினைகளுக்காவது தீர்வு காண முடிந்ததா? யுத்தம் முடிவடைந்து 10 வருட காலமாகி விட்டது. எத்தனையோ குடும்பங்கள் தற்காலிக வீட்டிலிருக்கின்றபோதிலும் இந்த 10 வருடகாலத்திற்குள் அவர்களுக்கான நிரந்தர வீட்டுத்திட்டம் கிடைக்கவில்லை. ஒரு வீட்டுத்திட்டத்தைக் கொண்டுவந்து கல் வீடா? பொருத்து வீடா? எதைச் செய்வதென்று 3 வருட காலம் இழுத்தடித்தீர்கள். உங்களால் அந்த வீட்டுத்திட்டத்தை உருப்படியாகக் கொடுக்க முடியவில்லை. வடக்கு, கிழக்கில் வேலைவாய்ப்புகளை யாருக்குக் கொடுக்கிறீர்கள்? யாழ்ப்பாணம் சர்வதேச விமான நிலையம் திறந்து வைக்கப்பட்டது. தென்பகுதியில் இருக்கக்கூடிய பெரும் பான்மை இனத்தைச் சேர்ந்த 90க்கும் மேற்பட்டவர்களைக் கொண்டுவந்து அங்கே நியமனம் செய்திருக்கின்றீர்கள். ஏன், உங்களால் அந்த மாவட்டத்திலே அல்லது அந்த மாகாணத்திலே இருக்கின்றவர்களை அங்கு நியமனம் செய்ய முடியவில்லை? யாழ்ப்பாணப் பல்கலைக்கழகம், வவுனியாப் பல்கலைக்கழகம் போன்றவற்றில் நிலவுகின்ற வெற்றிடங்களுக்கு யாரைக்கொண்டு வந்து நியமிக் கின்றீர்கள்? வெளி மாகாணத்தில் இருக்கக்கூடியவர் களைக் கொண்டுவந்து நியமனம் செய்கின்றீர்கள். இந்தப் பிரச்சினைகள் எல்லாவற்றுக்கும் ஒரு நிரந்தரமான தீர்வு காணப்பட வேண்டும் என்பதற்காகத்தான் கடந்த 10 வருட காலத்தில் நடந்த இரண்டு ஜனாதிபதித் தேர்தல்களிலும் நாங்கள் வாக்களித்தோம். அப்போது மஹிந்த ராஜபக்ஷ அவர்கள் ஜனாதிபதியாக வருவதற்கு வாக்களிக்கக்கூடாது என்று எங்களுடைய மக்களுக்குச் சொல்லப்பட்டது. ஆனால், இந்த 10 வருட காலத்திற்குள் எங்களுடைய மக்களுடைய எந்தவிதமான அடிப்படைப் பிரச் சினைகளுக்கும் தீர்வு காணப்படவில்லை.

இந்த இரண்டு பிரதான கட்சிகளின் வேட்பாளர்களும் சிங்களப் பெரும்பான்மை மக்களுடைய வாக்குகளை எப்படிப் பெற்றுக்கொள்ளலாம் என்பதற்காகச் செயற்படுகின்றார்கள். எவ்வளவு தூரம் இனவாதத்தைப் பேச முடியுமோ அந்தளவுக்கு இனவாதத்தைப் பேசிக்கொண்டு வாக்குக் கேட்கின்றார்கள். கோட்டாபய ராஜபக்ஷ அவர்கள், "இந்த யுத்தத்தை நான் வெற்றி கொண்டேன்" என்று சொல்கின்றார். சஜித் பிரேமதாஸ அவர்கள் ஜனாதிபதியானால் அவருடைய ஆட்சியில் பாதுகாப்புக்குப் பொறுப்பாக வரவிருக்கக்கூடிய சரத் பொன்சேகா அவர்கள், "கோட்டாபய ராஜபக்ஷ அவர்கள் AC அறையில் coat போட்டு, tie கட்டிக்கொண்டிருந்தவர். நேரடியாக யுத்த களத்திலிருந்து செயற்பட்டு யுத்தத்தை முடித்து வைத்தவன் நான்தான்" என்று ஒரு வரியில் சொல்கின்றார். இந்த யுத்தத்தில் ஆயிரக் கணக்கான அப்பாவிப் பொதுமக்கள் கொல்லப்பட்டிருக்கின்றார்கள்; காயப்பட்டிருக்கின்றார்கள், பில்லியன் கணக்கான சொத்துக்கள் அழிக்கப்பட்டிருக்கின்றன. பாரியதோர் இனப்படுகொலை நடத்திருக்கின்றது. சிங்கள மக்கள் மத்தியில் இந்த இரண்டு பேரிலும் யார் இதற்கு உரிமை

[ගරු සිවශක්ති ආනන්දන් මහතා]

கோருகின்றார்கள்? சஜித் பிரேமதாஸவுக்குப் பக்கத்தில் இருக்கக்கூடிய சரத் பொன்சேகா, தான் இந்த யுத்தத்தை வெற்றி கொண்டதாகக் கூறுகின்றார். யுத்தத்தினால் ஏற்பட்ட பல்லாயிரக்கணக்கான உயிரழிவுகள், சொத்தழிவுகள் குறித்து இன்னும் எந்தத் தீர்வும் காணப்படவில்லை. "ஐக்கிய நாடுகள் மனித உரிமைப் பேரவையில் இணங்கிய விடயங்கள் எதனையும் நடைமுறைப்படுத்தமாட்டோம்" என்று நீங்கள் இருவருமே கூறுகின்றீர்கள். அப்படியென்றால், எப்படி நீங்கள் இந்தப் பிரச்சினையைத் தீர்க்கப் போகின்றீர்கள்? நீங்கள் இணக்கம் தெரிவித்த விடயங்களை நீங்களே ஏற்றுக் கொள்ளப்போவதில்லை என்றால், எப்படி நீங்கள் தமிழ் மக்களுடைய பிரச்சினையைத் தீர்த்துவைக்கப் போகின் றீர்கள்? தமிழ் மக்களைப் பொறுத்தவரையில், இந்த ஜனாதிபதித் தேர்தலில் வாக்களிப்பதற்கு வாக்களிப்பு நிலையத்துக்குப் போக முடியாத நிலையில்தான் இருக்கி றார்கள். அதையும்மீறி வாக்களிப்பு நிலையத்துக்குப் போகின்றவர்கள் குற்ற உணர்வோடுதான் போக வேண்டியிருக்கின்றது. வாக்குச்சீட்டில் புள்ளடியிடும் போது, அவர்களுடைய மனச்சாட்சி உறுத்தக்கூடிய அளவில்தான் நிலைமை இருக்கிறது.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

மாண்புமிகு உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் இரண்டு நிமிடங்கள் இருக்கின்றன.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

இரண்டு பக்கத்திலும் இருக்கக்கூடிய வேட்பாளர்கள் சிங்கள மக்களுடைய வாக்குகளைப் பெற்றுக்கொள்வதற்காக எப்படி நடந்துகொள்கிறார்கள்? ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவைக்குப் பாரிய பொறுப்பு இருக்கிறது. அதாவது, இணக்கம் தெரிவித்த விடயங்களை எந்தளவுதூரம் இவர்கள் நடைமுறைப்படுத்துகின்றார்கள் என்பது தொடர்பில் கண்காணிக்க வேண்டிய பொறுப்பு இருக்கின்றது. இன்றைக்குத் தேர்தல் பிரச்சார மேடைகளிலே இவர்கள் கூறுகின்ற கருத்துக்கள் பற்றிய ஆவணங்கள் நிச்சயமாகச் சேகரிக்கப்பட வேண்டும். இவர்களுடைய வாயிலிருந்து வெளிவருகின்ற ஒவ்வொரு வாக்குறுதியையும் இவர்கள் எப்படி எதிர்காலத்தில் நடைமுறைப்படுத்தப் போகிறார்கள்? அவற்றை நடைமுறைப்படுத்துவதற்கு என்ன நடவடிக்கை எடுக்கப் போகின்றார்கள்? என்பது தொடர்பில் கண்காணிக்க வேண்டிய ஒரு பாரிய பொறுப்பு ஐ.நா. மனித உரிமைப் பேரவைக்கு இருக்கின்றது. ◌ளாதுக்களைகி இமானத்துக் ரீயுஆகவே, இந்தப் பொறுப்பை அது நிறைவேற்ற வேண்டும்.

இந்த நாட்டில் நடைபெற்ற அத்தனை ஜனாதிபதித் தேர்தல்களிலும் தொடர்ச்சியாகத் தமிழ் மக்கள் வாக்களித் திருக்கிறார்கள். எனினும், தமிழ் மக்கள்மீது படுகொலைகள் இழைக்கப்பட்டதே தவிர, அவர்களுக்கு எந்தவிதமான தீர்வும் கிடைக்கவில்லை. இந்திய அரசியலமைப்புச் சட்டத்தின்படி அங்கு தேர்தலின்போது கடைப்பிடிக்கப்படுகின்ற "நோட்டா" என்ற முறைமையை இலங்கையிலும் எமது தேர்தல் திணைக்களமானது நடைமுறைப்படுத்த வேண்டும். தங்களுக்கு விருப்பம் இல்லாதவர்களை நிராகரிக்கக்கூடிய அந்த ஜனநாயக உரிமையை மக்களுக்கு வழங்குவதற்கான நடைமுறையை நிச்சயமாக இங்கேயும் கொண்டுவரவேண்டிய தேவை இருக்கிறது. கடந்த ஜனாதிபதித் தேர்தல்களிலே தமிழ் மக்கள் உங்களுக்கு வாக்குகளை அளித்தபோதிலும், அவர்கள் உங்களால் ஏமாற்றப்பட்டிருக்கிறார்கள். சஜித் பிரேமதாஸ அவர்களுடைய தேர்தல் விஞ்ஞாபனத்திலே அவர் என்ன கூறியிருக்கின்றார்? சிங்கள மொழியில் ஒன்றையும் தமிழ் மொழியில் இன்னொன்றையும் கூறுகின்றீர்கள். தமிழ் மக்களுக்கு "ஒருமித்த நாடு" என்கிறீர்கள்; சிங்கள மக்களுக்கு "ஒற்றையாட்சி" என்கிறீர்கள். நீங்கள் சிங்கள மக்கள் மத்தியில் உண்மையைக் கூறாமல், எப்படி தமிழ் மக்களுடைய இந்தப் பிரச்சினையைத் தீர்க்கப்போகிறீர்கள்? சிங்கள மக்களுக்கு உண்மையைச் சொல்லுங்கள்! "இந்த நாட்டிலே 70 வருட காலமாகத் தமிழ் மக்களுக்கு ஒரு பிரச்சினை இருக்கிறது. அந்தப் பிரச்சினையை நாங்கள் தீர்க்கப்போகின்றோம்" என்று கூறுங்கள்! பொய்கூறி இந்தப் பிரச்சினையைத் தீர்க்க முடியாது. ஆகவே, உங்களுக்குத் தொடர்ச்சியாகத் தமிழ் மக்கள் அளித்த ஆதரவை இனிவரும் தேர்தல்களிலும் வழங்குமாறு நாங்கள் எப்படிக் கூறமுடியும்? உங்களை நம்பி, உங்கள் இருவரில் ஒருவருக்கோ அல்லது வேறு ஒருவருக்கோ வாக்களிக்குமாறு எப்படி எங்களைப் போன்றவர்கள் அந்த மக்களிடம் கோருவது? எதிர்வரும் ஜனாதிபதித் தேர்தலிலே இன்னாருக்கு வாக்களித்தால், உங்களுடைய பிரச்சினைகள் எல்லாம் தீரும் என்று நாங்கள் எந்த அடிப்படையில் எங்கள் மக்களுக்கு உத்தரவாதத்தைக் கொடுக்க முடியும்? கடந்த காலச் செயற்பாடுகள் எங்களுக்கு நல்ல படிப்பினைகளைத் தந்தன. உங்களை நம்பித் தமிழ் மக்களுக்கு எந்தவொரு வாக்குறுதி யையும் கொடுக்க முடியாத ஒரு நிலைமைக்குள்தான் நாங்கள் தள்ளப்பட்டிருக்கிறோம்.

இந்திய அரசியலமைப்புச் சட்டத்தில் இருக்கின்றமாதிரி இங்கேயும் "நோட்டா" என்ற முறை இருந்திருந்தால், நிச்சயமாக வடக்கு, கிழக்கிலுள்ள 50 வீதத்துக்கும் மேற்பட்ட மக்கள், தேர்தல் களத்திலே நிற்கின்றவர்களை நிராகரிக்கின்ற நிலை ஏற்பட்டிருக்கும். எந்த வேட்பாளரையும் பிடிக்கவில்லை என்று தெரிவிக்கக்கூடிய அந்த ஜனநாயக உரிமை இந்த நாட்டிலுள்ள மக்களுக்கும் இருப்பதற்கு தேர்தல் ஆணையாளர் "நோட்டா" என்ற முறையை எதிர்காலத்தில் நடைமுறைக்குக் கொண்டுவர வேண்டுமென்று கேட்டு, என்னுடைய உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

நன்றி! நானும் சில கருத்துக்களைச் சொல்ல விரும்புகின்றேன். அதாவது, எமது வடக்கு, கிழக்குப் பல்கலைக்கழக மாணவர்கள் ஒன்றியத்துக்கு நான் நன்றி சொல்லவேண்டும். உண்மையிலே அவர்களுடைய முயற்சி பாராட்டத்தக்கது. அம்முயற்சி தொடார வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 4.01ට, අද දින සභා සම්මතිය අනුව, 2019 දෙසැම්බර් 03 වන අඟහරුවාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 4.01 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, 2019 டிசம்பர் 03, செவ்வாய்க்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 4.01 p.m. until 1.00 p.m. on Tuesday, 03rd December, 2019 pursuant to the Resolution of Parliament of this Day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.